
# දළදා වරුණ


ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2557 බක් මස සඳු දින ■ 2014 අප්‍රේල් මස 14 වැනි සඳුදා



■ දළදා මාලිගාවෙන් නොමිලයේ පිරිනමන දහම් පඩුරකි ■ විකිණීම සඳහා නොවේ

# බුදුරජුන් ලංකාවට වැඩි බක් පොහොය අදයි



අද ගෞතම සම්මා සම්බුද්ධරජාණන් වහන්සේ දෙවැනි වරට ලංකාද්වීපයට වැඩම කළේ බුද්ධත්වයෙන් පස්වැනි වර්ෂයේ බක් පුර පසළොස්වක පොහොය දිනකයි. එනිසා බක් මාසය ලාංකාවාසී බෞද්ධ ජනතාවට අතිශය වැදගත් මාසයකි. එසේම බක් පොහොය නායකත්ව පොහොයක් වශයෙන් ද සැලකිය හැකිය. සිංහල ගොවියා අස්වනු කපා, අටු කොටු පුරවා සතුටින් සොම්නසින් අලුත් අවුරුද්ද සැමරීමටත් අවුරුදු චාරිත්‍ර ඉටු කිරීමටත් ලබා ලබයේ සූදානම් වන්නේ බක් මාසයේය. ගස්වැල් මල් දලුවලින් බරව පරිසරයම සුවඳවත් වන අතර කොහිලයන්ගේ සුමිහිරි ගීත නදින් සවන් පිනා යන්නේ ද බක් මාසයේය. එබැවින් බක් පොහොය ආගමික වශයෙන් මෙන්ම, සාංස්කෘතිකමය වශයෙන් වැදගත් පොහොයක් ලෙස සැලකීමෙහි වරදක් නැත.

බුදුරජාණන් වහන්සේ දෙවන වර ලක්දිවට වැඩම කළේ ලක්දිව උතුරු කරයේ පිහිටි නාගද්වීපය වෙතය. එකල මෙම ප්‍රදේශයේ වාසය කළේ 'නාග' ගෝත්‍රිකයන් බව ඉතිහාසයෙහි සඳහන් වේ. බුදු හිමියන් ප්‍රථම වරට ලක්දිවට වඩින විටත් යක්ෂ, නාග ගෝත්‍රිකයන් සිටි බවට ඓතිහාසික සාධක ඇත. යක්ෂ, නාග ගෝත්‍රිකයන් සමග බුදුරජාණන් වහන්සේ සබඳතා පැවැත්වූ බවට ද සාධක දක්විය හැකිය. උන්වහන්සේ දෙවැනි වතාවට ලංකාවට වඩින විට ලක්දිව යක්ෂ, නාග, දේව යන ගෝත්‍ර තුනට අයත් ජනතාව වාසය කළහ. එයින් යක්ෂ ගෝත්‍රිකයෝ මහියංගණය ප්‍රදේශයේත්, දේව ගෝත්‍රිකයෝ මධ්‍යම කඳුකරයේත්, නාග ගෝත්‍රිකයෝ උතුරු, දකුණු සහ වයඹ ප්‍රදේශවලත් බලය තහවුරු කරගෙන විසූහ. උතුරෙහි විසූ නාගයෝ සැලකිමත් බෞද්ධ පිරිසක් වූහ. 'බෝධිවංශය' වැනි වංශ කතාවන්හි සඳහන් පරිදි සංඝමිත්තා මහ රහත් තෙරණිය ශ්‍රී ලංකාවට ශ්‍රී මහා බෝධිය රැගෙන නැව් මගින් පැමිණෙන අතර නාගයින්ගේ ඇවිටිලි මත නාගලොවට රැගෙන ගොස් සතියක් තිස්සේ පූද පූජා පැවැත්වූ බව ප්‍රසිද්ධ කරුණකි.

බුදුන් වහන්සේ දෙවැනි වතාවට ලක්දිවට වඩින විට උතුරෙහි නාගද්වීපයෙහි විසූ නාග ගෝත්‍රිකයන්ගේ රජු වූයේ චූලෝදර නම් නරපතියාය. ඔහු සහ මහෝදර නම් නා රජු අතර මැණික් පුටුවක අයිතිය අරභයා සටනක් හට ගැනීමේ සූදානමක් විය. මොවුන් දෙදෙනා පිටස්තරයන් නොවූහ. චූලෝදර, මහෝදරගේ සොහොයුරියගේ පුතා විය. එබැවින් මොවුන් නැදෑ කමින් මාමා සහ බෑණා වශයෙන් සැලකිය හැකිය. දෙදෙනාම ඉතා බලවත් වූහ. සටනේ දක්ෂයෝ වූහ. මොවුන් දෙදෙනාම මැණික් පුටුව තම තමන්ට අයත් යැයි එසේ මත සිටිමින් සටනට සූදානම් වූහ. දුනු හී තෝමර ඇතුළු අවි ආයුධ ගෙන දෙදෙනාගේම සේනාවෝ යුද වැදීමට නොඉවසිල්ලෙන් බලා සිටිති. මෙම සටන ඇවිලීමට නියමිතව තිබුණේ 'බක්' අව පසළොස්වක දිනයේය.

මෙදින අලුයම කරුණා නෙතින් ලොව බලන බුදු හිමියන්ට ලක්දිව නාගයන්ගේ මෙම සංග්‍රාම සූදානම පෙනුණි. ඇවිළෙන සටන නිසා වැගිරෙන මහා රුධිර ගංගාව වැළැක්වීම අවශ්‍යයෙන්ම කළ යුතු බව තීරණය කළ මහා කාරුණිකයන් වහන්සේ, සෘද්ධි බලයෙන් අහස් කුසින් නාගද්වීපයට වැඩම කළ සේක. බුදුන් වහන්සේ මේ ගමනට සමිද්ධි සුමන නම් දිව්‍ය රාජයා කැඳවූයේය. දෙව්රම් වෙහෙර දොරටුවේ කිරිපලු රුක අරක්ගෙන සිටි මේ දිව්‍යරාජයා තමාගේ වාස භවනය වූ වෘක්ෂය, උදුරාගෙන තථාගතයන් වහන්සේට ඡත්‍රයක් මෙන් අල්ලාගෙන නාගද්වීපයට පැමිණියේය. බුද්ධ පෛරවරයෙන් දෙවැනි වතාවට මෙම පුණ්‍ය භූමිය පවිත්‍ර වූ පුවතේක පුරාණිකය මහාවංශය, දීපවංශය, පූජාවලිය, සද්ධර්මාලංකාරය, රසවාහිනිය සහ ධාතුවංශය වැනි සාහිත්‍ය සහ ඉතිහාස ග්‍රන්ථවල විස්තර කර ඇත. දෙපස සේනාවෝ අවි අමෝරාගෙන සිටිති. ඒ අතර බුදුහාමුදුරුවන් වහසි බස් දෙඩති. දිලිසෙන මුවහත් අවි ලෙළවති. රණ බෙර මෙන්ම සල්වාදයන් හඬින් මුළු සටන් භූමියම ගිගුම් දෙමින් පැවැති උද්වේගකර මොහොතෙහි සේනාවන් මධ්‍යයට අහ කරාගෙන මහා කාරුණිකයාණන් වහන්සේ වැඩම කළ සේක. උන්වහන්සේ අහසෙහි වැඩ සිට මහා ඝන අඳුරක් මවා ලූ සේක. නාගයන් ඉන් බියපත්ව අවි බිම දමා සිටි කල්හි ආලෝකයක් මවා තමන් වහන්සේ ඔවුනට දක්වන්නට සැලැස්වූහ. දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් අසූවක් අනුව්‍යඤ්ජන ලක්ෂණයෙන් සමන්විත අසිරිමත් බුදු සිරුරක් උන් වහන්සේගේ අපරිමිත කරුණාවට දෙනෙතත්, මෙත් පුදිනා ගුණ සපිරි බුදු කමලන් දුටු ඔවුනු චිත්ත ප්‍රසාදයට පත් වූහ.

මෙදින සිදුවීමට නියමිතව තිබූ සටනට උදව් පිණිස පැමිණ සිටි මහෝදර නා රජුගේ මාමණ්ඩිය වූ කැලණියේ විසූ මණි අක්ඛිත නා රජු බුදු හිමියන් දෙසූ දහම් අසා බලවත් පැහැදීමට පත්ව තම රාජ්‍යය වන කැලණියට වඩින ලෙස උන්වහන්සේට ඇරයුම් කළේය. (එම ඇරයුමෙහි ප්‍රතිඵලයක් වශයෙන් පසු කාලයෙහි බුදු හිමියන් ලක්දිව සොළොස්මස්ථානයට වැඩමවා තෙවැනි වතාවට මෙම භූමිය ශ්‍රී පාද ස්පර්ශයෙන් පවිත්‍ර කළ සේක)

මැණික් පුටුව පාරිභෝගික චෛත්‍යයක් වශයෙන් නාගයන්ට වැඳුම් පිදුම් කරනු පිණිස සපයා දී ආපසු දෙව්රම් විහාරයට වැඩම කළ සේක. බුදු හිමියන් පරිභෝග කළ පත්තරා ගස පූජනීයත්වයෙන් සැලකූ රජවරු එය නිදන් කර චෛත්‍යයක් ද කළහ.


එය 'රාජායතන' නම් විය. පසු කාලයේ ඉන්දියාවේ මෞර්ය රජු මෙන්ම ලංකාවේ නාගයා, දේවානම්පියතිස්ස වැනි රජවරුද මෙම චෛත්‍ය පරිපූරණයට විවිධ නවකම් කරවූහ. මෙම අතිපූජනීය චෛත්‍ය රාජ්‍යාණ්ඩු පිහිටි ප්‍රදේශය පුරාණ වංශකතාවල නාගද්වීපය වශයෙන් සැලකෙයි. මෙතෙක් හමු වූ ක්‍රි.ව. දෙවැනි සියවසට අයත් වල්ලිපුරම් රන් සන්නසට අනුව 'නකදිව' වශයෙන් ටොලමිගේ සිතියමට අනුව 'නාදිප' වශයෙන් සද්ධර්මාලංකාරයට අනුව 'මණිනාගදිව' වශයෙන් ද රසවාහිනියට අනුව 'මණිනාග දීපය' වශයෙන්ද විදේශිකයන් විසින් 'නාගනාඩු' වශයෙන් ද හඳුන්වන ලද නාගදීපය සම්බුදු පහසින් පවිත්‍රවූයේ පත් වූයේ බක් මාසයේ දීය.

පූජ්‍ය නාලන්දවේ විමලවංශ හිමි

"මේ ලෝකයේ කවරදාවත් වෛරයෙන් වෛරයෝ නොසංසිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්. මෙය පෙර සිට පවතින ධර්මයකි"

### අලුත් අවුරුද්දයි, පොහොය දිනයයි එකම දවසේ

# සිංහල බෞද්ධයා අවුරුදු කන්නේ කොහොමද?



ජ්‍යොතිෂ විද්‍යාවට අනුව අප්‍රේල් මාසයේදී සූර්යයා මීන රාශියෙන් මේෂ රාශි ගතවීම සිදුවේ. රාශි චක්‍රය තුළ සූර්ය ගමනේ වටයක අවසානය මීන රාශියට අයත් කොටසේ අවසානය වන අතර ආරම්භය මේෂ රාශියට අයත් කොටසේ ආරම්භක සීමාව වේ. මේ අන්දමට මේෂ රාශියට සූර්යයාගේ සම්ප්‍රාප්තිය හින්දූන් විසින් මහත් ගෞරවයෙන් යුතුව අතීතයේදී සැමරූ අතර ජ්‍යොතිෂය පිළිබඳව පිළිගැනීමක් ඇති සිංහල ජනයාද මෙම අවස්ථාව ගෞරවයෙන් හා උත්කර්ෂවත් ලෙස සැමරීමට පුරුදුව සිටිති. විශේෂයෙන් සිංහල බෞද්ධයන් විසින් මෙම අවස්ථාව සමරනු ලබන්නේ ඔවුන්ට විශේෂ වූ චාරිත්‍ර අනුගමනය කරමිනි.

සිංහල අලුත් අවුරුදු සැමරීම සඳහා නැකත්කරුවන් විසින් ග්‍රහ හැසිරීම සොයා බලා ඒ ඒ කටයුතු සඳහා සුබ මුහුර්තින් නියම කරනු ලබයි. මෙහිදී කිසිදු කාර්යයක් ආරම්භ කිරීමට සුදුසු නොවන කාලය හෙවත් නැකත් යෙදී නැති කාලය නොනගතය වශයෙන් හඳුන්වා දෙනු ලබයි. මෙම කාලය තුළ ආහාර ගැනීම, ස්නානය කිරීම, වැඩපළ කිරීම, ගනුදෙනු කිරීම ආදි සියලු කටයුතු නවතා දමන අතර පුණ්‍ය කටයුතුවල යෙදිය යුතු බව සඳහන් කොට එම කාලය පුණ්‍ය කාලය වශයෙන් සලකති.

සිංහල බෞද්ධයාට මෙය වැදගත් කාලයකි. ස්වකීය විහාරස්ථානයට ගොස් තෙරුවන් වන්දනා කිරීම වැදගත් කාර්යයකි. බොහෝ අය මෙම අවස්ථාවට විහාරස්ථානය කරා පැමිණ මල් පහන් පූජා කොට එළඹෙන වර්ෂය සරුසාර ජීවිතයක් ගත කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරති. එහෙත් එය ලෞකික සැප අරමුණු කරගනිමින් කරන ප්‍රාර්ථනාවකි.

"යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පවට ආශා නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."

එසේ වුවද නියම බෞද්ධයකුගේ අරමුණ විය යුත්තේ ලෞකික සැප සම්පතට වඩා නිර්වාණයයි. ඒ නිසා පුණ්‍ය කාලය තුළද අරමුණ විය යුත්තේ සංසාර ගමනේ නිමාවයි. එබැවින් පුණ්‍ය කාලයෙන් අරඹන නව වසර තුළ බෞද්ධ පිළිවෙත්හි වැඩි වැඩියෙන් නිරතවීම ආරම්භ කිරීම වැදගත්ය. ඒ තුළින් තම සංසාර ගමන නිම කිරීමේ අරමුණින් කටයුතු කිරීමට අදිටන් කරගත යුතුය.

තමුන් අවුරුදු සමරන බොහෝ දෙනා අතින් මෙම පුණ්‍ය කාලය තුළ පවා බෞද්ධයකුට නුසුදුසු කාරණා බොහොමයක් සිදුවේ. මත්වතුර භාවිතය, සූදු ක්‍රීඩාවල යෙදීම, මස් මාංශ අනුභවය හා සතුන් මැරීම වැනි නොයෙක් පව්කම් සිදුකරති. ඇතැම් අවුරුදු උත්සවවලදී ලොකුම බොරුව කීමේ තරග පවා සංවිධානය කර දූ දරුවන් ලවා මුසාවාද කියවති. මෙම තත්ත්වයන් බෞද්ධයාගේ අවධානයට ලක්විය යුතු කාරණය.

පුණ්‍ය කාලය අවසන් වන්නේ ලිප් බැඳ ගිනි මොලවා ආහාර පිස අනුභවය හා ගනුදෙනු කර වැඩ ඇල්ලීමේ චාරිත්‍රයෙනි. නැකතට පිළියෙළ කරන හා අනුභව කළ යුතු ආහාරයද නැකත්කරුවන් දක්වා ඇත. එහෙත් ඒ ආහාරය පිණිස මස් මාංශ මිශ්‍ර ආහාරයක් ඇතුළත් නොවේ. සෞඛ්‍ය සම්පන්න කිරිබතක් පිළියෙළ කර අනුභව කිරීමට වඩා උචිතය.

සූර්ය සංක්‍රාන්තිය ලොව සියලු සතුන්ට පොදු වූවකි. එහෙත් මෙදින මිනිසුන්ගේ විශේෂ ආහාරයක් වශයෙන් මස් මාංශ යොදා ගැනීම නිසා අනෙකුත් දිනවලට වඩා වැඩි සතුන් ප්‍රමාණයකගේ ජීවිත අහිමි වීමක් සිදුවේ. අවුරුදු සමය වෙනුවෙන් අප රටේ කුකුළන්, එළුවන්, හරකුන්, ඌරන් නොකරම් ප්‍රමාණයක් මරණයට ලක්වන්නේද යන්න බෞද්ධයන්





වශයෙන් ඔබත් සිතා බැලිය යුතු කාරණයය.

එසේම අවුරුදු සමය තුළ මත්වතුරටද ලැබෙන්නේ විශේෂ ස්ථානයකි. තම ශරීරයේ ස්නායු අඩපණ කර ගනිමින් අව සිහියෙන් යුතුව වර්ෂයක් ආරම්භ කරයි නම් ඔවුන් අරඹන වසර සතුටුදායක එකක් වන්නේ කෙසේද? සිහි විකල්ව පුණ්‍ය කාලය පවා ගතකරන අය එම කාලය පවා ගෙවනුයේ අරමුණකින් තොරවය. බොහෝ දරුවන් මත්ද්‍රව්‍ය හෝ මත්වතුර භාවිතයට හුරු වන්නේ අවුරුදු සමය තුළදීය. මේ නිසා පුරාවට පුරුදු වන පවුල්වල සමාජීය තත්ත්වය මෙන්ම



ආර්ථික තත්ත්වයද පිරිහීම මෙලොව තුළදීම අත් විඳින්නට වන විපාකයක් බවට පත්වේ.

එසේම අවුරුදු සමය තුළ සූදු ක්‍රීඩාවටද ඇතැම් අය ප්‍රධාන ස්ථානයක් ලබාදී ඇත. තමන් උපයන මුදල් නිරපරාදේ වැය කිරීමට මාර්ගයක් මේ මගින් ඇති වන අතර ණය තුරුස්වලට පවා ලක්වීමට සිදුවන බැවින් එය තමාගේ පමණක් නොව පවුලේ සාමාජිකයන්ගේද අපේක්ෂා බිඳ වැටීමට හේතු වනු ඇත. බුදුන් වහන්සේ පරාභව සූත්‍රයේදීද මිනිසාගේ පිරිහීමට හේතුවක් ලෙස සූදු ක්‍රීඩාව දක්වා ඇත.

සිංහල අවුරුදු චාරිත්‍රවල පුණ්‍ය කාලයට පෙර අවස්ථාවද ඉතා වැදගත්ය. පුණ්‍ය කාලය යෙදෙන දිනයට පෙර දිනය පරණ අවුරුද්ද වශයෙන් සැලකේ. මෙදින සිදුවන කාරණාද ඉතා වැදගත්ය. විශේෂයෙන් වැඩිහිටියන් ගරු කරන දිනයක් වශයෙන් මෙම දිනය සැලකේ. ඒ අනුව සිංහල බෞද්ධයන් විසින් අනුගමනය කරන ඇතැම් චාරිත්‍ර ඉතා වැදගත්ය. දුර බැහැර සිටින දූ දරුවන් සිය දෙමාපියන් වෙත නැවී බෝගද රැගෙන පැමිණ බුලත් හුරුළු දී දෙපා නමදින දිනයක් වශයෙන් එදින සැලකේ. තෙරුවන්ගේ සරණ යාමට අමතරව දෙමාපියන්ගේ ආශිර්වාදය විශේෂයෙන් ලබා ගන්නා දිනයක් වශයෙන් පරණ අවුරුදු දිනය සැලකේ. මෙයට අමතරව වෙනත් වැඩිහිටියන්, ගුරුවරුන් බැහැදක බුලත් හුරුළු දී ඔවුන්ට ගරු කිරීමද පරණ අවුරුදු දිනයේදී සිදුකෙරේ. බුදුන් වහන්සේ මංගල සූත්‍රයේදී දේශනා කර ඇති පරිදි මව්පියන් නැමදීම, පිදිය යුත්තන් පිදීම වැනි මංගල කාරණා මෙම අවස්ථාවේදී සිදුවේ. එබැවින් සිංහල අවුරුදු සමය සිංහල බෞද්ධ චාරිත්‍රවලට බැඳී පවතින විශේෂ කාලයක් වශයෙන් සැලකිය හැකිය.

මේ අන්දමට සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර ඉටු කිරීමේදී බෞද්ධයකු වශයෙන් සිතා බලා කටයුතු කරන්නේ නම් එළඹෙන වර්ෂය වඩාත් වාසනාවන්ත හා ඵලදායී වර්ෂයක් වනු නිසැකය. පුණ්‍ය කාලය තුළ දාන, සීල, භාවනාදී කටයුතුවල නිරත වීමත් ඒ මගින් නව වසරට නව එළඹුමක් ලබාගෙන ආගමානුකූලව ජීවිතයට හුරු වීමත් බෞද්ධයකු වන සිංහලයෙකුට ලැබෙන මහඟු අවස්ථාවකි. එසේ වන විට සිංහල අවුරුද්ද සිංහල බෞද්ධ අවුරුද්දක් වශයෙන් පත්වනු ඇත.

බණ්ඩාර ඇඹිරියගල

"පව් කරන්නා මෙලොවින් ශෝක කරයි, පරලොවින් ශෝක කරයි, දෙලොවම ශෝක කරයි. හේ තමාගේ කිලිටි කර්මය දැක ශෝක කරයි. වෙහෙසින් පෙළෙයි."



# මොකක්ද මේ සතර මහා නිධානය කියන්නේ

සිංහල බෞද්ධ සමාජය තුළ වැඩිහිටියන්ට ගරු කිරීම , වැඳීම ආදිය ඉතා උතුම් ක්‍රියාවක් සේ සලකනු ලැබේ. වැඩිහිටියන්ට වඳින ඇතැම් අවස්ථාවල පුතේ දුවේ නුඹට සතර මහා නිධානයම පහළ වේවායි ඇතැම් විට ආශිර්වාද කරනු ඔබ අසා ඇතිවාට සැක නැත.

තුමක්ද මේ මුදුන් වදළ සතර මහා නිධානය යැයි මදක් විමසා බලමු. පුද්ගල ජීවිතයට ඉතා වටිනා ළඟා කර ගත යුතුම නිධාන හතරක් මෙයින් විග්‍රහ කෙරේ. එනම්

1) ස්ථාවර නිධානය
2) ජංගම නිධානය
3) අංගසම නිධානය
4) අනුගාමික නිධානය

## ● ස්ථාවර නිධානය

නිශ්චල දේපළක හිමිකම හෙවත් තැනකින් තැනකට ගෙන යා නොහැකි ස්ථිරව තිබෙන දේපළක හිමිකම මෙයින් අදහස් කෙරේ. මෙලොවට බිහි වූ පුද්ගලයෙකුට තමා උපන් භූමියේ නීත්‍යානුකූල හිමිකමක් තිබීම ජීවිතය පවත්වාගෙන යාමට විශාල ශක්තියකි. තමාටම කියා ඉඩමක් නිවසක් තිබීම කොතරම් සැනසිලිදායක තත්ත්වයක්ද? හිසට වහලක් නිතට නිවහනක් නොවන්නේ ද? බෝග වගා කටයුතු සිදු කර ගැනීමට භූමියක් හිමිව තිබෙන්නේ නම් කොතරම් අගේද? ගෙවල් ඉඩම් මඩ ඉඩම් විශාල අක්කර ගණනක් සහ මහා මන්දිර ගණනාවක් හිමිකම් තිබෙනවා නම් ස්ථාවර නිධානයට මහා පරිමාණ වශයෙන් හිමිකම් කියන්නෙකි. කෙසේ වෙතත් පදිංචිව සිටීමට නිවහනක් වත් තිබීම ස්ථාවර නිධානය ළඟා කර ගැනීමක් වශයෙන් දක්විය හැකිය.

## ● ජංගම නිධානය

තැනකින් තැනකට ගෙන යා හැකි වස්තු සම්භාරයක හිමිකම් මෙයින් අදහස් කෙරේ. පුද්ගල ජීවිතයකට ඉතාම අවශ්‍ය නිධානයක් වශයෙන් ද මෙය හැඳින්විය හැකිය. මිල මුදල් රන් රිදී මුතු මැණික් වගේම තමන් සතු කරගන්නා යාන වාහන විදුලි උපකරණ වෙනත් ගෘහ උපකරණ ආදී සියලුම චංචල දේපොළ මේ ගණයේ ලා සැලකිය හැකිය. ජංගම නිධානයන්හි හිමිකම් නැතිව අපට ජීවිතය පවත්වාගෙන යාමට නොහැකිය. එය නිසා මෙය සතර මහා නිධාන අතර හිමිකර ගත යුතුම නිධානයකි.

## ● අංගසම නිධානය

පුද්ගලයෙකු සහජයෙන් අධ්‍යාපනයෙන් හෝ සම්ප්‍රදායෙන් ලබාගන්නා දැනේ හැකියාව අංගසම නිධානය තුළින් අර්ථවත් කෙරේ. තමාගේ කායික ශක්තිය තුළින් යම් නිර්මාණයක් කිරීමේ හැකියාව යම් වෘත්තියක් කිරීමේ හැකියාවක් මගින් ආර්ථික සම්පත් ළඟා කර ගන්නා පුද්ගලයින් සුලභව දකිය හැකිය. වඩු කර්මාන්තයේ යෙදෙන කාර්මිකයින් එම කර්මාන්තයේ නියැළෙන්නේ දැනේ හැකියාවෙනි. විවිධ යන්ත්‍ර උපකරණ ක්‍රියා කරවන පුද්ගලයන් තම කාර්යයන් කරන්නේ දැනේ හැකියාවෙනි. දැනේ හැකියාවක් තිබෙන කවර පුද්ගලයෙකුට හෝ රැකියාවක් සොයා ගැනීම දුෂ්කර නැත. විරැකියාව ප්‍රධානතම හේතුව හැකියාවක් නොමැතිකමය. දැනේ හැකියාවක් හෙවත් වෘත්තීය පුහුණුවක් ලබා ගැනීම අංගසම නිධානය හිමිකර ගැනීමකි. පෙර සඳහන් කළ ස්ථාවර නිධානයක්, ජංගම නිධානයක් සුනාමි, ගංවතුර, ගින්නට හසු වීම වැනි ස්වභාවික විපත් වලින් හෝ විනාශ වී යා හැකිය. නමුත් මෙම නිධානය පුද්ගලයා මියයන තුරුම රැඳී පවතී. අංගසම නිධානයක හිමිකම හෙවත් දැනේ හැකියාවක් ඇත්නම් මුලින් සඳහන් කළ ස්ථාවර හා ජංගම යන නිධානයන් දෙකම හිමිකර ගැනීමේ හැකියාව පවතී.

## ● අනුගාමික නිධානය

අනුගාමික යනු පසු පස එන යන අර්ථයයි. පෙර කළ පින් ඇති බව මංගල කරුණක් බව මහා මංගල සූත්‍රයේ සඳහන්ය. එසේම පෙර කළ පින් ඇති බව සතර මහා නිධානයන්ගෙන් එකකි. අප විසින් සමාජය වෙනුවෙන් යහපත් චේතනාවෙන් කරනු ලබන ක්‍රියාවන් සහ දන් දීම , සිල් රැකීම භාවනා කිරීම ආදී දස පින් කිරියවත් සියල්ල අනුගාමික නිධානය යන්නට අයත් වේ. අපි පෙර ආත්මභාවවලදී අනුගාමික නිධානය අත්කරගෙන තිබුණේ නම් මෙලොව ජීවිතය පහසුවෙන් ගෙවා දැමීමට හැකිවනු ඇත. අකුසලකම් සිදු නොවනු ඇත. එම නිසා ඉදිරි භවයේ ද යහපත පතා අනුගාමික නිධානය ළඟා කර ගැනීමට කටයුතු කිරීම අගනේය.

මුලින් සඳහන් කළ ස්ථාවර නිධානය සහ ජංගම නිධානය යන නිධාන දෙකම ස්වභාවික විපත්වලින් විනාශ වෙනවා වගේම මරණින් පසු පුද්ගලයා සතු දැනේ හැකියාව එනම් අංගසම නිධානයද විනාශ වේ. නමුත් අවසානයට සඳහන් කළ අනුගාමික නිධානය භවයෙන් භවයට ගමන් කර සත්වයාට යහපත් සලසා දෙන බව පෙන්වා දිය හැකිය.

ලාල් විජේසිංහ - ගම්පොළ

# නිවනට දුර නැත

බුදු දහම යනු කුමක්ද? කුමකටද? යන්න පිළිබඳව බෞද්ධයන් යැයි හඳුන්වා ගන්නා බොහෝ පිරිසක් තවමත් සරිහැටි අවබෝධ කරගෙන නැත. තවත් කනගාටුවට කරුණක් වන්නේ මේ අතරින් බොහෝමයක් පිරිස් එය ආගමක් සේ පිළිගැනීමය. එසේ මෙලොව විශයෙන් නොව පරලොව සඳහා වන මාර්ගයක් සේ සැලකීමද අභාග්‍යයට කරුණකි.

නමුදු සැබැවින්ම බුදු දහම යන්න, ආගම් හා දර්ශනය යන වචනාර්ථයන් ඉක්මවා ගොස් ලෝකයේ ඇති යථා ස්වභාවය පිළිබඳව හෙළි කරන දහමක් වන බව ඒ පිළිබඳව පුළුල්ව විමසා බලන්නවුන්ට පමණක් පැහැදිලිව පෙනී යන්නා වූ කරුණකි. මෙහිදී සැබෑ ලෙසම සිදුවනුයේ, අප විසින් ජීවිතය පවත්වාගෙන යාමේ පටන් සිදුවන්නා වූ සෑම ක්‍රියාවලියක්ම, සත්‍යස්වභාවයම ඇතුළු නිවැරදිව හා සත්‍ය විශයෙන් තොරසේ නම්, ජීවිතය තුළ ඇති යථාර්ථය මෙම දහමින් පැහැදිලි කිරීමය. එමෙන්ම, ලෝකය තුළ ඇති යථා ස්වභාවය තවුවේ අප කෙසේ කටයුතු කළ යුතුද යන්න පිළිබඳව මෙලොව පහළ වූ උත්තරීතරවූත්, ශ්‍රේෂ්ඨතමවූත් මනුෂ්‍යයාණන් වන සිද්ධාර්ථ ගෞතම නමින් සම්බුද්ධරාජාණන් වහන්සේ විසින් [illegible] ධර්මය [illegible] වශයෙන් [illegible] මෙම ජීවිතය [illegible] සම්මා සම්බුද්ධත්වය [illegible] [illegible] අවබෝධ කොටගත් මේ සත්‍ය ධර්මය සාරා [illegible] සසර [illegible] උතුම් නිවන [illegible] සාක්ෂාත් කරගත හැකිය [illegible].

සියලු ලෝක සත්වයන්ට [illegible] විමසා බලනු [illegible] වූ මෙම දහම [illegible] නිසා


සත්ව සංසාරයේ අනාථව සිටිනවුන් නමුදු මෙම උතුම් දහමට අනුගත වන සියල්ලන්ටම මෙම දහම තුළින් සාර්ථක ප්‍රතිඵල ලබන්නා වූ බව නිසැකය. සම්බුදු දහමට අනුව බලන කල අප ලද මේ උතුම් මනුෂ්‍ය ආත්ම භාවය අපට ලැබී ඇත්තේ උපන් ද සිට කෑමෙන්, බීමෙන්, විනෝදවීමෙන් පමණක් මෙම උතුම් ජීවිතය කෙළවර කරගනු දකිමට නොව අන් එහා ගිය වටිනා කරුණක් උදෙසා බව අප අවබෝධ කළ යුතු වෙයි. ඒ කුමක් නිසාද යත්, මෙලොව උපත ලබන සෑම සත්වයකුම මෙම සසර තුළ ඇද බැඳ තබන්නා වූ කෙලෙස් බැම්මෙන් මිදී ලැබිය හැකි අමා නිවන් සුවය සාක්ෂාත් කරගනු සඳහාය. එවන් විමුක්ති මාර්ගය සොයා යා හැකි ලොව පහළ වන සත්වයන් අතරින් ඒ උතුම් නිවන හෙළි කරගත හැකි සත්ව කොට්ඨාස තුනක් පිළිබඳව තථාගතයන් වහන්සේ දේශනා කොට ඇත. එනම් මනුෂ්‍ය, දෙව් හා බ්‍රහ්ම වශයෙනි. ලෝක ධාතුව තුළ පහළ වන අනන්ත අප්‍රමාණ සත්ව කොට්ඨාස අතරින් මිනිසුන් වශයෙන් උප්පත්තිය ලැබීම තුළ අප පරම භාග්‍යවන්තයන් වන්නේ මේ දුර්ලභ අවස්ථාවෙන් නිසි ප්‍රයෝජනය ලැබුණහොත් පමණි. එයට හේතුව නම්, බුද්ධෝත්පාද කාලයක ධර්මය ඇසිය හැකි පරිසරයක ඇස, කන ආදී ඉන්ද්‍රිය විකලත්වයක් නැතිව ඉපදී සිහිනුවණ මෙහෙයවා කටයුතු කළ හැකි අපි ක්ෂණ සම්පත්තිය ඇතිව මෙලොව උපත ලද්දන් වන හෙයින්ද නිසි මාර්ගය තුළ ගමන් කිරීම මත නිවන සාක්ෂාත් කරගැනීමේ හැකියාව ඇත්තවුන්ද වන හෙයිනි.

● කාලය සීමිත වන්නේ ඇයි?

එමෙන්, මෙලෙස් මේ ලොව තුළ සදාකාලිකව ජීවත් වන්නන් නොවන බැවිනි. වර්තමානයේ මිනිසාගේ ආයු කාලය සීඝ්‍ර වශයෙන් අඩු වෙමින් පවතී. උදෑසන අවදි වූ මොහොතේ පටන් රාත්‍රී නින්දට යන මොහොත දක්වාම මිනිසාට තම ජීවිතය පවත්වාගෙන යාම උදෙසා මහත් අරගලයක් කිරීමට සිදුව ඇත්තේ නමුදු ඒ සෑම කටයුත්තකම අවසානයේ හෝ මරණය අපට [illegible] සැඟවී සිටීමට අවකාශයක් ලැබී තිබේදැයි මොහොතක් සිතන්න. සැබැවින්ම පිළිතුර වනුයේ "නැත" යන්නයි. [illegible] සෑම පුද්ගලයකුට කුමන හෝ කටයුත්තක් සිදු කිරීමට ඇත්තේද, එය මේ මොහොතේදී නොවෙතොත් තව මොහොතකින්, [illegible] අනිද්දා හෝ ඉදිරියේදී විය හැක. [illegible] බලන්නේ, ඒ සෑම සිදුවූ කටයුත්තකම ඇත්තේ අප තව ටිකක් මේ සසර තුළට ඇද බැඳ තැබීමේ හේතු රැස්කිරීමය. නමුදු මේ සියලු කටයුතු [illegible] අප විසින් මේ උතුම් නිවන සාක්ෂාත් කරගැනීමේ හැකියාව, අප්‍රමාද [illegible] [illegible] සසර දුකින් මිදීම [illegible] අනිත්‍යතාව [illegible]

"අප්පමාදෝ අමත පදං - පමාදෝ මච්චුනෝ පදං,
අප්පමත්තා න මීයන්ති - යේ පමත්තා යථා මතා"

කුසල ක්‍රියාවන්හි [illegible] ලැබීමට හේතු වේ. [illegible] ප්‍රමාද [illegible] [illegible] හැකි [illegible]



"මෝඩයා මට දරුවෝ ඇත, මට ධනය ඇත කියා සිතමින් දුක්වනු වෙයි. තමාට තමාවත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?"

නොවුණේ? නොමැරෙන්, පුණිඳු වූයේ? මළවුන් මැතිය.

බුදු දහම නිසා දෙන්නේ මෙවැනි දහමකි. නිවන කරා සිත්වත් ඔබ යන තමන් මාර්ගය කිසි ලෙසකින් අඳුරා නොගත යුතුය. මේ ආත්ම භාවය තුළ නිවන් දකිය හැකි දැයි සිත තුළ සැකයක් ඇති කර නොගත යුතුය. මක්නිසාද යත්, අප තථාගත බුදුපියාණන් වහන්සේ විසින් අද අපට ඒ උතුම් දහම් මග විවෘත කොට තබා ඇති බැවිනි. දීඝ නිකායේ මහා පරිනිබ්බාණ සූත්‍රය තුළ තථාගතයන් වහන්සේ මැනවින් වදාරා ඇත්තේ, ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ පසන්නා වූ (පැහැදුණා) භික්ෂූන් ඇත්නම් මේ ලෝකය රහතුන්ගෙන් හිස් නොවන බවය. මෙහිදී භික්ෂූන් ලෙස වදාරා ඇත්තේ භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා යන සිව්වනක් පිරිසය. එමෙන්ම නිවැරදි ධර්ම මාර්ගයේ ගමන් කරන සිත්වතුන්ටද මෙම ශාන්ත වූ නිවන් මග සාක්ෂාත් කරගත හැකිය. යමෙක් කුසල කර්මයක විපාක වශයෙන් නිර්මල බුදු දහම පවතින මෙවන් අවධියක මිනිසත් බවක් ලැබ බුදුහිමියන් දේශනා කළ ධර්මය ඒ අයුරින්ම දැන ගැනීමේ හැකියාව ඇති මෙවන් කාලයකදී ඒ සඳහා කුසිතභාවයකින් හෝ එය වළක්වාලූයේ අප තුළ වන කෙලෙස් හේතු කොටගෙන බව වටහා ගැනීමට උත්සාහ වන්නා තුළින් නිවන ඇත්තේම බව නිසැකය. ක්ලේශයන් බලවත්වන කල නිවන් මාර්ගය දුර්වල වේ. එසේ දුර්වල කරවන ක්ලේශ සමූහයන් තුළින් අප නැවත බාහිර ලෞකික සැප සම්පත් විඳීමට කටයුතු සලස්වන අතර, බුදුරදුන් වදළ මෙම ධර්මය අනුව ජීවිතය පුහුණු කිරීම දුෂ්කර බව හඟවයි. (මිනිස් සිතෙහි ඇති වන කෙලෙස් පිළිබඳ පැහැදිලි විග්‍රහයක් රේරුකානේ චන්දවිමල හාමුදුරුවන්ගේ කෙලෙස් 1500 නම් පොතෙහි දක්වා ඇත.)

සසර පුරා මිනිසා බැඳ තබන්නා වූ ලෝභ, ද්වේෂ, මෝහ යන අකුසල මූල සිත් හේතු කොටගෙන නැවත නැවතත් සැපයක් සොයන්නට මිනිස් සිත පොළඹවනු ලබන ක්ලේශ මාරයාගෙන් මිදීම සඳහා සිත්වත් ඔබ දැඩි වීර්යයක් සිත තුළ ඇතිකරගත යුතුය. එමෙන්ම "සන්දිට්ඨිකෝ" යන්නෙන් බුදු හිමියන් දේශනා කළ මෙම ධර්මය තමා විසින්ම තමන්ට වැටහෙන පරිදි ප්‍රත්‍යවේක්ෂා ඥානයෙන් අවබෝධ කරගත යුතුය. සැබැවින්ම බුදු දහමට අනුව, සසර තුළ මිනිසා විඳින්නා වූ දුක් පිළිබඳව අපට මහා අවබෝධයක් නොවන්නේ ජාතිස්මරණ ඥානය අප තුළ නොමැති බැවිනි.

අප සම්මා සම්බුදු තථාගතයන වහන්සේ විසින් නිවැරදි ආර්ය මාර්ගය අප වෙත දේශනා කොට ඇති හෙයින් ඒ උතුම් මාර්ගය තුළ නිවැරදිව හැසිරීම තුළ අප වෙතද "නිවන" නම් වන අමා සුවය පසක් කර ගැනීමේ භාග්‍යය උදාවී ඇත. ඒ උතුම් ආර්ය සත්‍ය හතරින් පළමු වැන්න වනුයේ දුක්ඛ සත්‍යයයි.

1. දුක්ඛ සත්‍යය

උපත් ද සිට අප ගෙවන මිනිස් ජීවිතය තුළ අප අත්විඳින්නා වූ දුක නම් සත්‍යය වේ. අපගේ ශරීරය දෙස බැලුවද මෙය දිනෙන් දින ගෙවෙන් වන ආකාරයක් ප්‍රතිමාපයෙන් පිරිසිදු නොකරන විට අපිරිසිදු බවට පත්වෙන ආකාරයක් ලෙඩ රෝගයන්ට ගොදුරු වූ පසු ජරාවට පත්වන අයුරුත් අපට ඇති සරලම සිදුවීම් වශයෙන් ගත හැකි වුවද ඇත්තෙන්ම සිදුවන්නේ අප ඒ පිළිබඳ නොසිතීමය. දුකක් බව නොදැනීම හා දුක්ඛ සත්‍යයේ ස්වභාවය තේරුම් නොගැනීමය. නොඑසේ නම් ධර්මයට අනුව යොනිසෝ මනසිකාරයෙන් නොදැකීමය.

මිනිසත් භවයක් ලද හෙයින් මේ දුක මෙසේ පෙනුනද, යම් හෙයකින් සතර අපායක, දේව ලෝකයක හෝ තිරිසන් ලෝකය වැනි භූමියක අකුසල විපාකයක් මත ප්‍රතිසන්ධිය ලැබුවේ නම් ප්‍රතිඵලය මෙයටත් වඩා අනතුරුදායක වන බව සිත්වත් ඔබ වටහාගත යුතු අතරම මේ තරම් සත්වයින්ට දුක ඇති කරවන්නේ කිසේද? යන කාරණය සෙවිය යුත්තේ එබැවින්ය. තථාගත සම්බුදු පියා වදළ දෙවන ආර්ය සත්‍යය නම් එයයි. දුකට හේතුව සොයාගත් සමුදය සත්‍යයයි.



2. සමුදය සත්‍යය

දුක හටගන්නා මිනැම හේතුවකට මූලය බාහිර බලවේගයක් මත ඇති වන්නක් නොවේ. එහි මූලික ක්‍රියාකාරීත්වය ඇත්තේ අපගේ සිත තුළය. "මගේ" යැයි අප නිතර කියන මේ වචනය සිත තුළ ඇති කරවන මෙහි මූලයට අපි තණ්හාව යයි කියමු. දුක හටගන්නා මූලික හේතුව නම් අප තුළ ඇති මේ තණ්හාව බව ක්‍රමානුකූලව අප අවබෝධ කරගත යුතුය. එය මේ ආත්මය තුළ එකවරම කළ හැක්කක් නොවන හමුදු අව්‍යාපාදය මත හෝ අතීතභවය තුළ සිදුකරන ලද පාරමී ධර්මයන් මත නොකළ හැක්කක්ද නොවන්නේය. එබැවින් මෙම රාග, ද්වේෂ, මෝහ නම් වන ක්ලේශ ධර්මයන් ප්‍රහාණය කිරීමට අප තුම් ක්‍රමයෙන් පුහුණු විය යුතුය. එවිට ඔබට අත්කර ගත හැකි වන්නේ 3 වන ආර්ය සත්‍ය වශයෙන් දේශනා කරන ලද දුක නැති කිරීම නම් වන නිරෝධ සත්‍යයයි.

3. නිරෝධ සත්‍යය


දවසේ විසිහතර පැය තුළ නින්දට ගත කරන වේලාව හැරුණු විට ඉතිරි කාලය තුළ මොහොතින් මොහොතට සිත තුළ ඇති වන නොයෙක් සිතුවිලි මනසේ ක්‍රියාකාරී වන අප තුළ ඇති වන්නේ දුක් හටගැනීමම බව ඔබ මොහොතක් සිතුවාද? දවසින් දවස විවිධ වේදනාවන්ගෙන් අපගේ සිත තුළට නැඟීම වේදනාවන් එක්වනවා මිසක එහි අවසානයක් නම් ඇත්තේම නැත. එබැවින් අප මේ සියලු දුක් වේදනාවන් සහමුලින්ම දුරුකර දැමීමට දුක නැති කිරීම නම් වන උතුම් ආර්ය සත්‍යය පිළිබඳ වටහාගත යුතුම වේ. මෙය සිදුකර ගැනීමට සිත්වත් ඔබට දැඩි වීර්යයක් හා අවංකභාවයක් ඇතිව සිටිය යුතුමය. ඔබ තුළ ඇති වීර්යය තුළින් ඔබට මේ සසර දුකින් එතෙර විය හැකි නමුත් එම මාර්ගය පිළිබඳව සම්බුදු පියාණන් විසින් මනාව පෙන්වා දී ඇත. ඒ මාර්ග සත්‍ය වශයෙනි.

4. මාර්ග සත්‍යය

ඒ උතුම් මාර්ගය වශයෙන් තිලෝගුරු බුදු පියා දේශනා කොට ඇත්තේ මධ්‍යම ප්‍රතිපදාව තුළින් ආර්යය අෂ්ටාංගික මාර්ගය වැඩෙන ලෙස කටයුතු කරන ආකාරයයි. ඒ තුළින් සසර දුකින් මිදී ලැබෙන උතුම් විමුක්ති සුවය වන පරම නිවන සාක්ෂාත් කරගත හැකි ආකාරය දේශනා කළ තථාගතයන් වහන්සේ ඒ සඳහා වන මාර්ග අංග අට පිළිබඳව මෙන, ආර්යය අෂ්ටාංගික මාර්ගය මෙසේ වදළ සේක. එනම්,

1. සම්මා දිට්ඨි, 2. සම්මා සංකප්ප, 3. සම්මා වාචා, 4. සම්මා කම්මන්ත, 5. සම්මා ආජීව, 6. සම්මා වායාම, 7. සම්මා සති, 8. සම්මා සමාධි වශයෙනි. මෙම අංග අට තුළින් සම්බුදු පියාණන් අපට පෙන්වා දී ඇත්තේ සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රී ශික්ෂාව පුහුණු කිරීම තුළ මෙහි උපරිම ඵලය ලබා කර ගත හැකි බවයි. එමෙන්ම තථාගතයන් වහන්සේ විසින් හතළිස් පස් වසරක් පුරා දේශනා කොට වදළ සමස්ත ධර්මයම මෙම ආර්යය ප්‍රතිපදාව ඉලක්ක කරගනිමින් දේශනා කොට ඇති අතර, සාරාසංඛ්‍යෙය කල්ප ලක්ෂයක් පුරා පාරමී දම් පුරමින් අවබෝධ කොටගත් මේ උතුම් මග අවසානය ඇතිනම් බෞද්ධයින්ට පමණක් නොව අන්‍යාගමිකයින්ටද ජනතාවටද පුරුදු පුහුණු කරගත හැකි උතුම් මගක් බව සඳහන් කළ යුතුය.

ලසන්තා ප්‍රියදර්ශනී බණ්ඩාර



අපි නොදන්න නීතිය

## හිතූ මතයට ආගමික ස්ථාන ඉදිකිරීම

# නීති විරෝධීයි

කිසියම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී නාගර සභාවෙන් හෝ ප්‍රාදේශීය සභාවෙන් හෝ අවසර ලබාගැනීම පොදු නීතියකි. එවැනි නීතියක් පවතින්නේ පාරිසරික හා තාක්ෂණික ගෝචරතාවය සොයාබැලීම අරමුණු කරගෙනය. එසේම මිදු මුදල් අයකර ගැනීමද අවශ්‍යතාවයකි. කුමන ආගමකට අයත් ගොඩනැගිල්ලක් වුවද ඉදිකිරීමේදී බලපවත්වන පොදු නීතියකි. ඒ සඳහා අවසර ලබාදීමේදී එවායේ ආගමික ස්වභාවය ගැන පළාත් පාලන ආයතන අවධානය යොමු කරන්නේ නැත. එහෙත් පොදු මහජන විරෝධතා ඉදිරිපත් වුවහොත් සාධාරණ කාරණා මත එම ඉදිකිරීම් නතර කිරීමේ බලයක් පළාත් පාලන ආයතනවලට තිබේ.

කිසියම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පෙර එය කුමන කාර්යයකට ඉදිකරන්නේද යන්න පිළිබඳව සඳහන් කොට නාගර සභා හෝ සුළු නගර සභා හෝ ප්‍රාදේශීය සභා මගින් අවසරයක් ලබාගත යුතුය. ඇතැම් ආගමික කණ්ඩායම් ආගමික ලැගුම් පාසලක් ලෙස ගොඩනැගිලි ඉදිකිරීමට අවසර ගෙන පසුව එය දේවස්ථාන බවට පත්කර ගන්නා අයුරු දක්නට ඇත. බෞද්ධ පරිසරයක ආගමික මධ්‍යස්ථානයක් පිහිටුවීමෙන් සාමයට හා සමගියට බාධාවන් සිදුවනවා නම්, එවැනි ස්ථානවලට විරෝධතා ඉදිරිපත් කිරීමට නීතියෙන් අවසර නැත. ආගමික හෝ මහජන කරදරයට හේතුවන අයුරින් අනවසරයෙන් ඉදිකෙරෙන ආයතන නීත්‍යනුකූලව සුදු ඒවා දුරු කොට නීතියෙන් කටයුතු කිරීමට මහජන ප්‍රජාවකියකුට පුළුවන. බෞද්ධයන් බහුතරයක් වෙසෙන ප්‍රදේශවල අනවසරයෙන් පිහිටුවා ඇති සංවිධාන, මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ගැටුම් ඇතිකර නොගෙන ඒවාට නීත්‍යනුකූල පියවර ගත යුතුය. 1982 අංක 4 (සංශෝධිත) නාගර සංවර්ධන අධිකාරී පනතේ 8 ඒ සහ 9 අ වගන්තියට අනුව අවසර ලබාගත් කාර්යයන් බැහැර වෙනත් දෙයකට ගොඩනැගිල්ලක් භාවිත කිරීම නීති විරෝධී වෙයි. එය අපරාධයකි. පාසලක් හෝ නිවසක් ලෙස ලියාපදිංචි කළ ගොඩනැගිලි දේවස්ථානයක් බවට පත්කිරීම නීති විරෝධී ක්‍රියාවකි.

බෞද්ධ පූජනීය ස්ථාන ඉදිකිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක පාලන පුහුණුවේ පවා ගැටලු පහළ නොමැත. 1918 නොවැම්බර් 21 දින හා 1892 අංක 4 දරන බුද්ධශාසන ආඥාපනතය ප්‍රකාශ කිරීමේ පනතේ 16 වන වගන්තියෙන් එම බෞද්ධ අයිතිවාසිකම් තහවුරු කර තිබේ. එහෙත් බෞද්ධ නොවන ආගමික ස්ථාන ඉදිකිරීම සඳහා සංස්කෘතික අමාත්‍යාංශයෙන් බලපත්‍රයක් ලබාගත යුතු බව ගෙන්වා දී ඇත. ආගමික සාමයට බාධාවක් වන ආකාරයට, ආණ්ඩුවේ අවසරයක් නොමැතිව අන්‍යාගමික ආයතන පවත්වාගෙන යාම මේ අනුව නීති විරෝධී වෙයි.

අලුත් විහාරස්ථානයක් ලියාපදිංචි කිරීමට ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ හා ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශ වුවමනා කෙරේ. එම අනුමැතිය ලබාගැනීමට නම්, විහාරස්ථාන අතර ආරවුල් ඇති නොවන අයුරින් කටයුතු කළ යුතුය. නිර්දේශ ලබාදීමේදී හෙළුදූ ගම් පිළිබඳ විමසා නිශ්චයට පරිහානි නොවීම, බෞද්ධයන් අතර භේද ඇති නොවීම හා ප්‍රදේශයට හෝ බුදු පිළිමයකට සුදුසු පරිසරයක් වීම යන කරුණු ගැන සැලකිලිමත් විය යුතුය. බෞද්ධයන් වුවද තමන්ගේ අයිතිවාසිකම් භුක්ති විඳිම කළයුත්තේ අනුන්ට හිරිහැර නොවන ලෙසිනි. ගෞරවයකින් තොරව වෙළෙඳ සල් ඉදිරියේ බුදුපිළිම ප්‍රදර්ශනය කිරීම සඳහාවත්, ශාසනාරක්ෂක මණ්ඩලය ඉදිරියේදී ප්‍රාදේශීය ලේකම්වරයා මගින් එම නීතිය ක්‍රියාත්මක කළ යුතුය.

බෞද්ධ සිද්ධස්ථාන ඉදිකිරීමට නීතියෙන් අවසර තිබුණත්, බුද්ධ ශාසන අමාත්‍යාංශය ඒ පිළිබඳව නිශ්චිත විධි විධානයක් ඉදිරිපත් කර නොමැත. කිසිදු පිරිසක් ඒ සඳහා [illegible] කරගත යුතුය. අතිපූජ්‍ය මල්වතු මහානායකයන් විසින් 2008.10.15 දින බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා වෙත යවන ලද අංක 1539-26 දරන ලිපියෙහි [illegible] නව විහාරස්ථාන ඉදිකිරීම හා ලියාපදිංචි කිරීම ගැන නිර්දේශයක් දක්වේ.

"නව විහාරස්ථානයක් ඉදිකිරීමේදී සාමාජිකයන් දෙක සීමාව අනුමතය කිරීම සහ එකම ග්‍රාම නිලධාරී වසම තුළ විහාර දෙකක් ඇතිවීම වැළැක්වීම සඳහාත්, එවැනි සීමාවන් උල්ලංඝනය කරමින් ඉදිකොට ඇති විහාරස්ථාන ලියාපදිංචි නොකිරීමටත්, අවශ්‍ය පියවර ගන්නා ලෙසත්, තවද මෙම සීමාවන් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ශාසනාරක්ෂක බලමණ්ඩලද දැනුවත් කරන ලෙසත් දක්වයි.



බෞද්ධ සිද්ධස්ථාන ඉදිකිරීම සම්බන්ධ අතිපූජ්‍ය මල්වතු මහානාහිමියන්ගේ මෙම යෝජනාව සියලු නිකාය පාර්ශ්වයන් සාකච්ඡා කොට සම්මුතියකට එළඹීම අතා කාලෝචිතය.

නව ආගමික ස්ථානයක් ඉදිකිරීමේදී ඒ සම්බන්ධයෙන් බුද්ධශාසන අමාත්‍යාංශයෙන් අවසර ගත යුතු බව කියැවෙන චක්‍ර ලේඛනයක් එම අමාත්‍යාංශයේ ලේකම්වරයා 2011.09.02 දින ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිකුත් කොට ඇත. ලේකම්වරයාගේ අවසරය ලබාගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් තිබේ. පොලිස්පතිවරයා විසින් අංක 2154 -2009 හා 08-2009 යටතේ සියලු පොලිසිවලට යවන ලද චක්‍රලේඛනවල ආගමික ස්ථාන ඉදිකිරීමේදී ගතයුතු ක්‍රියාමාර්ග සඳහන් කොට ඇත. බුද්ධශාසන අමාත්‍යාංශ ලේකම්වරයා, ප්‍රාදේශීය ලේකම්වරයා හා බලප්‍රදේශය අයත් පළාත් පාලන ආයතනය මගින් ලබාදුන් අවසරයක් නොමැති නම්, අලුතෙන් ආගමික ගොඩනැගිල්ලක් ඉදිකිරීම තාවකාලිකව නතර කිරීමේ බලය පොලිසියට තිබේ. ඒ සඳහා විධිමත් අවසරයක් ලබාගන්නා ලෙස පොලිසිය උපදෙස් දෙනු ලැබේ. අවාසනාවකට මෙන් මෙම චක්‍රලේඛ ගැන ඇතැම් රජයේ නිලධාරීන්, ප්‍රාදේශීය සභාවන්ට සහ පොලිස් නිලධාරීන් අවබෝධයක් නොමැත. ඒ නිසා දිවයිනේ බොහෝ තැන්වල ආගමික ගැටුම් ඇතිවී තිබේ. එසේම ඇතැම් ආගමික ස්ථාන නීතියට පටහැනි බව තහවුරුව තිබියදීත් බලධාරීහු යම් යම් හේතු මත නිහඬව සිටිති. එවැනි අවස්ථාවල ඉහළ ආයතන මගින් නීතිය ක්‍රියාත්මක කරවා ගත යුතුය.

අලුතෙන් ආගමික ස්ථාන ඉදිකිරීමේදී සාමයට තර්ජනයක් වන අවස්ථා තිබේ. එම නිසා සියලු ආගමික නායකයන් සහභාගී කරවාගෙන පොදු සම්මුතියකට එළඹීම හා නිර්ණායක සැකසීම කෙරෙහි බුද්ධශාසන අමාත්‍යාංශයේ අවධානය යොමුවිනොට ඇත.

**පූජ්‍ය මැදගම ධම්මානන්ද හිමි**
අස්ගිරි මහා විහාරීය කාරක සංඝ සභික
සහ අනුශාසක - සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය



# භාවනා පන්තියේ ගැලවිජ්ජාවට හසු නොවන්නට නම්...!

භාවනාව සරල දෙයක් හැටියට ගිනිය නොහැක. ඝෝර සසරින් එතෙර වීමට අත්වැල සපයන්නක් සරල හැටියට සලකන්නේ නම් එය බරපතළ වරදකි. අද වැඩි දෙනා මේ ස්වයං වංචාවේ කොටස්කරුවෝ වෙති. භාවනා පන්ති, සෝවාන් ඵලයට පැමිණි සහතික පත්‍ර ආදිය පමණක් නොව තමන් සෝවාන්, සකෘදාගාමී ලෙස පොදු සමාජය තුළ හොඳීයට පවසන්නට තරම් භයානක තත්ත්වයකට වැටී තිබේ.

භාවනා කිරීම පුද්ගල යහපතට, ආධ්‍යාත්මික ගුණ වගාවට හා සසර කෙටිකර ගැනීමට මගක් වෙයි. නමුත් එය නිවැරදිව සිදු කිරීම භාවනා කරන කාගේ වුවද යහපතට හේතු වෙයි.

"කුසලාරම්මණේ චිත්තං භාවේතීති භාවනා" යනුවෙන් භාවනාව සඳහා බුදුරජාණන් වහන්සේ අර්ථකථනයෙන් ප්‍රකාශ කොට ඇත. "භාවේතීති භාවනා" යනුවෙන්ද මෙය ඇතැම් තැනක විස්තර වේ. එනම් වඩන බැවින්, දියුණු කරන බැවින්, වර්ධනය කරන බැවින් යන අරුත් දේ. මෙයම සර්ව සම්පූර්ණව කුසල් අරමුණක් තුළ සිත වැඩීම, භාවනාව හැටියට බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලදහ.


භාවනාව පිළිබඳ ඉතිහාසය බුද්ධෝත්පාද කාලයටත් එහාට දිව යන්නකි. ජාතක කතා පොත මෙයට හොඳ උදාහරණයකි. ජාතක පොත, ධම්මපදය, ධම්මපද අට්ඨකථාව ආදියේ බෝධිසත්වයන් වහන්සේ පසේ බුදුවරු අග්‍රමහා ශ්‍රාවක ශ්‍රාවිකාවෝ, තාපසවරු පිළිබඳව ඒ අය භාවනාවෙන් යන කළ ආකාරය පිළිබඳව තොරතුරු උකහා ගත හැකිවේ.

විශේෂයෙන් බුදුරජාණන් වහන්සේ පහළ වීමටත් පෙර ඉන්දියාවේ හිමාලය වැනි ස්ථාන ආශ්‍රිත කරගෙන භාවනා කරමින් ධ්‍යාන දක්වා පැමිණි තාපසයන්, සෘෂිවරුන් පිළිබඳ නොයෙක් විස්තර තිබේ. මේ අය ධ්‍යාන ලැබූ පසු ශිෂ්‍යයන් අතරට පැමිණ එම භාවනා ක්‍රම ඔවුන්ට කියා දී බොහෝ ශිෂ්‍යයන් සකස් කළ බව බුද්ධ දේශනාවේම ඇතැම් තැනක විස්තර වේ.

සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ සත්‍යය සොයා යන සමයේ උත්වහන්සේ තාපස ගුරුවරුන් දෙදෙනෙක් සමීපයේ භාවනාව පුහුණු කළහ. ඒ ආලාරකාලාම, උද්දකරාමපුත්ත යන ගුරුන්ය. මේ තාපසයන් දෙදෙනාම ඉතා උසස් ලෙස ධ්‍යාන සමාපත්ති ලැබූ අයය.

එසේම ශුද්ධෝදන රජතුමාගේ ගුරුවරයා වූ අසිත දේවල තාපසයාද, අරූපාවචර ධ්‍යාන සමාපත්ති ලැබූ අරූප ලොව උපදිනා තරමට වඩන ලද සිත් ඇති කෙනෙක් බව සඳහන් වේ. ඒ අනුව භාවනාව ඉතා දීර්ඝ ඉතිහාසයක් හා සම්බන්ධ වන බව පැහැදිලිය. නමුත් බුද්ධ ශාසනයේ භාවනාවත්, බාහිර ශාසනවල භාවනාවත් අතර යම් වෙනසක් පවතී. උදාහරණයක් හැටියට අදත් සමහර අය යෝගී භාවනා ක්‍රම අනුගමනය කරන බව ඉතා ප්‍රකට කාරණාවකි. එම යෝග භාවනා ක්‍රම හිමාලයේ වැඩ සිටි තාපසවරු අනුගමනය කරන ලද ඒවා හැටියට සැලකේ.

නමුත් භාවනා ක්‍රමයක් හැටියට බෞද්ධ භාවනා ක්‍රමයත්, යෝගී භාවනා ක්‍රමයත් ගත් කල මූලධර්ම අතරත්, අරමුණු වශයෙනුත් භාවනා ක්‍රමය වශයෙනුත් වෙනසක් පවතී. නමුත් මේ භාවනා ක්‍රම දෙකේ සම්බන්ධතාවක්ද නැතිවා නොවේ.



බුදුරජාණන් වහන්සේ සමථ භාවනා ක්‍රමය දේශනා කරන විට කම්ටහන් හතළිහක් දක්වා තිබේ. සෘෂිවරු පවා භාවනා කම්ටහන් හතළිහක් පිළිබඳව දැනුම් සහිතව සිටි බව තොරතුරු සොයා බැලීමේදී පෙනේ.

උදාහරණ හැටියට ආනාපානසතිය, කසිණ භාවනා, සතර බ්‍රහ්ම විහරණ භාවනා ආදී විවිධ භාවනා බුදුරජාණන් වහන්සේ පමණක් නොව පෙර සිටි තාපසයන් පවා වර්ධනය කළ ඒවා බව පෙනේ.

නමුත් මෙකැතින් එහා බුදුරජාණන් වහන්සේලා පමණක් දේශනා කරන භාවනා අපට වෙනමම සාකච්ඡා කළ හැකිය. භාවනාව ප්‍රධාන වශයෙන් ප්‍රභේද දෙකකි. එනම්,

1. සමථ භාවනාව.
2. විදර්ශනා භාවනාව.


සමථ භාවනා ක්‍රම බුද්ධ කාලයට පෙර පටන් පැවතියකි. එහි විශාල වෙනසක් පැවතියා යැයිද කිව නොහැක. නමුත් විදර්ශනා භාවනා ක්‍රමය බුදුරජාණන් වහන්සේලා විසින් අවබෝධයෙන්ම දේශනා කරනු ලබන්නකි. එය වෙනයම් කිසිම ශාසනයක (තාපසවරු/සෘෂිවරු/සම්පයෝ) හෝ දක්නට නොලැබෙන්නකි.

බෞද්ධයන් හැටියට කාගේත් අරමුණ කවද හෝ සංසාරික ජීවිතයෙන් අත්මිදීමය. එබැවින් බෞද්ධ පින්වතුන් තෝරා ගන්නා භාවනා ක්‍රමය සසර දුකින් මිදීමට හේතු වන්නක්ම විය යුතුය.


භාවනාව පිළිබඳ හැදෑරීමක් නොකළ අය භාවනාව වරදවා දේශනා කිරීම තුළින්ද කෙනෙකුට අගතියක් විය හැකිය. තමන්ගේ භාවනා අරමුණ කුමක්ද යන්න පිළිබඳවත් කෙනෙකුට අවබෝධයක් තිබිය යුතුය. එසේ නොවීමක් හානිදායක කාරණයක් වීමට ඉඩ ඇත.

පූජ්‍ය ඇරැව්වල සුධම්ම හිමි

"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය."



# සතර සතිපට්ඨානය මනාව වඩන්නාට නිවන අත ළඟය



දේශනාකරණ : ...
මහානායකයේ ... මහාවිහාර
පාර්ශ්වයේ ...
කාරක සංඝ සභික
පූජ්‍ය හිඹිබටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ
ධම්මංකර නේවාසික නායක
ස්වාමීන්ද්‍රයන් වහන්සේ

"ඒකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිදෙවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය, යදිදං චත්තාරො සතිපට්ඨානා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං."

**ආදී වශයෙන් බුදුරජාණන් වහන්සේ මහාසතිපට්ඨාන සූත්‍ර දේශනාවෙහි 'සතර සතිපට්ඨානය චිත්ත විශුද්ධිය හෙවත් පාරිශුද්ධිය පිණිස ද, ශෝකය හා වැලපීම සමනය පිණිස ද, කායික මානසික දුක් දොම්නස් දුරුකරලු පිණිස ද, ආර්ය අෂ්ටාංගික මාර්ගයට පැමිණ, නිවන අවබෝධ කරගැනීම පිණිස ද ඇති එකම මග' බව දේශනා කොට වදාළ සේක. 'ඒ සතර සතිපට්ඨානය නම්, කෙලෙස් තවන වීර්යය ඇතිව, මනා සිහිනුවණින් යුතුව, නොසිඳුණු සිහින්, කායික ජීවිතයේ හටගන්නා ... ලෝකස්වභාව ධර්ම කෙරෙහි ඇලීමත් ගැටීමත් නොමැතිව කායානුපස්සීව සිටීම ද, අනිත්‍යය වශයෙන් හටගන්නා ... ලෝකස්වභාව ධර්මතාවයන්හි ඇලීම ගැටීම දුරුකිරීම පිණිස වේදනානුපස්සීව සිටීම ද, අනිත්‍යය වශයෙන් හටගන්නා ... ලෝකස්වභාව ධර්මතාවයන්හි ඇලීම ගැටීම දුරුකිරීම පිණිස චිත්තානුපස්සීව සිටීම ද, කෙලෙස් තවන වීර්යය ඇතිව මනා සිහිනුවණින් නොසිඳුණු සිහින් කායික ධර්මයන් හටගන්නා ... ලෝකස්වභාව ධර්මයන්හි ඇලීම ගැටීම දුරුකිරීම පිණිස ධම්මානුපස්සීව සිටීම ද වේ.'**

පින්වත්නි,

හා... යවක් මාසය වශයෙන් සැලකෙන බක් මාසයෙහි යෙදෙන බක් පුරපසළොස්වක පොහෝ දිනය ලක්වැසි බෞද්ධයන්ට බුදුරජාණන් වහන්සේගේ මහාගුණ හද මනසට නංවන ඉතා සුවිශේෂී පුන් පොහෝ දිනයෙකි. මහා කාරුණික බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පස්වන වර්ෂයේදී නාගදීපයෙහි මහෝදර හා චූලෝදර නාරජුන් දෙදෙනා මිණිපළඟක් මුල්කොට ගෙන යුද්ධයකට එළඹී සිටිනු දිවැසින් දැක, ඔවුන් සමගි කරවා සෙත සලසා දෙනු වස් ලක්දිවට දෙවන වරට වැඩම කොට වදාළේ බක් පුරපසළොස්වක පොහෝ දිනයකයි. එහිදී අහසේ වැඩසිට සවණක් රැස්සඳින් සිටිලක ආලෝකමත් කොට, වදාළ ධර්ම දේශනාව ශ්‍රවණය කොට ප්‍රීතියට පත්වූ නාගයෝ යුද්ධය නතරකොට බුදුරජාණන් වහන්සේට වැඳ නමස්කාර කළාහුය. එසේ සතුටට පත් වූ නා රජුන් දෙදෙනා සටනට නිමිත්ත වූ මාහැඟි මිණිපළඟ බුදුරජාණන් වහන්සේට පූජා කළහ. එවිට තිලෝගුරු අමාබැණියන් වහන්සේ එම උතුම් මිණිපළඟේ වැඩසිට සාකච්ඡා...

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්, සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය, නොනැස්විය යුතුය."

ලටුකික, චන්දනාදි ජාතක කථාවන් මුල්කොට වෛරයෙහි දොස් දක්වා සමගියේ ඇති අනුසස් වදාළ සේක. එම දේශනාව අවසානයෙහි හා රජුන් දෙදෙනා ඇතුළු පිරිස තිසරණයෙහි හා ශීලයෙහි පිහිටුවා වදාළ සේක. මෙසේ පාරිභෝගික ධාතුවක් බවට පත් වූ මිණිපළඟ අනුළු හා රජුන් වෙසම පාරිදෙනා ලුදුව, එම පාරිභෝගික ධාතුන් වහන්සේ නිධන් කොට මුදුනේ පපස ලත් උතුරේ යාපන අර්ධද්වීපයේ නාගදීප නම් චෛත්‍යය ගොඩනැගුහ. බක්මස පුරපසළොස්වක පොහොය දිනය ශාසනික වශයෙන් මෙන්ම විශේෂයෙන්ම ලක්දිව බෞද්ධයනට ජාතික වශයෙන් ද වැදගත් වන මාසයකි. එම මාසයෙහි පැවැත්වෙන අලුත් අවුරුදු උත්සවය ජාතික උත්සවයක් වුවත් එහි ආගමික මුහුණුවරක් ද ගැබ් වී ඇත්තේය. එබැවින් සැදැහැවත් බෞද්ධයෝ නොනගතයේ දී හා අලුත් අවුරුද්ද ලැබූ පසු වෙහෙර විහාර කරා ගොස් සිරිතක් වශයෙන් ආගමික වතාවත්හි යෙදීමට අමතක නොකරති. විශේෂයෙන් මෙම වසරේදී සිංහල අලුත් අවුරුදු දිනයට පෙදී ඇති බක් පුරපසළොස්වක පොහෝ දිනයේ සිට නිවන විනිස හේතුවන සතර සතිපට්ඨානයෙහි නුවණින් යෙදීමට අදිටන් කරගනිමු.

මහා සතිපට්ඨාන සූත්‍ර දේශනාවේ පමණක් නොව, භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට වදාළ සූත්‍ර දේශනා බොහෝමයක භාවනා කිරීමේ අනුසස් හෙළිකර වදාළ සේක. සතර සතිපට්ඨානය ආදී භාවනාවන් තොපිරීමෙන් ජීවිතය පිළිබඳ අනුහැටිලි ඇතිකර ගෙනත යුතු බව බුද්ධ දේශනාවේ නොයෙක් තැනින් හෙළිකර ගත හැකිය. අපගේ පරම පැතුම නිවන් දැකීම නම් තොසිල්ව් සිතින් සතර සතිපට්ඨානය වැඩිය යුතුමය. නිවන වනාහි කෙලෙසුන්ගෙන් හා දුකෙන් නිස්ය. මරණය රහිතය. යළි ඉපදීමක් නැත. ශාන්තය. එය නිරෝධ සත්‍යයේ ස්වභාවයයි. එබැවින් නිවන මුල්කොට සියලු කුසල දහම් පිරිය යුතුය.

බුද්ධ ශාසනය පවත්නා කාලයක මිනිසත් බව ලබාගැනීම අතිශයින්ම දුර්ලභ වූවකි. එවැනි දුර්ලභ මිනිසත් බවක් ලැබූ අප නිවන පිණිස ඇති එකම මඟ ලෙස වදාළ සතර සතිපට්ඨානය භාවනාවක් සේ වැඩීමට උත්සුක විය යුතුමය. සතිපට්ඨාන භාවනාව තුළින් එය වඩන සැහැත්තාගේ පාරමිතා පූර්ණය හා පින්වල අනුව සතියකින් හෝ සති දෙකකින්, තෙමසකින්, සාරමසකින්, පස්මසකින් හෝ සමසකින්, වසරකින්, දෙවසරකින්, තෙවසරකින්, සිවුවසරකින්, පස්වසරකින්, සයවසරකින් හෝ සත්වසරකින් රහත් බවට හෝ අනාගාමී බවට හෝ පැමිණිය හැකි බවට බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ සේක. එබැවින් පින් සැබිති සත්පුරුෂයන් සැම සියලු දෙනාම කාලය ගැන නොසිතා කෙලෙස් නවන වීරියය ඇතිව, සිහිනුවණින්, නොසිල්ව් සිතින් සතර සතිපට්ඨානය භාවනා කළ හොත් ලැබිය හැකි අග්‍රඵලය නිවනමැයි.

මහනුවර ප්‍රාශය වන විට ලක්දිව යටපත්ව තිබූ සතිපට්ඨාන භාවනා ක්‍රම පහලත් තුළ සැඟවී තිබූ මැණිකක් සේ යළි මතු කොට පුචලිත කළේ, වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමියන් වහන්සේ විසිනි. උන්වහන්සේ මහත් අසීරුවෙන් මෙම භාවනා ක්‍රමය දැන උගෙන වැඩූහ. ඉන්පසු වර්තමානය දක්වා තමවහන් ලබාදෙන බොහෝ ධර්මාචාර්යවරු සතර සතිපට්ඨානය භාවනා ක්‍රමයක් වශයෙන් විවිධාකාරයෙන් පුහුණු කරවති. සතිපට්ඨාන භාවනාව විදර්ශනා භාවනාවකි. සිත බැහැරට යා නොදී සිහිය මැනවින් තිබ්බවා සමතය කරවා ගැනීම මෙහි අපේක්ෂාවයි. කාය චිත්ත වේදනාදියෙන් සිත බැඳ තබන්නේ සිහියයි. සතිපට්ඨාන භාවනාවෙන් සිතෙහි සිහිය මනාව පවත්වා සමාධි ප්‍රඥා දියුණු කිරීමට උත්සාහවත් විය යුතු වේ. එවිට නිවන අත ළඟය.

මෙම භාවනාව දිනපතා ජීවිතයේ සෑම කටයුත්තකදීම පුරුදු පුහුණු කළ හැකි භාවනාවකි. ඒ සඳහා ගිහියන් නම් තිසරණ සරණකහි ශ්‍රද්ධාවෙන් පිහිටා පන්සිල්, අටසිල්, දසසිල් ආදිය මැනවින් රැකිය යුතුය. බුදුගුණය මෙනෙහි කරමින් මෛත්‍රීය වඩාගැනීම ද අගනේය. සතිපට්ඨානය සඳහා බලවත් අධිෂ්ඨානයක් ඇතිකර ගත යුතුය. වීරියය කළ යුතුය. උතුම් නිවන ලබීමයි යන පරම පටිපදා අරමුණින්ම මෙම භාවනාව පුහුණු කළ යුතුය. සතර සතිපට්ඨාන භාවනාව නිසි ලෙස වඩන්නේ නම් සිතේ සතිය මනාව පිහිටුවාගෙන සිහි නුවණින් යුක්තව දෛනික ජීවිතයේ සෑම දෙයක්ම සිදුකළ හැකිය.

කායානුපස්සනාව වැඩීමේ දී කායික ස්වභාවය නොසිල්ව් සිතින් දකිමින්, නොසිල්ව් සිහියෙන් ආශ්වාස ප්‍රශ්වාස මනාව සිදුකරමින්, සිතේ සතිය මනාව පිහිටුවා, සිහි නුවණින් කාමරූපයන්ගේ ඇති අනිත්‍යතාවය පිළිබඳව දර්ශනය දැකීමට වෑයම් කළ යුතුය. ඒ සඳහා ආශ්වාස ප්‍රශ්වාස කිරීම් ආදී කායයන් සිදුකෙරෙන සියලු ක්‍රියාවන් සම්බන්ධයෙන් සිහියෙන් යුතුව බැලිය යුතුය. එවිට කායෙහි අසාරය, අසුභය, අනිත්‍යතාවය මනාව වටහාගත හැකිය. එසේ නොමැතිව කායානුපස්සනාව වැඩීම අසීරුය. රූපයේ අනිත්‍යතාව මනාව වටහා ගැනීමට රූපය මුල්කොට කායානුපස්සනාව වැඩීම අවශ්‍ය වේ. එහිදී 'මගේ' සිතා අල්ලා ගැනීමක් සිදු නොවේ.



එවිට කයෙහි ඇතිවීම, නැතිවීම පිළිබඳව වූ කායික ස්වභාවය විදර්ශනා සිතින් දැකීමට හැකිවන්නේය.

වේදනානුපස්සනාව ද නොසිල්ව් සිතින් සිදුකළ යුතුය. එවිට සැප වේදනා සඤ්ඤා විරහිතව දැඩි ආශාවන්ගෙන් අල්ලා නොගෙන සිටීමට හැකිවේ. දුක් වේදනාව ද දුකක් බව මනාව දැනගත හොත් එයින් මිදීම පහසු වේ. මේ සඳහා උපේක්ෂා සහගත සිත දියුණු කර ගත යුතුය.


චිත්තානුපස්සනාවේ දී දිනපතා ජීවිතයේ කටයුතුවල දී ඇසට, කනට, නාසයට, දිවට, කයට, සිතට යන සදොරට එළඹ සිටින සියලුම අරමුණුත්, ඒ සදොරින්ම උපදවන චිත්ත චෛතසිකයනුත් නුවණින් යුතුවම බැලිය යුතුය. සිහිනුවණ වැඩෙන විට මේ දොරටු සයෙහි ගැටෙන අරමුණු හා උපදින සිතිවිලි දක්නට ලැබේ. මෙසේ එන සෑම සිතුවිල්ලක් ගැනම නුවණින් පිරිසිඳ දැනගැනීමට චිත්තානුපස්සනාව නොසිල්ව් සිතින් වැඩිය යුතුය. මෙසේ සිතේ පහළ වන නොයෙක් සිතුවිලි ගැන චිත්තානුපස්සනාවෙන් සිහි නුවණින් බලා පිරිසිඳ දැන ගැනීමෙන් නාගා අරමුණු කරා සිත ඇදී යාමට ඉඩ නොදී රැකගත හැකිය. රාග විරාගී කටර සිතුවිල්ලක් වුවද එයට ඇලුම් නොකර, නොඇලී විදසුන් සිතින් මනාව සිත සතියෙහි පිහිටුවා ගත හැකිය.

ධම්මානුපස්සනාවේ දී නීවරණ ධර්මයන් ප්‍රහාණය කිරීමට යත්න දැරිය යුතුය. එහිදී කාමවස්තූන් කෙරෙහි ඇතිවන ආශාව නම් වූ කාමච්ඡන්දය, සිත වෙනස් බවට පත් කෙරෙන ක්‍රෝධය, ද්වේෂය, තරහව, පටිඝය ආදී ව්‍යාපාදය, සිතෙහි අලස බව හා චෛතසිකයන්ගේ මැලි බව නම් වූ ථීනමිද්ධය, සිතෙහි නොසන්සුන්තම හා චංචල ගතිය ඇති කෙරෙන උද්ධච්චකුක්කුච්චය, සැකය හා දෙගිඩියාව නම් වූ විචිකිච්ඡාව ධම්මානුපස්සනාවේ දී ප්‍රහීණ කිරීමට හැකිවේ.

සතිපට්ඨානයෙහි මැනවින් පිහිටීමෙන් සිත කෙලෙස්වලට නොඇලීමේ අරමුණු තුළින් ඒ සෝවාන් ආදී මාර්ගඵලයන්ට පැමිණීමට හැකිවන යේ සඳාගය දියුණු වේ. සඳාගය දියුණු වූ විට ශ්‍රද්ධා, වීරිය, සති, සමාධි, ප්‍රඥා යන ඉන්ද්‍රියන් සමසේ දියුණු වේ. එවිට ලෝකෝත්තර මාර්ගයට පිවිස නිවන් දැකීමට මඟ පෙළඹවන්නේය. සෝවාන් මාර්ග යට පිවිසි විට සිහිකරමින් සිටි සංස්කාරයන් සිඳී ගියාක් මෙන් දැනෙයි. මහා ඔරසින් සිඳහස් වූවා ලෙස ද හැඟෙයි. අඳුරෙන් එළියට ආවා සේ පෙනේ. සමාධි සඳාග තව තවත් දියුණු වූ විට සෝවාන් ඵලයට පැමිණෙයි. සෝවාන් ඵලයට පැමිණි පසු කෙමෙන් ඉහතුත් මාර්ගඵලයන්ට පැමිණීම සඳහා උත්සාහය ඇතිකර ගනී. පෙර පාරමිතා බල ඇති අයට මාර්ගඵල ලාභය පහසු වේ. සෝවාන් ඵලයට පැමිණි සැහැත්තාට සකෘදාගාමී මාර්ගයට පිවිසීම පහසු වුවත් අනාගාමී මාර්ගයට පිවිසිය හැක්කේ ඉතා අපහසුවෙන් උත්සාහ කළ හොත් පමණි. ඒ සඳහා සමාධිය සම්පූර්ණයෙන්ම සපුරාගත යුතුය. අර්හත් මාර්ගයට පිවිසීමට සියලු කෙලෙසුන් ප්‍රහීණ කොට සමාධි ප්‍රඥාව මැනවින් වැඩිය යුතු බව ධර්මයට අනුව සිතාගත හැකිය. අපිද සිහි කමටහන් ලබා සතර සතිපට්ඨානය වැනි උතුම් භාවනා ක්‍රමයක් පුහුණු කිරීමට අදිටන් කරගනිමු.

හොරවත් සරණනි.

"සිත් සතුටු ... "



# පිරිණිවන් පෑමට පෙර යශෝධරා තෙරණියෝ

# බුදුන් හමුවේ කළ අවසන් පාපොච්චාරණයයි මේ...!

යශෝධරා දේවිය ගැන නොදන්නා බෞද්ධයෙක් සිටිය නොහැක. ඇය අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගිහිව සිටි කාලයේ ඔහුගේ බිසවිය. බුදුරජාණන් වහන්සේගේ එකම පුතු රාහුල කුමාරයාගේ මෑණියෝය. ඇයගේ පියාණන් වූයේ සුප්‍රබුද්ධ රජතුමාය. මව වූයේ අමිතා බිසවිය. සොහොයුරා දේවදත්තය. බුදුන් උපන් මොහොතේම උපත ලද යශෝධරා මුලින් හැඳින්වූයේ බිම්බා දේවිය නමිනි. ඒ ඇය බිම්බ රූපයක් මෙන් අතිශය රූපසම්පන්න වූ නිසාය. පසුව ඇය යශෝධරා නමින් හැඳින්විය. ඒ ඇය සය අනුලක්ෂණයෙන් කාන්තාවන්ගේ අග්‍රස්ථිය දරූ නිසාය. යශෝධරා යනු යස පිරිවර දරන්නී යන අදහසයි. රහත් වූ පසු ඇය භද්දකච්චානා තෙරණිය විය. යශෝධරා දහසය වියේදී සිදුහත් කුමරුගේ බිසව වූ



අතර 29 වියේදී ඇය රාහුල කුමරා බිහි කළාය. එදිනම සිදුහත් කුමරුන් බුදු බව පතා අභිනිෂ්ක්‍රමණය කළ බැවින් ඇයද තපසට යාමට උත්සාහ ගත්තාය. එහෙත් සුද්ධෝදන රජතුමා එම අදහසට එරෙහිව කරුණු දක්වා ඇයට බිහිසෙය හැර යා නොහැකි වන සේ මුරකාවල්ද ද ඇයව මහත් සෙනෙහසින් රැකබලා ගත්තේය. සිදුහත් කුමරු සිය මග යා නොහැකි බව දැනගත් යශෝධරා සිදුහත් කුමරු හිස මුඩු ගෑ බව අසා ඇයද හිස මුඩු ගෑවාය. කසා වත අඳින බව අසා ඇයද කසාවත් ඇන්දය. පාත්‍රයේ වළඳන බව අසා ඇයද පාත්‍රයේ වළඳන්නට පටන් ගත්තාය. එක වේලක් වළඳන බව අසා එක වේලක් ආහාර ගත්තාය. උච්චාසයන මහාසයනයෙන් ඇයද වැළකුණාය. සත අවුරුද්දක් සිදුහත් කුමරු නැති සොවින් අතුරාගී වේදනාවක් විඳිද්ද ඇය බුදුන් බුදු වී සත් වසරකට පසු කිඹුල්වත් පුර වැඩිද වහා දුවගොස් බුදුන් දෙපා වැළඳ ගෙන දුක තුනී වනතුරුම හඬා වැළපුණාය. පසුකලක ඇය බුදුන් වෙත ගොස් පැවිදි වී අවසානයේ රහත් වූවාය. 78 වසරක ආයු කාලයකින් පසු ඇය බුදුරජාණන් වහන්සේට පෙර පිරිනිවන් පෑ යුතු යයි සිතා බුදුන් වෙත ගොස් ඒ සඳහා අවසර ලබාගෙන එදිනම පිරිනිවන් පෑවාය. මේ යශෝධරා ගැන කෙටි හැඳින්වීමයි.

යශෝධරා හෙවත් භද්දකච්චානා තෙරණිය පිරිනිවන් පෑමට පෙර ප්‍රකාශයක් කළාය. යශෝධරා ගැන දන්නා ඔබ මේ විශේෂ ප්‍රකාශය කුමක්දැයි නොදන්නවා විය හැකිය. පාපොච්චාරණය යනු තමන් අතින් සිදුවූ වැරදි අනුන් ඉදිරියේ හෙළිකිරීමයි. මෙය අද බොහෝවිට අපන්නට දකින්නට ලැබෙන්නේ පොලිස් හෝ ආරක්ෂක හමුදාවන් අතරට සැකකරුවකු පත්වූ විට කරන හෙළිදරව්වක් වශයෙනි. යශෝධරාවගේ පාපොච්චාරණය එසේ වූවක් නොවේ. ඇය වසර 78ක් ආයු වළඳා සිටින විට මෙවැනි සිතිවිල්ලක් පහළ විය. මා දැන් සැත්තෑ අටවැනි වියෙය. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන්නට පෙර සැරියුත් මුගලන් අගසව් දෙදෙනා පිරිනිවන් පෑ සේක. මහා ප්‍රජාපතිය පිරිනිවන් පෑවාය. රාහුල සහ නන්ද දෙදෙනාද පිරිනිවන් පෑවෝය. මාද එසේම බුදුරජාණන් වහන්සේට ප්‍රථම පිරිනිවන් පෑ යුතුය යන්නය. මේ සිතිවිල්ල ඇතිවූ දිනම ඇය බුදුරජාණන් වහන්සේ හමුවී ඒ බව සැලකර සිටියාය. බුදුරජාණන් වහන්සේ එය අනුමත කර පිරිනිවන් පෑමට පෙර ඇයට පෙළහර පාන ලෙසට අණ කළාය. එදිනම රාත්‍රියේ පෙළහර පා පිරිනිවන් පෑමට පෙර ලක්ෂ සංඛ්‍යාත ජන ජනයා ඉදිරියේ බුදුරජාණන් වහන්සේ වැඳ නමස්කාර කර පෙර භවයන්හිදී බෝධිසත්වයන්ගේ පෙර ආත්මවල බිරිඳ වශයෙන් සිටියදී ඇය අතින් සිදු වූ අතපසුවීම් පිළිබඳව ප්‍රකාශ කර ඇය අතින් යම් වැරැද්දක් සිදුවුණි නම් ඒවාට සමාවන ලෙස ඉල්ලා මෙසේ ප්‍රකාශ කර සිටියාය.

"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් මිදුණු සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."

"භාග්‍යවතුන් වහන්ස, මා දුන් අට සැත්තෑ විසේ පළමුවෙනි, එමනිසා ජරා දුක් පීඩාවන්ට ලක්වීමට පෙර මා පිරිනිවන් පෑ යුතු බවට අධිෂ්ඨාන කර ගතිමි. මේ සසර සංසාරයේ අනන්ත අප්‍රමාණ වාරයක් මා ඔබ වහන්සේගේ ශ්‍රී භාර්යාව වූයෙමි. ඒ සෑම අවස්ථාවකදීම මා ඔබ වහන්සේගේ සෙවණැල්ල මෙන් ඔබ වහන්සේ පසුපස සිටියෙමි. නිරන්තරයෙන්ම පතිව්‍රතා රකිමින් සිහරුවා ඔබවහන්සේගේ ඒකායන බලාපොරොත්තුව වූ ලොව්තුරා බුද්ධත්වය ලබා ගැනීමට පූරණය කළ පාරමිතාවන් පුරවා ගැනීමට මම හැම උපකාරයක්ම දුන්නෙමි. එනමුත් ස්ත්‍රී ජාතියටම ආවේණික වූ ලාමකකම මටද උරුම වී තිබිණි. ඒ නිසාම මා අතින්ද අති උත්තම වූ ඔබවහන්සේට නොයෙකුත් නොකිසිලිකම්, අඩුපාඩු, අකටයුතු සිදුවන්නට ඇත. ඒ සියල්ලම මා සිතාමතා කළ කී දෑ නොවන බව මේ වේලාවෙහි අවධාරණය කරනු කැමැත්තෙමි. එසේ මිදුනෙමි. අකටයුතුකම් බොහොමයක් සිදුවූයේ ඔබවහන්සේ කෙරෙහි වූ අප්‍රමාණ ආදරය නිසාවෙනි. එසේ මා රාජලීලාවෙන් අභාසර වූ, විසමින් වූ ඔබවහන්සේගේ බිසව වූ ප්‍රථමවරිය වූවාය. එද මා ඔබවහන්සේට කළ නින්ද අපහාස අවිලාද අනන්තය, අප්‍රමාණය. තිබිණි නැත. ඇත් ගාලේ, අස් ගාලේ සැලකී සිට මා අට ඇත්, අස්, බෙට්ටෙලින් සහා එළිය කළ විට මා ඔබට බැණ වැදුණෙමි. මිදුලේ පොකුණෙහි සැරැති සිට මා අත ඇල්ලී කල මා ඔබට වියාලී පත්කෙනෙකුයි නින්ද කළෙමි. ඔබ අප නිරිලෙයෙහි වතුර අදිමින්, අතුගාමින්, දර පලමින්, කෑම පිසිමින්, බැට මෙහෙකම් කරමින්, දුක දුක් විඳිනා විට මා මාලිගාවෙහි රජ සැප විඳින්දෙමි. ඔබගේ දැහින් පිදු රජ බොජුන් මා වෙත ගෙන ආ විට මා ඒවා ප්‍රතික්ෂේප කළෙමි. ජීවයින්ම මබට දුක ගෙන, අපහාස කළෙමි. භාග්‍යවත් බුදුරජාණන් වහන්ස... මේ සියල්ල මා හිතාමතා කළ කී දේ නොවේ. ලාමක වූ ස්ත්‍රියක් අතින් මේ සිදුවූ වැරදිය... එහෙත් ස්වාමීනී... ඔබවහන්සේට දාන පාරමිතා පිරීමට ඒ සියල්ල මහෝපකාරී වූවා නිසාය.

විවාහ වූ පසුවද මා ඔබවහන්සේ හැරදා මාගේ දෙමව්පියන් වෙත ගියෙමි. මා වසින් අනන්ත වූ අවිලාද, අපවාද නොකිසිලිකම් කරද්දීත් ඔබවහන්සේ අන් ස්ත්‍රියක් නොපතා මාවම පතා සිටීමෙන් ඔබවහන්සේගේ සීල පාරමිතාව සාක්ෂාත් විය. මා ලබාගැනීම සඳහා පොරයෙහි නොයෙක් කර්මාන්තයන්හි යෙදීමෙන් ප්‍රඥා පාරමිතාව සාක්ෂාත් විය. මා පතා අනන්ත විඳි දුක් කරදර පීඩාවන්ට මුහුණ දීමෙන් වීර්යය පාරමිතාව සාක්ෂාත් විය. මේ සියල්ල ඉවසා මා හට ඇම මල් රෝගුවක තරමින් හෝ කෙවර, අකුරු නොකර සිටීමෙන් ක්ෂාන්ති පාරමිතාව සාක්ෂාත් විය. මා හැර අන්‍ය කිසිවකු නොපතා මාවම පතා සිටීමෙන් අධිෂ්ඨාන පාරමිතාව සාක්ෂාත් විය. මා පතා ආ රාජ්‍ය තාපසයින් සත් දෙනාට අතුරුව නොකර සිටීමෙන් ශක්ති පාරමිතාව සාක්ෂාත් විය. මේ සියල්ල දෙස උපේක්ෂාවෙන් බලා සිටීමෙන් උපේක්ෂා පාරමිතාව සාක්ෂාත් විය. භාග්‍යවත් බුදුරජාණන් වහන්ස... පතිව්‍රතා ලෙස මාගේ මෙම නොමනා හැසිරීමෙන් පවා ඔබවහන්සේගේ ලොව්තුරා බුද්ධත්වයට පත්වීමේ උදාර පරමාර්ථයට සහයෝගයක් වූ බැවින් මා අත වරද නැත. ඒ නැවත ඒ සියල්ල ජයගත මාගේ ආදරය දීනා මා අත්හළ කරුණ කළ.

"යා ඉමං රත්නා අනිත්සන්තරා භා ඔබා දේව සුනා වීතා
වන්නේද මන් සිරසා පාදෙ මයමි කුරුසා රංච සහා"

යනුවෙන් ඔබ දෙපා වැඳ මා වද කළාවා ගත් මා අත වරද නැත...

භාග්‍යවතුන් වහන්ස චන්ද්‍රකින්නර ජාතකයේදී මම ඔබ වහන්සේගේ දයාබර භාර්යාව වූයෙමි. ඔබ වහන්සේ අපගේ කුළුදුල් දරුවා මිහි වන්නට සිටියේම තපස් රැකීම සඳහා මා අකාලයේ යකහුට පුදනාම වූ විට කුසා කුසා ගතෙනී දරුවා මිහිපිට ලෙස ඉල්ලා ඔබ ඔබට වලකාලන ලදී. දරුවා මිහිපිට පසු දරුවා ඔත් සත පුරා සිටින ලෙස ඇවිටිලි කර ඒ තමන වැළැක්වූයෙමි. ලබයාට ඔත් කැටු පසු මහ නොවිත නෙක් සිටින ලෙස ඉල්ලා තමන වැළැක්වූයෙමි. අවසානයේ ඔබවහන්සේ නොදන්වාම තපසට ගියේය. එහෙත් ස්වාමීනී, ඒ සියල්ල සිදුවූයේ ඔබවහන්සේගේ නෙක්ඛම්ම පාරමිතාව උදෙසා බැවින් මා අත වරද නැත.

භාග්‍යවතුන් වහන්ස, කුම්භකාර ජාතකයේද මා ඔබවහන්සේගේ දයාබර බිරිඳ වූවාය. එකල ඔබවහන්සේ හා මා පසේ බුදුවරයකුගේ ධර්ම දේශනාවක් ඇසීමෙන් පසු අප දෙදෙනාටම පැවිදි වීමට සිතිය. ඔබවහන්සේ පළමුව පැවිදි වීමට ගත් උත්සාහය මා එද වළකා මා හට පළමුව පැවිදි වීමට අවසර විය. ඔබවහන්සේ ඒ සඳහා අවසර නොදුන් කල මා වතුර කළයක් ගෙන එන ලෙස අප බිලිඳා ඇලාගන්නා ලෙස කියා මිදුලා ඔබ අතට දී ඔබ මුලාකර ගෙන් මා කලින් පැවිදි වූවාය. බුදුරජාණන් වහන්ස... ඒ මාගේ විශාල අතිකාවකි.



ඔබවහන්සේ නැතිකර ඇමති දුලගයින්ටද නිසා නොව මේ සංසාර සාගරයේ සසර කෙටි කරගැනීම සඳහා මා තුළ තිබූ අභිලාෂය නිසාය. එනිසා එද මා ඔබට ලෙහි නොවූ බැවින් මා අත වරද නැත.


භාග්‍යවත් බුදුරජාණන් වහන්ස... අනන්තර ජාතකයෙහි මා චිරකාලයක් මහ රජතුමාගේ බිසවද උපත ලබා සිටියෙමි. තාපස නායකයකු වූ ඔබවහන්සේ සමග ගෝල තාපසයින් 500ක් සමග අප රාජ උයනේ නාවතාවේ පෙදෙසේය. ඔබ වහන්සේගේ සිල්වත් භාවය ගැන විශ්වාස කළ සත්දෙව් රජ ඔබවහන්සේ එළවා දැමීම සඳහා කුමන්ත්‍රණයක් දියත් කළේය. ඒ අනුව රාජ්‍ය අම උයනෙහි ඇති අනන්තර අම ගසෙහි අනන්තර අම කෑ විට උපදින කුමාරයා සන්නිවි රජවන බව පවසා මා මුලා කළේය. මා අනන්තර අම කෑමට දෙළක් උපන් බව රජතුමාට දන්වූ විට සේවකයින් අම සොයා යන අතරේ සත්දෙව් රජ අම සියල්ල කඩා ඉවත් කිරීමට රහසිගතව කටයුතු යොදා තිබී ඇත. රාජ්‍ය අම උයනේ අඹවලට සිදුවූයේ කුමන්ත්‍රණ රජතුමා සොයා බලූ විට සේවකයින් රජතුමාට පවසා සිටියේ මාගේ උපායෙන්ම මහ තා තාපසතුමා ඇතුළු තාපසවරුන් අම කා විනාශ කර ඇති බවය. උරණ වූ රජතුමා ඔබවහන්සේ ඇතුළු සියලු තාපසවරුන් රාජ්‍ය අම උයනෙන් එළවා දැමුවේය. මේ සියල්ල සිදුවූයේ සත්දෙව් රජුගේ කුට කුමන්ත්‍රණය නිසා මා අත වරද නැත.

එසේම ස්වාමීනී... මා ඔබවහන්සේගේ බිසව නොවූ අවස්ථාද සසරෙහි තිබිණි. මා ඉපදීමට ප්‍රථම කළ අනන්තර ජාතකයේ මෙන්ම සුමිත බ්‍රාහ්මණීද මාගේ ස්වාමී පුරුෂයා වූයේ ඔබවහන්සේ නොව වෙනත් රජවරුන්ය. ස්වාමීන් වහන්ස... ඒ මා ඔබවහන්සේට අකමැති නිසා හෝ ලෙහි විමක් නිසා සිදුවීමක් නොව සංසාර සාගරයේ හැටිය. එනිසා එවිටද මා අතින් වරදක් සිදුවූයේ නැත.

භාග්‍යවත් බුදුරජාණන් වහන්ස, මෙම වර්තමාන භවයේදීද මා අතින් ඔබ වහන්සේට කිසිදු වරදක් සිදුනොවුණු බව මට විශ්වාසය. එනිසා මේ භවයේදී හෝ සංසාර සාගරයේදී මා අතින් අමනාප වේනුවක් හරමී හෝ වරදක් වූවා නම් මට අවසාන වරට සමාව දී අද මධ්‍යම රාත්‍රියේදී පිරිනිවන් පෑමට අවසර දෙන ලෙස ඔබවහන්සේගේ ශ්‍රී පාදය නමස්කාර කර ඉල්ලා සිටිමි."

මෙම යසෝධරාණියගෙන් පසු සම්මා සම්බුදුරජාණන් වහන්සේ එදින රාත්‍රියේදී ප්‍රාතිහාර්යය පෙළපාලන් හා අනතුරුව පිරිනිවන් පෑමට ඇයට අවසර දුන් සේක.

වෛද්‍ය ප්‍රියන්ත හේවගේ



අග්ගඤ්ඤ සූත්‍රයෙන් හෙළිවන සමාජ දැක්ම

# වඩා ලොකු කුලය ධනය ද?

දීඝ නිකායේ ඇතුළත් අග්ගඤ්ඤ සූත්‍රය අප කවුරුත් දන්නා සූත්‍රයකි. එයින් ඉදිරිපත් වන්නේ ලෝක සම්භවය පිළිබඳ බෞද්ධ විග්‍රහ හා සමාජ සංස්ථාපනය පිළිබඳ විග්‍රහයයි. මෙහි ඉදිරිපත් වන සංකල්පයන් නූතන සමාජය සමඟ නව දෘෂ්ටිකෝණයකින් විග්‍රහ කිරීම මෙහි දී අපගේ අරමුණයි.

● **කුල ක්‍රමය**

සූත්‍ර ආරම්භයෙහිම සඳහන් කුල ක්‍රමය පිළිබඳ බෞද්ධ විග්‍රහ මෙතැන් සිට විමසා බැලීමු. බුදුරජාණන් වහන්සේ මෙම සූත්‍රය දේශනා කරන්නේ පැවිදි බව අපේක්ෂාවෙන් සිටි වාසෙට්ඨ හා භාරද්වාජ නම් බමුණන්ටයි. ඒ වන විට සමාජයේ කුල ක්‍රමය තදින්ම ක්‍රියාත්මක වූ අතර බ්‍රාහ්මණ කුලයට අයත් පිරිස බුදු සසුනෙන් පැවිදි වීම ඉතා පහත් ක්‍රියාවක් ලෙස ඔවුහු සැලකූහ.

බුදුරජාණන් වහන්සේ එළිමහනෙහි සක්මන් කරමින් සිටින අවස්ථාවක එහි පැමිණෙන වාසෙට්ඨ හා භාරද්වාජ බමුණන් තමා බුදු සසුනෙහි පැවිදි වීමට කැමති බව පවසයි. එවිට බුදුරජාණන් වහන්සේ එකල භික්ෂු සමාජ පිළිගැනීම පිළිබඳ සලකා බලමින් වාසෙට්ඨ හා භාරද්වාජගෙන් මෙසේ ප්‍රශ්නයක් අසයි.

"වාසෙට්ඨය, ඔබලා උසස් යැයි සම්මත බ්‍රාහ්මණ කුලයට අයත් වූවන්ය. ඔබ වැනි අය මාගේ සසුනෙහි පැවිදි වීම පිළිබඳ බමුණන්ගේ ඇත්තේ බලවත් විරෝධයකි. ඔබලා මාගේ සසුනෙහි පැවිදි වුවහොත් එය ඔවුන්ගේ දැඩි විරෝධයට, කලකිරීමට හා පරිභවයට හේතු නොවන්නේද?"

එවිට වාසෙට්ඨ:

"ස්වාමීනි, එය එසේය. බමුණෝ කියනුයේ ඔවුන් මහා බ්‍රහ්මයාගේ මුඛයෙන් උපන් ඖරස පුත්‍රයන් බවත් ඉතා පිරිසිදු බවත් අනෙක් අය අපිරිසිදු හා පහත් බවත්ය. විශේෂයෙන් ඔවුන් ශ්‍රමණයන්ට කැමති නැත. පිළිකුල් කරයි. එබැවින් අපි ඔබ වහන්සේ සසුනෙහි පැවිදිවීම පිළිබඳ ඔවුන්ගේ ඇත්තේ දැඩි පිළිකුලකි, විරෝධයකි. එය නැවැත්වීමට නොහැක. එය ඔවුන් සත්‍ය නොදන්නා අන්ධ භක්තිකයන් පිරිසක් වීමය."

එවිට බුදුරජාණන් වහන්සේ,

"වාසෙට්ඨය, එය එසේය. ඔවුන් තුළ ඇත්තේ වැරදි අදහසකි. කිසිවෙක් මහා බ්‍රහ්මයාගේ මුවින් ඉපදී නැත. බමුණන් නිසා ගැබ්ගත් බැමිණියන් දක්නට ලැබේ. දරුවන් ප්‍රසූත කරන බැමිණියන් ඇත. දරුවන්ට කිරිපොවන බැමිණියන් ඇත. එසේ නම් මහා බ්‍රහ්මයාගේ මුවින් උපන්නේ යැයි කීම අසත්‍යයක් නොවේද? බමුණන්ගේ ඉපදීම සෙසු අයගේ මෙන් සාමාන්‍ය වූවකි. එබැවින් බමුණු කුලයේ උපන් අයෙකු වුවද පරපණ නසන්නේ නම්, සොරකම් කරන්නේ නම් කාමයේ වරදවා හැසිරෙන්නේ නම් බොරු කියන්නේ නම් රාමෙර පානය කරන්නේ නම් ඔහුගේ උසස් බවින් , කුලයෙන් ඇති ප්‍රයෝජන කවරේද? ඔහු පහත් අයෙකුම වන්නේය.

මෙයින් පැහැදිලි වන්නේ කෙනෙකුගේ උසස් භාවය රඳා පවතිනුයේ ධනය, කුලය බලය මත නොව සිල්වත්කම හා ගුණවත්කම

"වෛර සහිතව ජීවත් වන මිනිසුන් අතුරෙහි වෛර රහිතව ඒකාන්තයෙන්ම සුවසේ ජීවත් වන්න. වෛරී මිනිසුන් මැද අවෛරීව ජීවත් වන්න."

මෙන්ම ඊට සරිලන බුද්ධියකින් යුක්ත වූ වීට බවයි. වාසෙට්ඨ හා භාරද්වාජ බුද්ධිමත් දෙදෙනෙකි. තම පිරිසගේ දෘෂ්ටි විරෝධය මධ්‍යයේ වුවද ඔවුන් තෝරාගන්නේ නිවැරදි මාර්ගයකි. එය බුද්ධිමතුන්ගේ ප්‍රශංසාවට ලක් වූවකි. ධනය, කුලය , බලය මත පදනම්ව වැරදි දේවල් කරන්නේ නම් එහි ඇත්තේ තාවකාලික ආස්වාදයකි. කවද හෝ තමා වැරදි ලෙස යෙදවූ දෙයෙහි අයහපත් ප්‍රතිඵල තමාට විඳීමට සිදුවේ. එය විශ්වයේ ඇති සනාතන ධර්මයයි.


පැවිදි වීම යනු උසස්ම කැපවීමකි. පරිත්‍යාගයකි. සම්බුද්ධ සසුනෙහි කුමන සමාජ මට්ටමකින් පැවිදි වූ අයෙකුට වුවද ඇත්තේ සම අයිතිවාසිකමකි. එනම් සියලු දෙනාම 'ශාක්‍යපුත්‍රීය ශ්‍රමණ' හෙවත් 'බුදුරජාණන් වහන්සේ ඕරස පුත්‍රයන්' යන නාමයෙන් හඳුන්වයි. සෝපාක යනු ඉන්දියාවේ පහත්ම යැයි සම්මත බලු මස් පවා කන සෙසු අය පිළිකෙව් කරන කුලයක උපන් අයෙකි. ඔහු බුදුරදුන්ගේ සසුනෙහි පැවිදිව රහත් වූ පසු උපස්ථාන පිණිස පැමිණියේ බ්‍රහ්ම සමූහය පිරිවරාගත් මහා බ්‍රහ්මයාය. දෙවියන් පිරිවරාගත් සක්‍ර දේවේන්ද්‍රයාය. පිරිස පිරිවරාගත් මහ රජවරුය. එය සිල්වත්කමේ හා ගුණවත්කමේ මහිමයයි.


**● පෘථිවියේ හට ගැනීම**

බොහෝ කාලයක් ගතවීමෙන් පසු මේ ලෝකය හැකිළෙන (අයං ලොකෝ සංවට්ටති) කාලයක් උදාවෙයි. ඒ කාලය වනවිට මෙහි ජීවත්වන සත්වයෝ මෙයින් චුතව ආභස්සර නම් දිව්‍ය ලෝකයේ උපත්තිය ලබති. ඔවුහු එහි ස්වකීය ප්‍රභාව ඇති මනෝමය වූ ශරීර ලබා ආකාශචාරීව ප්‍රීතිය අනුභව කරමින් ඉතා සැහැල්ලුවෙන් බොහෝ කාලයක් එහි ගත කරති. මෙසේ සංවෘත්ත හෙවත් හැකිළුණු ලෝකය ක්‍රමයෙන් විවෘත වීමට පටන් ගනියි. එකම ජලස්කන්ධයක් බවට පත්ව ඇති මෙහි ඇත්තේ අන්ධකාරය පමණි. (සම්මයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන අයං ලොකො විවට්ටති) මේ වන විට ආභස්සර දිව්‍ය ලෝකයේ සිටින ස්වකීය ශරීර ප්‍රභා ඇති දෙවියන් නැවතත් මනෝමය වූ ශරීරවලින් යුතුව මෙහි පැමිණෙති. මෙහි සඳ හිරු නොමැත. තරුකා නොමැත. දිවා රාත්‍රී නොමැත. මාස දින නොමැත. සෘතු කාල නොමැත. ස්ත්‍රී පුරුෂ භේදයක් නොමැත. එකම සත්ත්ව සමූහයක් වශයෙන් ඔවුහු සිටිති. මෙසේ කාලයක් යන විට ජලයෙන් වැසී තිබූ පෘථිවිය නැවත මතු වෙයි. එකල්හි වර්ණයෙන් හා සුවඳින් යුක්තවන පෘථිවිය ගිතෙල් මෙන් පැහැය වන්නේය. මී වැනි රස වන්නේය.

දිනක් ආකාශචාරීව හැසිරෙන ස්වයංප්‍රභා ශරීර ඇති සත්වයෙක් පොළොවෙහි වූ සුවඳට වර්ණයට ලොල්ව ඇඟිල්ලෙන් පොළොවට ඇන එහි රස බලන්නට විය. එවිට අනෙක් ආකාශචාරී සත්වයන් ද එසේ කරන්නට විය. දන් ඔවුන් සියලු දෙනා එක්ව පෘථිවියෙහි රස බලන්නෝය. රසයට ගිජු වූ ඔවුන් තුළ තෘෂ්ණාව ඇති වන්නට විය. මෙසේ කලක් ගතවීමෙන් රස පෘථිවිය කෙරෙහි ඇති වූ තෘෂ්ණාව නිසා ඔවුන්ගේ ශරීරවල ප්‍රභාව නැති වන්නට විය. සඳ හිරු පහළ විය. තරුද හටගත්තේය. රාත්‍රිය ද ඇතිවිය. මාස දින ඇති විය. සෘතු කාල ඇතිවිය. නැවත ලෝකය සම්පූර්ණයෙන්ම විවෘත විය.

මෙසේ කලක් ගත වන විට සමහර අයගේ ශරීර ප්‍රභාවන් ශීඝ්‍රයෙන් අඩු වී දුර්වර්ණ විය. එවිට ශරීර ප්‍රභා ඇති සත්වයෝ ඔවුන් පිළිකුල් කරන්නට විය. එවිට ඔවුන් තුළ ද්වේෂය හටගත්තේය. මෙසේ කලක් යන විට රස පෘථිවිය අතුරුදන්ව එහි භූමි පප්පටක නම් වූ බිම්මල් වර්ගයක් ඇතිවිය. එහි උන් සත්වයෝ එය අනුභව කරන්නට පුරුදු විය. තවත් කලක් යන විට එයද අතුරුදන්ව පදලතා නම් වූ වැල් වර්ගයක් පහළ විය. එහි උන් අය අනුභව කරන්නට පුරුදු විය. කලක් යන විට එයද අතුරුදන්ව අකට්ඨපාකසාලි නම් වූ පොතු නැති සහල් වර්ගයක් පහළ විය. එහි උන් අය එය අනුභව කරන්නටද පුරුදු විය.





මෙසේ පොතු නැති සහල් අනුභව කරමින් කලක් යන විට එහි උන් සත්වයන්ගේ ශරීර වෙනස්වන්නට විය. ඇතැමෙකුන්ගේ ශරීර සියුමැලි වන්නටත් ඇතැමෙකුගේ ශරීර ගොරෝසු වන්නටත් විය. මෙලෙස කලක් යන විට ඔවුන් තුළ ස්ත්‍රී පුරුෂ වශයෙන් විභේදනයක් ඇතිවිය. මෙසේ වෙනස් වූ ශරීර දෙස පුදුමයෙන් බොහෝ වේලාවක් බලා සිටි ඔවුන්ට (ස්ත්‍රී රූප දෙස බලා සිටි පුරුෂයන්ට ස්ත්‍රීන් කෙරෙහිද පුරුෂ රූපයක් දෙස බලා සිටි ස්ත්‍රීන්ට පුරුෂයන් කෙරෙහි ද) ආශාවක් හෙවත් රාගයක් ඇතිවිය. එයින් ඔවුහු කාම සේවනයට පෙළඹුණහ.

මෙයින් පැහැදිලි වන්නේ තෘෂ්ණාව, ද්වේෂය හා රාගය ඇති වූ අයුරුය. ස්වකීය ප්‍රභාව ඇති මනෝමය වූ ශරීර ලබා ආකාශචාරීව ප්‍රීතිය අනුභව කරමින් ඉතා සැහැල්ලුවෙන් ජීවත් තත්ත්වයක් තුළ පෘථිවිය කෙරෙහි ක්‍රමයෙන් හටගත් තෘෂ්ණාව නිසා ස්වකීය ප්‍රභාව ඇති මනෝමය වූ ආකාශචාරී ශරීර අතුරුදන්ව ඝන ශරීර ඇති වූ අයුරුය. එමෙන්ම ඔවුනතට ඇතැමෙක්ගේ ශරීර ප්‍රභා අඩුවීමෙන් එකිනෙකා පිළිබඳ ඇතිකරගත් පිළිකුල නිසා ද්වේෂය ඇතිවූ අයුරු හා ශරීර විපර්යාසයක් සමග වූ ස්ත්‍රී පුරුෂ විභේදනය නිසා රාගය ඇති වූ අයුරුය.

තෘෂ්ණාව, ද්වේෂය හා රාගය සිත්තුළ ඇතිවීම සාමාන්‍ය ස්වභාවයයි. මේවා වර්ධනය වන තරමට පුද්ගලයා වෙනත් අයෙකු බවට පරිවර්තනය වේ. ඒ පරිවර්තනය යහපත පිණිස පවතින්නක් නොවේ. ඔහු හෝ ඇය තුළ වූ යහපත් ගුණ මකා දමන, ශරීර ප්‍රසාදය අඩුකරන ආතතිය අසහනය වැඩි කරන හා අන් අය තුළ අප්‍රසාදයට ලක්වන තැනැත්තෙක් බවට පත් කරයි. එබැවින් අප තුළ අඩු වැඩි වශයෙන් පවතින තෘෂ්ණාව ද්වේෂය හා රාගය බුද්ධිමත්ව හඳුනාගෙන පාලනය කරගැනීමට උත්සාහ කළ යුතුය. එය මිනිසත් බවින් දේවත්වය කරා ළඟා වීමට හේතු වේ.

**● හොරකම් හා බොරුව ඇතිවීම**

ස්ත්‍රී පුරුෂයන් වශයෙන් වෙනස් වූ සත්වයන් කාමසේවනයෙහි යෙදෙන කල එය පිළිකුල් කළ සෙසු අය පස්වලින් අළුවලින් ගොම්වලින් දමා ගසන්නට විය. එබැවින් කාම සේවනය සඳහා සෙසු අයට නොපෙනෙන රහස් ස්ථාන අවශ්‍ය විය. එහි

"ආශාව නිසා ශෝකය හටගනී, බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවනට ශෝකයක් නැත. බියකුත් නැත."

ප්‍රතිඵලයක් වශයෙන් වනස්පතීන් හෙවත් ගෙවල් බිහිවන්නට විය. මෙසේ ගෙවල් තුළට වී ස්වයංජාත වූ අකට්ඨපාකසාලී නම් වූ පොතු නැති, රසවත් සහල් වර්ගය මිනිසුන් අනුභව කරන්නට පුරුදු විය. උදේට අවශ්‍ය සහල් ප්‍රමාණය කපාගත් කල සවස් කාලය වන විට නැවත එය වැවෙන්නට විය. එහි අඩුව නොපෙනෙන්නට විය.

දිනක් කම්මැලි එක් සත්වයෙක් මෙසේ සිතුවේය. "උදේට මෙන්ම සවසට ද සහල් නෙළීමට යා යුතුය. මෙය මහත් කරදරයකි. එනිසා මම දින කිහිපයකට අවශ්‍ය සහල් නෙළාගෙන එන්නෙමි"යි දින හතරකට අවශ්‍ය සහල් නෙළාගෙන පැමිණියේය. වෙනත් පුරුෂයෙක් ඔහු වෙත පැමිණ පෙර පරිදි සහල් නෙළීමට යමු යැයි යෝජනා කළේය. එවිට ඔහු පවසනුයේ "මිත්‍රය මා දින හතරකට සෑහෙන ප්‍රමාණයේ සහල් නෙළාගෙන ආවෙමි. එබැවින් මට සහල් අවශ්‍ය වන්නේ දින හතරකින් පසුවය." ඔහුගේ කීම ඇසූ එම පුරුෂයා ද දින කිහිපයකට ප්‍රමාණවත් වන පරිදි සහල් නෙළාගෙන එන්නට විය. මෙම කරුණ ආරංචි වූ සෙසු සත්වයෝ ද දින කිහිපයකට ප්‍රමාණවත් වන පරිදි සහල් නෙළාගෙන විත් ගේ තුළ තබාගෙන පරිභෝජනයට පුරුදු විය. එවිට ස්වයංජාත වූ සහල්වල කුඩු ද දහයියා ද ඇතිවන්නට විය. කපා ගත් කොටස නැවත නොවැවෙන්නට විය. භූමියෙහි හිස් බවක් ඇතිවන්නට විය.

මේ පිළිබඳ කතිකා කොටගත් ඔවුහු එම සහල් හටගත් ඉඩම් ප්‍රමාණයන් බෙදා වෙන්කොට සීමා තබන්නට විය. මෙසේ තම තමන්ට වෙන් කළ ඉඩම්වල හටගත් සහල් අනුභව කරමින් කල් ගෙවන කල මේ පුද්ගලයින් අතර අධික තෘෂ්ණාවෙන් යුක්ත වූ එක් පුද්ගලයෙක් තමාගේ ඇල් වී කොටස ඉතිරි කර ගැනීමේ අදහසින් වෙනත් කෙනෙකුගේ ඇල් වී කොටසෙන් කපන්නට විය. එය අසු වී අන් අය ඔහුට අන් අයට අයත් වූ දෙය නොගන්නා ලෙස ඔහුට අවවාද කරන්නට විය. එහෙත් ඔහු නැවතත් එයම කරන්නට විය. එවිට සෙසු අය ඔහුට දඬුවම් කරන්නට විය. ඔහු එයින් බේරීමට බොරු කීවේය. මෙසේ හොරකම හා බොරුව පිරිස අතර ඇතිවන්නට විය. හොරකමෙන් හා බොරුවෙන් යුක්ත වූ පිරිසේ ශරීර වර්ණය පහවන්නට විය. ශරීර රළු වන්නට විය.

ස්වයංජාත වූ ඇල් සහල් ක්‍රමයෙන් අතුරුදන්ව ගොස් නැවත සහල් ලබා ගැනීම සඳහා ඔවුන් වී වපුරන්නට විය. එවිට එහි පොතු, කුඩු, දහයියා ආදිය හට ගනිමින් රසයද අඩු වී රළුවන්නට විය. මුලින් පිසීමකින් තොරව අනුභව කරන්නට පුරුදුවන් වූ සහල් පිසීමට අවශ්‍ය විය. නොපිසා අනුභව කිරීමට අපහසු විය.

මෙයින් පැහැදිලි වන්නේ පුද්ගල චර්යාවන්හි විෂමතාවයන් නිසා ස්වභාවධර්මයත් වෙනස් වූ ආකාරයයි. පළමුව ප්‍රීතිය පමණක් ආහාර කොටගත් සත්වයන් ක්‍රමයෙන් අප පැවිය, භූමි පර්පටක නම් වූ බිම් මල් පදලතා නම් වූ වැල් අනුභව කරමින් පසුව එයද අතුරුදහන්ව අකට්ඨපාකසාලී නම් වූ පොතු නැති සහල් වර්ගයක් පහළ වූ පසු එයද අනුභව කරමින් සිටින විට පුද්ගල චර්යාවන්ගෙන් විෂමතාවයන් නිසා එම සහල් ක්‍රමයෙන් වෙනස් වූ අයුරුය. මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ මිනිසුන් තුළ ඇති වූ විසම ක්‍රියාවන්ය. තෘෂ්ණාව, කාමය ආදිය නිසා හොරකම හා බොරුව සමාජ ගතව ඇත.

**● මහා සම්මත රජෙකු පත්කර ගැනීම**

මිනිස් සිත දූෂිත වීමත් සමග සමාජයෙහි ඇති වූ හොරකම, බොරුව හා හිංසාව පිළිබඳ කලකිරුණු පිරිසක් එක්ව මෙසේ කතිකාවක් ඇතිකර ගත්හ. එනම් "සමාජ පාලනය සඳහා වගකිව යුත්ත නොවලහා කීම, ගැරහිය යුත්තන්ට ගැරහීම, නෙරපිය යුත්තන් නෙරපීම ආදිය මනාව කළ හැකි ශක්තිසම්පන්න පුද්ගලයෙක් අපි පත් කරගනිමු. ඔහුට අපේ භවභෝග සම්පත්වලින් කොටසක් දෙමු." යනුවෙනි. මෙසේ කතිකා කරගත් ඔවුහු, ඔවුනතර සිටි ශක්ති සම්පන්න මෙන්ම උසස් රුවක් ඇති පුද්ගලයෙක් පාලකයා වශයෙන් පත්කර ගත්හ. ඔහු සියලු දෙනාගේ සම්මතයෙන් පත් වූ නිසා 'මහා සම්මත' යනුවෙන් ප්‍රකට විය. ඔහු මිනිසුන්ට සම අයුරින් ඉඩම් බෙදා දීම ආදිය කරමින් ගුණ ධර්මවලින් යුක්ත සමාජයක් ඇතිකිරීම සඳහා කටයුතු කළ නිසා 'ක්ෂත්‍රිය' නමින් ප්‍රසිද්ධ විය. එය ක්ෂත්‍රිය යන ශබ්දයේත් - වංශයේත් ආරම්භය විය.

මේ අතර සමාජයේ ඇති වූ විසම ක්‍රියාවන් නිසා කලකිරුණු ඇතැමෙක් වනගතව ගුණධර්ම දියුණු කරමින්, ධ්‍යාන වඩමින් තාපස දිවියක් ගත කරන්නට විය. පාප ධර්ම බැහැර කරමින් ඔවුන්ගේ ආධ්‍යාත්මය පවිත්‍රකරගත් නිසා ඔවුන්ට 'බ්‍රාහ්මණ' යන නම ව්‍යවහාර කරන්නට විය.


මේ පිරිස අතර ඇතැමෙක් ගව පාලනය, වෙළෙඳාම ආදිය සිදුකරමින් කාමභෝගී දිවියක් ගත කරන්නට විය. ඔවුන් මෙසේ ධනෝපායන මාර්ගයන්හි නියැලෙන නිසා 'වෛශ්‍ය' නමින් ප්‍රසිද්ධ විය. මෙහි වූ ඇතැමෙක් සැඩ පරුෂ ගති ස්වභාවයෙන් යුක්තව සමාජයේ නින්දිත පහත් ක්‍රියාවල නියැලෙන්නට විය. මෙසේ සමාජයේ පහත් ක්‍රියාවල නියැලුණු පිරිස 'ශුද්‍ර' නමින් ප්‍රසිද්ධ විය.

බුදුරජාණන් වහන්සේ තවදුරටත් මෙය විස්තර කරමින් දේශනා කරනුයේ මේ සිව් පිරිසේ ආරම්භය මෙසේ සිදු වුවද, මොවුනතුරින් කවුරු වුවද සිත - කය වචන යන තිදොරින් අකුසල් සිදු කරන්නේ නම් සමාජයේ ආචාර ධර්මවලට පටහැනිව පහත් ලෙස හැසිරෙන්නේ නම් මරණයෙනු මතු ඔවුන් සිදු කරගත් අකුසල කර්ම නිසා දුගතිගාමී වන බවයි. එමෙන්ම තිදොරින් යහපත් දේ සිදුකරන සමාජයේ ආචාර ධර්මවලට ගරු කරමින් උසස් චර්යාවන් පවත්වන අය මරණින් මතු සුගතිගාමී වන බව තවදුරටත් දේශනා කොට ඇත.


මෙයින් අපට පැහැදිලි ලෙසම කියා දෙන්නේ අප ඉපදුන කුලය නිසා හෝ හිමි වූ ධනය නිසා හෝ ලැබුණු බලය නිසා හෝ අප ශ්‍රේෂ්ඨ නොවන බවයි. අප ශ්‍රේෂ්ඨයන් බවට පත් වන්නේ අප තුළ ඇති කරගත් උතුම් ගුණ ධර්මයන් නිසා බවයි. එම ගුණ ධර්මයන් අප වඩා වර්ධනය කරගත යුත්තේ අනුන් සතුටු කිරීමට හෝ අන් අය අතර ප්‍රසිද්ධියට, ජනප්‍රියත්වයට පත්වීමට හෝ නොව අවංකවම තමාගේ ගුණ ධර්ම දියුණු කර ගනිමින් ආධ්‍යාත්මය දියුණුව ඇති කර ගැනීම අදහසිනි. එවිට අපට අප ජීවත් වන සමාජය පමණක් නොව දෙවියන් ද ප්‍රිය කරති. ආරක්ෂාව සපයති. 'ධර්මයෙහි හැසිරෙන තැනැත්තා ධර්මය විසින්ම ආරක්ෂා කරනු ලබයි' යන්න ප්‍රායෝගික වන්නේ එවිටය. එහෙත් බොහෝ අයට ධර්මය මතක් වන්නේ කරදරයක් සිදු වූ අවස්ථාවකය. එවිට පමණක් ධර්මයේ පිහිට පැතීම ප්‍රායෝගිකව නොවන්නේය.

මෙයින් අපට කියාදෙන අනෙක් කරුණ නම්, අප ගුණධර්මවලින් පෝෂිතව, සමාජ ආචාර ධර්මයන්ට අනුගතව, යහපත් චර්යාවන් පවත්වමින් කටයුතු කරන කල අප පාලනය කිරීමට රජෙක් හෝ වෙනත් කිසිවෙකු අවශ්‍ය නොවන බවයි. වැදගත්ම පාලනය වන්නේ තමන්, තමන් විසින්ම පාලනය කර ගැනීමයි. ලෝකයේ උසස්ම පාලනය එයයි.

මහනුවර අස්ගිරි මහාවිහාර පිරිවෙනෙහි
ආචාර්ය ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත
පූජ්‍ය මහරැඹෑවැවේ පාලිත හිමි



"ඇත්ත කීම යුතුය, ක්‍රෝධය නොකිරිය යුතුය, කිසිවකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය, මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය"



# අනේ දෙව්දත් නොදුටු මොක්පුර

සිංහල ජනතාවිය, බෞද්ධ චින්තනය හා බැඳුණු අවයාත් ලක්ෂණ පෙන්නුම් කරන්නකි. ඉවසීම, උපේක්ෂාව, සෙනෙහස, දයාව වැනි උතුම් මානව ගුණ විදහා දක්වන සිංහල ජනකතා වංශාවලියේ දක්නට ලැබෙන උසස් නිර්මාණයක් ලෙසට දෙව්දත් කතාව ඇසුරින් රචිත දෙව්දත් කාව්‍ය නිබන්ධනය කෙරෙහි මගේ සිත බැඳුණේ මා විශ්වවිද්‍යාල ප්‍රවේශයේ ඉගෙනුම ලබමින් සිටි කාලයේදීය. ජනකවි රීතියෙන් රචිත තවත් පොත් රාශියක්ම එකල අපි රසවින්දේ ඉන් උපරිම රසයක් ලබමිනි. බුදු අහමේ ඇසුර ලබමින් රචිත 'බුත්සරණය, යසෝදරා වත, හිමගිර වර්ණනාව, වෙස්සන්තර හා විදුර ජාතකය, වැනි කවි බණපොත් ඒ කාලයේ හැම නිවසකම පාහේ දක්නට තිබුණි. රාත්‍රී නින්දට යනතුරු මෙම අපූරු කවි බණ පොත්වල තිබූ කවි උස් හඬින් හා ලයාන්විතව ගායනා කිරීම බොහෝ ගැමි නිවෙස්වල වැඩිහිටියන්ගේ සිරිතක් විය.

ඒ කාලයේ බොහෝ දෙනෙකු කවියෙන් ලියවුණු බණ පොත් මිලදී ගත්තේ කුඩා සංචාරක පොත් වෙළෙඳුන්ගෙනි. (අද මෙබඳු වෙළෙඳුන් දක්නට නැත.) වැඩිමහල් කුඩා පොත් වෙළෙන්දාගේ අපූරු පවා එකල සාහිත්‍යකාමීන්ගේ නෙතට රසඳුනක් විය. ඔහු ලොකු කුඩයක් දිග හැර එහි ඇතුළත කුඩා පොත් අතුරා කඩදාසියක් හෝ විසල් ගස් සෙවණක් යටට වී පොත් අලෙවි කරයි. කුඩා පොත් පිංචක මිල ශත දහයක් හෝ ශත විසිපහක් විය. අද මා ලියන මේ ලිපියට මූලික කොටසේ "දෙව්දත් කාව්‍යය" ගැන රචිත කුඩා කවි බණ පොත මා මිලදී ගත්තේ ගම්පහ නගරය තුළ උපාසිය පාරේ පිහිටි "පළ ගහ යටදී" බව මට මතකය. අද ඒ "පළ ගහ" තිබුණු තැනවත් සොයාගත නොහැකිය. සංවර්ධනයේ නාමයෙන් එතැන අද කොන්ක්‍රීට් මන්දිර ඉදිවී තිබෙනු දුටුව හැකිය. එම පොතේ පිටකවරය හැරසී තිබුණේ ගිනිදැල් වෙලාගෙන අපායට ඇදගෙන යන දෙව්දත්ගේ බියකරු චිත්‍රයකින් බව මට අදත් මතකය.

දෙව්දත් බණ කතාව කවියෙන් ලියූ ජන කවිය එය හඳුන්වා ඇත්තේ "දේවදත්ත වරුණේ කවි බණ පොත" යනුවෙනි. එය ඇත්තෙන්ම කාව්‍යමය ගුණයෙන් මෙන්ම රසයෙන්ද පිරිපුන්ය. මෙම කෘතිය සංස්කරණයට යටත් නැවත දයාපාල ජයනෙත්ති නමැති ලේඛකයා විසින් පළකර තිබීම සතුට දනවන්නකි. අද මට මේ ලිපිය ලියන්නට අවකාශය සැලසෙන්නේ ඔහුගේ "දේවදත්ත අපදානය හා දේවදත්ත වරුණ කවි බණ පොත" උදව්වෙන් බවද කිව යුතුය. කවි 412කින් සමන්විත මෙම කෘතිය වඩාත් සිසිත ඇද බැඳ ගන්නේ ඔහු එම කවි අරභයා ලියන ලද රසපූර්ණ විවරණය නිසා බවද නොකියා බැරිය.

"දේවදත්ත සංකල්පය" බුදුන් වහන්සේට පරම සතුරු පාර්ශ්වයක්ය යන මතය බෞද්ධ ජනතාව තුළ ඉතා තදින් පැතිර ගිය එකකි. අදටත් ඒ මතය වෙනස් වී නොමැත. "දේවදත්ත" සිද්ධාර්ථ කුමරුට සමකාලීන සමයේ උපත ලද අයෙක් ලෙසට ඉගැන්වේ. ගෞතම පසුකාලයක බුදුන් වහන්සේගේ පරම සතුරා ලෙසට හැඳින්වේ. එහෙත් පසුකාලයක දේවදත්ත බුදුසසුනේ පැවිදිවූ බව බෞද්ධ ශාසන ඉතිහාසයේ සඳහන් වේ. එසේ වුවත් දීර්ඝ කාලයක් තුළ දේවදත්ත යන නාමය බුදුන්ට සතුරු වූ කෙනෙකු ලෙස බෞද්ධ සම්ප්‍රදාය තුළ ව්‍යවහාරයෙන් වූ සම්මතය ලෙහෙසියෙන් අහෝසිකා දමන්නට බැරිවිය. අපේ ගැමි සිංහල ව්‍යවහාරයට අනුවද වැරදි සහගත පුද්ගලයා "දෙව්දත්තයා" ම විය.

"දේවදත්ත කුමරු" කාගේ කවිද යන ප්‍රශ්නය මෙහිදී බෙහෙවින් සිත තුළ කුතුහල දනවන හෙයින් ඒ ගැන ඉතා කෙටියෙන් වචනයක් සඳහන් කළ යුතුය.

දේවදත්ත කුමරුද සිද්ධාර්ථ කුමරුන්ට සම වයසේම ශාක්‍ය කුලයේම ඥාති සහෝදරයෙකුව උපන් අයෙකි. ඔහු උපත ලබන්නේ "කෝලිය" නුවරය. ඔහුගේ පියා සුප්‍රබුද්ධ වූ අතර මව අමිතා දේවිය වූවාය. ඇය සුද්ධෝදන රජුගේ නැගණියයි. යශෝධරා කුමරිය දෙව්දත්ගේ නැගණිය වූවාය. තරුණ කාලයේ සිටම දෙව්දත් කුමරු තොරතුරු මුරණ්ඩු චරිතයක ගති ලක්ෂණ පෙන්නුම් කළේය. දෙව්දත් කතාව ලියූ ජන කවියාද මෙම නෑ සබඳකම්වල සුළුමුල පිළිවෙළින් දක්වා තිබේ. මරණයට ආසන්න වන අයෙකු තම නෑයින්ට අඩ ගසමින් තම ජීවිතය බේරාගන්නා ලෙසට විලාප තගන අපූරු ජනකවියා ඉතා සංවේදී ලෙසට කවියෙන් ලියා තිබේ. දෙව්දත් මහ පොළොව තුළට ගිලා බසින අවස්ථාව දකින කවියා නිරූපණය කොට ඇත්තේ මේ අයුරිනි.

**'ඉතින් මැරිය ඉවසන්නට මහෙ දෙසතුළ් දනවා**
**බුදුන් දිහාවට වැඳගෙන මේ දුක සොපලුන වා'**

බුදුන් වහන්සේ දුක බලා වැද සමා කරවාගෙන මියයන අදහස ඇතිව දෙව්රම් වෙහෙරට පැමිණියද අතරමගදීම දෙව්දත්ගේ අවසානය සිදුවිය. බුදුන් වැඩ සිටි දිසාවට දෙඅතක් මුදුන් දී වැඳගෙන දෙව්දත් සිය මරණය කරා ළඟාවෙන මොහොත ජනකවියා පාඨකයාගේ දෑසට කඳුළක් නංවමින් රචනා කොට තිබීම අගය කළ යුත්තකි.

සසුන තුළ හුදකලා වීම නිසා දෙව්දත් තෙරුන්ගේ සිතේ ඇතිවූ මානසික කම්පනය "සද්ධර්ම රත්නාවලියේ" ඉතා අපූරුවට විවරණය කොට තිබේ. දෙව්දත් තෙරුන් බුදුන් වහන්සේට එරෙහි වීමට තුඩුදුන් කරුණු අතර සිතේ පහළ වූ උඩඟු බව හා අහංකාරය හා ඊර්ෂ්‍යාවද හේතුවී ඇති බව බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍ර අනුව පැහැදිලි වේ.

නිව්ටන් ගුණසේකර

"යකඩයෙන් හැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

## දළදා වරුණ

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාළිගාව
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridaladamaligawa.lk

### පළමුව ඔබේ සිත හඳුනාගන්න

[illegible]





# නාග ගෝත්‍රිකයෝ

## බුදු සිරිපා කමල වැන්දේ අද වැනි දවසකය

[illegible]

"අපවලා මට බැන්නේය, මට ගැසුවේය, මා පැරැද්වූයේය, මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙකු ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිද් ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ." - (ධම්ම පදයේ 3 වන ගාථාව)



# අනුවණ සත්වයෝ පමණක් නොව නුවණැති මහෝත්තමයෝ පවා ස්ත්‍රී වසඟයට පැමිණිය හැකියි

## ස්වර්ණ මයුර ජාතකය කියා දෙන්නේ එයයි

සසර පුරා පාරමීදම් පුරා චතුරාර්ය සත්‍යය ධර්මය මනාව අවබෝධ කොට සියලු ලෝකයාන් සසර සයුරෙන් එතෙර කළ, අප මහා බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩවාසය කරන කාලයෙහි ශාසනයේ උකටලීව සිටි භික්ෂූන් වහන්සේ නමක්, අවශේෂ භික්ෂූන් වහන්සේ විසින් සර්වඥයන් වහන්සේ වෙත ඉදිරිපත් කළහ. එවිට බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂූවගෙන් ඔබ උකටලීව, අලසව වසන්නේ දැයි විමසූ සේක. එය සැබෑවැයි කී කල්හි, කුමක් අරභයා එසේ වූයේ දැයි විචාළ විට, විසිතුරු ලෙස සැරසුණු ස්ත්‍රියක දැක, ඈ කෙරෙහි සිළිබඳ සිත් ඇති වී ශාසනයේ උකටලී වූ බව පවසා සිටියේය. මහණෙනි, අනුවණ සත්වයා පමණක් නොව නුවණැති මහෝත්තමයෝ පවා ස්ත්‍රී වසඟයට පැමිණියෝවෙද්දැයි දක්වා, මෙම අතීත කතාව දේශනා කොට වදාළ සේක.

අතීත දවස බරණැස් නුවර, බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍ය කරන කාලයෙහි බෝධිසත්වයෝ මයුරයෙකුව උපන්නාහුය. රත්වන් පැහැයෙන් ඉපිද, වැඩිවිය පැමිණ, පියාපත් රතු රේඛාවලින් යුක්තව රැසිරියෙන් දුටුවන්ගේ නෙත්සිත් ඇදගන්න. අනතුරුව ඔහුගේ රූපශ්‍රීය අනර්ඝ බැවින්, මිනිසුන් ළඟ වාසය කිරීම උපද්‍රවයට හේතු වේනැයි සිතා, හිමාල වනයට ගොස් එහි පර්වත තුනක් උඩට නැග සතරවන පර්වත තලයෙහි වූ දණ්ඩකාරණ්‍යයේ නම් පර්වත මුදුනෙහි වාසය කළේය. ඒ මයුරයා දිනපතා ආහාර පිණිස බිමට පැමිණි විට තමන්ගේ ආරක්ෂාව පිණිස නැගෙන, හිරු දෙස බලා බ්‍රහ්ම මන්ත්‍රයක් ජප කිරීමක් කොට යන්නේය.

"උදේතයං චක්ඛුමා ඒකරාජා හරිස්සවණ්ණො පඨවිප්පභාසො තං තං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං තයජ්ජ ගුත්තා විහරෙමු දිවසං" සියලු වස්තුවට ජීවනාත්මී භාවය කරන්නා වූ සියලු සත්වයා හට රාත්‍රී කාලයෙහි වූ අන්ධකාරය පහකොට, ලොව දකිමට හේතු වන්නා වූ ආලෝකය සපයාවන සූර්යයා හට මාගේ නමස්කාරය වේවා. අද දවස ඒ සූර්ය දේවතාවා විසින් මා රැකුනු ලැබ නිර්භයව වාසය කරමි" යි කියා සූර්යයාට නමස්කාර කළේය.

දෙවනුව අතීතයෙහි සර්වඥයන් වහන්සේට නමස්කාර කරන මයුරයා, "යෙ බ්‍රාහ්මණා වේදගූ සබ්බධම්මෙ තෙ මෙ නමො තෙ ච මං පාලයන්තු නමත්ථු බුද්ධානං නමත්ථු බොධියා නමො විමුත්තානං නමො විමුත්තියා ඉමං සො පරිත්තං කත්වා මොරො චරති එසනා" යනුවෙන්, 'දුරුකරන ලද පාපයන් ඇති, ස්කන්ධධාතු ආයතනාදී සියලු පදාර්ථයන් සියලු ආකාරයෙන් පිරිසිඳ දන්නා ලද්ද වූ යම් සර්වඥයන් වහන්සේ කෙනෙකුන් ඇත්ද, මාගේ නමස්කාරය ඒ සර්වඥයන් වහන්සේට වේවා, ඒ අතීත

කාලයකයි අප්‍රමාණ වූ අචින්ත්‍ය වූ ගුණ සමූහයන්ගෙන් යුක්ත වූ සර්වඥයන් වහන්සේට ද නමස්කාර වේවා. ඒ සර්වඥයන් වහන්සේ විසින් ප්‍රතිවේධ කරන ලද සම්මා සම්බුද්ධ ඥානයටද නමස්කාර වේවා. ඒ සර්වඥයන් වහන්සේ විසින් වදාරණ ලද ශ්‍රී සද්ධර්මය නිසි පරිද්දෙන් පිළිපදින්නා වූ සංසාර සාගරයෙන් ගොඩනැගී අමාමහ නිවන් දුටුවා වූ සංඝරත්නයටද නමස්කාර වේවා. ඒ සර්වඥයන්වහන්සේ විසින් වදාරණ ලද ආර්ය මහා සංඝයා වහන්සේ විසින් ප්‍රතිවේධ කරන ලද සතර මඟ සතරඵල සංඛ්‍යාත විමුක්තියටද නමස්කාර වේවා" යි කියා ඒ මයූර රජ්ජුරුවෝ මෙම ආරක්ෂක පිරිත කියා ගොදුරු පිණිස නැගිටෙන්නාහයි වදාළ සේක.

ඒ මයූර තෙම මේ පිරිත් ආනුභාවයෙන් දහවල් දවසේ සැප සේ ඇවිද, රාත්‍රියෙහි ද සිහියට තාරකාවක් නැඟීම සැප සේ ඇවිද රාත්‍රී භාගයේ පර්වතයට නැඟී බස්නාහිර පුර්වය දෙස ඒ පිරිත පිරිත් කරනුගානා. "අපෙතයං චක්ඛුමා ඒකරාජා හරිස්සවණ්ණො පඨවිප්පභාසො තං තං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං තයජ්ජගුත්තා විහරෙමු රත්තිං, යෙ බ්‍රාහ්මණා වෙදගූ සබ්බධම්මෙ තෙ මෙ නමො තෙ ච මං පාලයන්තු, ඉමං සො පරිත්තං කත්වා මොරො වාසමකප්පයීති" යන මේ පරිත්තානුභාවයෙන් රාත්‍රියෙහි දහවලත් සැප සේ වාසය කරන්නෙමි.

මේ ආකාරයෙන් , පිරිතේ ආනුභාවයෙන් දවස් පතා වාසය කරන කල්හි එක් වැද්දෙක් හිමාලයෙහි ඒ ඒ තැන ඇවිදිමින්, බෝධිසත්වයන් වහන්සේ වාසය කරන පර්වත සමීපයට ගොස් බෝධිසත්වයන් දැක, දෙවෙනුව තමාගේ ගමට අවුත් තම පුතාට තමා මිය යන අවස්ථාවේ අසවල් දණ්ඩකාරණ්‍ය පර්වත මුදුනේ රන්වන් මයුරයෙක් ඉන්නේය. යම් දවසක රජ්ජුරුවන් වහන්සේ රන්වන් මොණරෙකුගේ මස් ප්‍රයෝජන ඇතැයි කීවොත් තෝ ඒ මොණරා අල්වා දෙනු යි කීය.

ඉන් අනතුරුව බරණැස රජුගේ අග්‍රමහේෂිකාව වූ ඛේමා නම් බිසව රාත්‍රියෙහි සිහිනයෙන් රන්වන් මොණරෙකු ධර්මය දේශනා කරනු දැක "දෙවයන් වහන්ස" ඒ බව රජුට කීවාය. රන්වන් මොණරෙකු මට ධර්මය දේශනා කරනු අසන්නට ලැබෙන්නේ නම් ජීවිතය පවත්වාගන්නෙමි යැයි කියා දොළදුකක් ඇතිකර ගත්තාය. රජු අමාත්‍යයන්ට කතා කොට රන්වන් මොණරෙකු ඇත්දැයි විචාළේය. අමාත්‍යයෝ රන්වන් මොණරෙකු ඇති බව හෝ නැති බව නොදනිති. එසේ දන්නේ නම් වැද්දෝ දනිති යැයි කීහ. එවිට රජු වැද්දන් ගෙන්වා රන්වන් මොණරුන් ඇතිනම් දුටු කිසිවෙක් ඇතිදැයි විචාළ විට, එක් එක වැද්දෙක් ස්වාමිනි, හිමාල වනයෙහි පිහිටි දණ්ඩකාරණ්‍ය නම් පර්වතයේ රන්වන් මොණරෙක් ඇතැයි කීය. එවිට රජු එසේ වී නම් ඔබ ගොසින් පණපිටින් අල්වාගෙන එන්නැයි කීය. එවිට වැද්දා ඒ නොපසුබට සිත ඇතිවීම ගොස් මිය කී පරිදි අඩු

දණ්ඩකාරණ්‍ය වනයේ මොණරා වසන කරනු දැක මොණරා බසින මාවත දෙස බලා මිදු ගසා මොණරා අල්ලා ගැනීමට උත්සාහ කළේය. බෝධිසත්වයන්ගේ මෛත්‍රානුභාවයෙන් මිදුද ඇතුළේ පයලුවත් අසු නොවීය. මේ ආකාරයෙන් ඒ වැදි තෙමේ ජීවිත කාලයටම උත්සාහ ගත්තත් එය ඉටුකර ගත නොහැකි විය. හිමාල වනයේදීම ඔහු මියේය. එසේම ඛේමා නම් බිසව මොණරා ලබාගැනීම නොලැබීම් කියා අදහසින්ම සිට මියේය.


රජ්ජුරුවෝ මොණරා නිසා බිසව මළ බව සිතා, මොණරා කෙරෙහි වෛර බැඳ , රන් පොතක, හිමාල වනයේ දණ්ඩකාරණ්‍ය පර්වතයෙහි රන් මොණරෙකු වෙසෙන බවත්, ඔහුගේ මස් කෑ කෙනෙකු අජරාමර වන බවත් ලියා භාණ්ඩාගාරයේ තබා මියේය. එතුමාට පසු රජයට පැමිණි රජ්ජුරුවෝ ඒ රන් පොත දැක, මේ මොණරා මරා මස් කන්නට කැමැත්තෙන් වැද්දෙක් යැවූහ. ඒ වැද්දන් පෙර පරිදිම උත්සාහ කර මරණයට පත් විය. මෙසේ රජවරුන් හය දෙනෙක් වැද්දන් යැවූ නමුත් ඒ හැම දෙනාම මිය ගියෝය.

සත්වෙනුව රජයට පැමිණි රජු , මේ රන් පොත බලා නවත් වැද්දෙක් යැවීය. ඔහුත් ගොස් මළපුඩුව ගෙන එයට අසුකර ගැනීමට බැරි තැන වෙනත් ක්‍රමයක් සිතුය. බෝධිසත්වයන් උදේම පර්වතය මැතිමට පෙර සූර්ය වන්දනාව , පිරිත පත පිරිම පාදිය දෙස බලමින් පිරිතේ පමණට ආසනු නැමීණ. ලස්සන මොණරියක් අල්වාගෙන, ඇය පුහුණු කරවා නැවත දණ්ඩකාරණ්‍ය පර්වතයට රැගෙන ගොස් , ඒ අසල මොණරා ගැවසෙන ආසියේ මොණරියට නටා හැඬලීමට සැලැස්වූහ. මිත්‍රය කීමට පෙර මෙය සිදුවිය. මේ අවස්ථාවේ දී මොණරියගේ සිතේ මොණරියා ගැන රාග සිතුවිලි අදහසක් ඇතිවිය. මොණරා රාගයෙන් බැඳී මිත්‍රය නම් ඇති බිසක නොකිරීමට මඬ ගොදුරු අවස්ථාවේ පිට අසුවුණේය.

මොණරා අල්වා රජු ළඟට ගෙන ගිය විට රජු සතුටට පත්විය. එවිට මයූර රජුට රජුගෙන් කීය මෙසේ ප්‍රශ්නයක් ඇසීය. ඇයි මා මෙහි ගෙනාවේ, එවිට මාගේ මස් කැවොත් අජරාමර වන බව කියමින් මෙම කතාවේ රන් පොතේ සටහන් ඇති බව රජු කියාසිටීය. මට මස් කෑමට පෙර මේ කාරණය පමණක් පසුව කතාකරනු කැමැත්තෙමි. රජ්ජුරුවනි, මා පෙර ආත්මයක රන්වන් වූ සෙමෙර මම පුර්ව පින් පළ දෙමින්, මම පෙර ආත්මයේදී බරණැස් නුවර චක්‍රවර්ති රජව ඉපිද, පන්සිල් රැක දානාදිය කොටගෙන රාජ්‍ය කොට මිය ගොස්, එවිට ලෙඩකයෙහි ඉපිද ඉන් චුතව කළ අකුසල් බලයෙන් මේ තිරිසන් යෝනියෙහි උපන්නෙමි. මා විසින් රැක්ක පංචශීලයේ බලයෙන් මෙසේ රන්වන් මයූරයෙක් වී ඇත්තෙමි. ඒ ගැන පොතපිළිගන්නේ රජතුමා, මයූර රජ්ජුරුවෝ ඉන් කියා සිටියේය. මම රාජ්‍ය කරන සමයේ ඇතැම් රාජ්‍යයන් ඒ ඒ තැන ඇවිද්ද වූ රන්වන් රථයක් ඇත. ඒ රථය මඟුල් පොකුණේ ගිල්වා ඉන්නට

ඇරගෙන මිහේ කරාවෙහි සැකය දුරුකරගන්න. රජු එසේ අසා ,පොකුණේ පැන් ඉස්සවා රථය ගොඩ ගත්තේය. රජු සතුටුව බෝධිසත්වයන් පුදපූජා. බෝධිසත්වයෝ රජුට පන්සිල් දී අවවාද කොට පියාසර කරමින් යළිත් දණ්ඩකාරණ්‍ය නම් පර්වතයටම ගියහ.

බුදුරජාණන් වහන්සේ අතීත වර්තමාන කථාව දක්වා, මෙසේ ස්වර්ණ මයූර ජාතකය නිමවා වදාළ සේක. මෙම ජාතක කථාව අසා සිටි සියලුම භික්ෂූන් කෙලෙසුන් නසා රහත් වූහ. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. මයූර රජ්ජුරුවෝ නම් ලොව්තුරා බුදු වූ මමය කියා වදාළ සේක. මෙම ස්වර්ණ මයූර ජාතකය තුළින් අනුවණ ජනයා පමණක් නොව නුවණැති මිනිස්සුන්ටද පවා සති බලයට පත්වන බව දැන තම ජීවිතය රැකී ධර්මයෙන් කොහේ කවුරුත් වූදවා නැතිවීම ඉවසා සුන් වෙමු.



කේ. මීගහකුඹුර

22

බුදුන් උපන් පුදබිමට රැකගනිමු



# බුදු උපත සිදු වූ සල් ගසෙහි ඉපැරණි නටඹුන් කපිලවස්තුපුරයෙන් මතුවේ

## කැණීම්වලට සහභාගි වූ මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන කරන හෙළිදරව්ව

සිංහල සාහිත්‍යය පෝෂණය කළ සාහිත්‍යාංග අතරින් බුදු සිරිතට හිමිවනුයේ ප්‍රමුඛ ස්ථානයකි. ඔබ අප කුඩා කළ සිට අසා හුරුපුරුදු බුදු සිරිතේ එක කතා සුළු ප්‍රබන්ධයක් නොවන බව ලෝකයාට පසක් කර දෙනු වස් විද්‍යාත්මක පසුබිමක පිහිටා සිදුකරනු ලබන පුරාවිද්‍යා කැණීම් ගණනාවක් මේ දිනවල නේපාලය ආශ්‍රිතව සිදුකරයි. ලෝ පුරා දසලක්ෂ ගණන් බෞද්ධයන්ගේ සිත් තුළ බුද්ධාලම්භන ප්‍රීතිය වඩවාලන්නට හේතුවන කරුණු කාරණා රැසක් නිරාවරණය කරමින් සිදුකරනා මෙකී පුරාවිද්‍යා කැණීම් කටයුතු සඳහා සම ගෞරවාන්විත දායකත්වය ලබාදෙන කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අංශයේ මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන මහතා හා කෙරුණු සාකච්ඡාවක් ඇසුරෙන් මේ ලිපිය ලියවෙයි.

සිදුහත් කුමරුගේ උපත සිදු වූ ඓතිහාසික ලුම්බිණිය පුරාණ දඹදිවට අයත් නගරයක් වශයෙන් වර්තමානයේ එම නගරය අයත් වනුයේ නේපාල රාජ්‍යයටයි. බුදු සිරිතේ එන කපිලවස්තුපුර ඇතුළු නගර පුරාවිද්‍යානුකූලව කැණීම් කර තහවුරු කිරීමට නේපාල රජය තීරණය කළේ මීට වසර කිහිපයකට පෙරදීය. ස්වකීය ආචාර්ය නිබන්ධනය සඳහා අනුරාධපුරය ඇතුළු නුවර ගවේෂණ ව්‍යාපෘතිය තෝරාගත් කීර්තිමත් බ්‍රිතාන්‍ය ජාතික මහාචාර්ය රොබින් කනින්හැම් මහතා ඉන්දියාව, ඉරානය ආදී ආසියානු කලාපයේ රටවල කැණීම් නිමකර නේපාලයට ඇතුළු වූයේ මෙවන් අවස්ථාවකදීය.


නේපාල රජයේ ආරාධනය සහිතව සිදුහත් කුමරුගේ උපත සිදුවූ ලුම්බිණි නුවර සහ සුදොවුන් රජතුමාගේ රාජධානිය වූ කපිලවස්තුපුර රාජධානිය කැණීම් මගින් මතුකර ගැනීමේ දුෂ්කර අභියෝග මහාචාර්ය රොබින් කනින්හැම් විසින් භාරගනු ලැබීය. මේ දුෂ්කර කැණීම් කටයුතු සඳහා නේපාල ජාතික පුරාවිද්‍යාඥයන් වන කෝෂ් ප්‍රසාද්, ආචාර්ය සහ බසන් බිලාරි ඇතුළුව තවත් විද්වත් මඩුල්ලක් මහාචාර්ය කනින්හැම්ට සහය ලබාදෙයි. එහෙත් මෙම කණ්ඩායම සම්පූර්ණ කරගැනීමේ කටයුත්ත තවත් එක පුද්ගලයකුට අවශ්‍ය බව කනින්හැම්ට අවබෝධ විය. ඒ සඳහා ඔහු තෝරා ගත්තේ කැලණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ප්‍රියන්ත ගුණවර්ධනය. ස්වකීය ආචාර්ය උපාධියේ පර්යේෂණ සඳහා මහාචාර්ය කනින්හැම් ශ්‍රී ලංකාවට පැමිණි සමයේ විශ්වවිද්‍යාල සිසුවකු ලෙස එම පර්යේෂණවලට දායක වූ ප්‍රියන්ත ගුණවර්ධන බෞද්ධ වාස්තු විද්‍යාව පිළිබඳ විශේෂඥයකු වීම මෙම තෝරාගැනීම කතිනම් කිරීමට හේතුවූවා විය හැක.

නේපාලය තුළ මහාචාර්ය කනින්හැම් ආරම්භ කළ කැණීම් ව්‍යාපෘතියේ පළමුවැන්න ඓතිහාසික ලුම්බිණිය මුල්කරගෙන සිදුවිය. ලුම්බිණියේ මායාදේවි විහාරස්ථානය මුල්කරගෙන කළ මෙම කැණීම සැබැවින්ම සුවිශේෂී වූවකි.

බෞද්ධ සාහිත්‍යයට අනුව සුද්ධෝදන රජතුමාගේ දේවිය වූ මහාමායා බිසව සිය දරු ප්‍රසූතිය සඳහා තම මව්පියන් විසූ දෙව්දහ නුවරට යෑමට පෙරහරින් පිටත්ව ඇත්තේ වෙසක් පොහෝ දිනයක. එහෙත් දෙව්දහ නුවරට යෑමට පෙර විඩාව සංසිඳුවා ගැනීමට නතර වූ ලුම්බිණි සල් උයනේදී මහාමායා දේවිය සිදුහත් කුමරු බිහිකර තිබේ. ලුම්බිණියේ පිහිටි මෙකී ඓතිහාසික සල් ගස තිබූ තැන සහ ඒ පිළිබඳ සාක්ෂි සොයා සිදුකළ කැණීම් ඉතා සාර්ථක ප්‍රතිඵල සහිතව නිම විය.

සිදුහත් උපත සිදුවූ සල් ගසෙහි මුල් සහ කාබනික අවශේෂ මෙම කැණීමේදී මතුකර ගැනීමට හැකිවූ අතර ඊට අමතරව සල් ගස වටකර සෑදූ දැවමය ප්‍රාකාරයක නෂ්ටාවශේෂ සහ එකී ප්‍රාකාරයේ ආධාරක කණු සිටුවීමට භාවිත කළ වළවල්ද සොයා ගැනීමට හැකිවී ඇත. විශේෂයෙන් සල් ගස ආශ්‍රිතව සොයා ගත් කාබනික ද්‍රව්‍ය උද්භිද විද්‍යානුකූලව විශ්ලේෂණය කිරීම මගින් එකී අවශේෂ සල්ගසම බව තහවුරුව ඇත. ප්‍රාකාරයකින් වටකර තිබීම නිසා එය වැඳුම් පිදුම් කළ පූජනීය තත්ත්වයේ ලා සැලකූ වෘක්ෂයක් බවද තහවුරු වෙයි.

ඊට අමතරව දැවමය ප්‍රාකාරයේ නෂ්ටාවශේෂ කාබන් 14 ක්‍රමයට කාල නිර්ණය කිරීම සිදුකර ඇති අතර නෂ්ටාවශේෂ වසර 2500ක් පමණ පැරණි බව එහිදී තහවුරු වී තිබේ. මේ සියලු කරුණු අනුව ලුම්බිණි කැණීම්වලින් මහාචාර්ය කනින්හැම් ප්‍රමුඛ පර්යේෂකයන් මතුකරගෙන ඇත්තේ සිදුහත් කුමාර උපත සිදු වූ ස්ථානයේ පිහිටි සල්ගසම බව තහවුරු වෙයි.



ජර්මානු ජාතික මහාචාර්ය ෆ්‍යුරර් නූතන ලෝකයට ලුම්බිණිය සොයා දුන් පුද්ගලයා වෙයි. ඒ වර්ෂ 1896 දීය. ඉන්පසු 1970 තරම් මෑත ඉතිහාසයේ ඉන්දීය පුරාවිද්‍යාඥ මුකර්ජි ලුම්බිණිය ගවේෂණය කර ඇති අතර ක්‍රි.පූ. 249 දී අශෝක අධිරාජයා ලුම්බිණියට පැමිණ පිහිටු වූ සෙල්ලිපියක් එහිදී සොයාගෙන ඇත. එකී සෙල්ලිපිය මගින්ද මෙම පුදබිම ලුම්බිණියම බව තහවුරු වී ඇත. සිය ගවේෂණයෙන් පසු ලුම්බිණියෙන් අශෝක අධිරාජ්‍යයාගේ පාලන සමයට පෙර සලකුණු නැති බවට මුකර්ජි මහතා කළ ප්‍රකාශයද මෙම සොයාගැනීම මගින් බිඳ වැටෙයි. ඒ අනුව ක්‍රි.පූ. 6 වැනි සියවසේදී සිදුහත් කුමරුන්ගේ උපත සිදු වූ පුවත සනාථ කිරීමට මෙම කැණීම් උපකාර වනු ඇත.

ලුම්බිණියේ කැණීම්වලට පසු මහාචාර්ය කනින්හැම් ප්‍රමුඛ පිරිස යොමුවනුයේ සුද්ධෝදන රජතුමාගේ අතීත රාජධානිය වූ කපිලවස්තුපුරය ගවේෂණයටයි. වර්තමානයේදී 'තිලාරා කෝට්' යනුවෙන් හඳුන්වන

කපිලවස්තුපුරයේ පැරණි නගරය දනට තහවුරු කර ඇත්තේ ක්‍රි.ව. 3 වැනි සියවසට අයත් නටබුන්වලට අනුවය. එහෙත් සිදුහත් කුමර උත්පත්තිය සිදුවූ සමයේ පිහිටි කපිලවස්තු පුරය ඇත්තේ වර්තමානයේ අප දකිනා පොළොවට බොහෝ යටිනි.

වර්තමානයේ කපිලවස්තුපුර වන්දනාවේ යන ලක්ෂ සංඛ්‍යාත බෞද්ධ වන්දනාකරුවන් වන්දනා කරනුයේ බුදුරජාණන් වහන්සේ වැඩ සිටි සමයේ පිහිටි කපිලවස්තු පුරය නොවන බැවින් බුදු සිරිතේ එන සැබෑ කපිලවස්තුපුරය මතුකර දීමේ භාරදූර කටයුත්ත ඇරඹූ මහාචාර්ය කනින්හැම් ඇතුළු පිරිස එකී කැණීම් සඳහා නූතන තාක්ෂණයද උපරිම ආකාරයෙන් යොදා ගන්නා ලදී. ඒ අනුව නවීන භූ භෞතික විද්‍යා උපකරණ යොදා ගනිමින් 'තිලාර් කෝට්' (අතීත කපිලවස්තුපුර) අවට ප්‍රදේශයේ භූමිය නිරීක්ෂණය කරන ලදී. එකී නිරීක්ෂණයෙහි දත්ත පාදක කරමින් වර්තමාන නගර ආරක්ෂක ප්‍රාකාරයට සමාන්තරව ඉදිකර තිබූ ප්‍රාකාරයක කණු සිටුවූ වළවල් සහ තවත් නෂ්ටාවශේෂ ගණනාවක් මතුකර ගැනීමට ඔවුන් සමත්ව ඇත. එකී නෂ්ටාවශේෂ අතර වර්ණ ගැන්වූ මැටි බඳුන්වල කැබලි, මැටි බඳුන්, වීදුරු පබළු ආදිය වන බව වාර්තා වෙයි.


එමෙන්ම අතීත කපිලවස්තුපුර දකුණු ද්වාරයට මීටර් කිහිපයකට දුරින් පිහිටි ඓතිහාසික නටබුන්ද ඉදිරියේදී ගවේෂණය කිරීමට නියමිය. ඊට අමතරව දකුණු ද්වාරයේ මීටර් 200ක් පමණ පිහිටි මහාමායා බිසව සහ සුදොවුන් රජතුමා වෙනුවෙන් ඉදිකළ බවට පැවසෙන චෛත්‍යයද ඉදිරියේදී ගවේෂණය කරන්නට නියමිතය. කන්ථක අශ්ව වෙනුවෙන් ඉදිකළා යැයි සැලකෙන චෛත්‍යයද ගවේෂණය කර ඇත. එපමණක්ද නොව කපිලවස්තුපුර රාජධානියට අයත් කිලෝ මීටර් 2ක පමණ ප්‍රමාණය ගවේෂණය කර නිම කිරීමේදී රාජධානිය අවට සාමාන්‍ය ජනයා විසූ ප්‍රදේශයද ගවේෂණය කරන්නට නියමිතය. එහිදී වසර 2500කට පෙර ජන ජීවිතයට කර්මාන්ත වැනි කරුණු හෙළිකර ගත හැකි වෙතැයි මහාචාර්ය ප්‍රියන්ත ගුණවර්ධන පවසයි. නිග්‍රෝධාරාමය පිහිටි ප්‍රදේශයද ඉතා හොඳුරේදීම ගවේෂණය කරනු ඇත.

මේ වනවිට ගවේෂණය කර නිමකර ඇති ලුම්බිණියේ සිට දනට කැණීම් කරන කපිලවස්තුපුරයට ඇති මුළු දුර කි.මී. 23කට ආසන්නය.

යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුමයක් ලෙසද ප්‍රකාශ කර ඇති ලුම්බිණියේ වර්තමාන තත්ත්වය ඉතා කනගාටුදායකය. ලුම්බිණි පූජිත සීමාවෙන් මීටර් 10 පමණ ඈතට වන්නට ලුම්බිණි වත්මන් නගරය සහ ඊට අයත් වෙළෙඳ සල් පිහිටා ඇත. මේ වෙළෙඳ සල්වල නම් පවා බුදු සමයට නිගා දෙන සුළුය. බුද්ධ හොටෙල්, සිද්ධාර්ථ සැලූන් වැනි නම් යෙදූ වෙළෙඳ සල් මෙහි සුලභය. මෙහි ඇති ඇතැම් වෙළෙඳ සල් තුළ මත්පැන් පවා විකුණන බව ප්‍රසිද්ධ රහසකි. නේපාල ජනයාගෙන් බහුතරය හින්දුභූ වෙති. එබැවින් මෙම ගැටලුවට ඔවුහු එතරම් සංවේදී නොවෙති. දශක ගණනාවකට පෙර සිට බුදු සමය ප්‍රබන්ධයක් යැයි පැවසූ මිථ්‍යාදෘෂ්ටිකයන් විද්‍යාත්මක සාක්ෂි මත කඳිම පිළිතුරක් දීමට බ්‍රිතාන්‍ය ජාතික මහාචාර්ය රොබින් කනින්හැම් මහතා ප්‍රමුඛ පර්යේෂකයන් වෙහෙසෙන මේ අවස්ථාවේදී ලුම්බිණි බෞද්ධ උරුමයේ ගෞරවය රැක ගැනීමට ලෝ පුරා බෞද්ධ රාජ්‍යයන් එක්වීම අත්‍යවශ්‍යය.

එදවස බුද්ධගයාව බේරාගැනීම සඳහා පෙරමුණ ගත් අනගාරික ධර්මපාලතුමා ඇරඹූ ජාතික ව්‍යාපාරය වැනි දැවැන්ත කර්තව්‍යයක් ලුම්බිණිය කේන්ද්‍ර කර ඇරඹීමට සුදුසු කාලය මෙය බව අවධාරණය කරන්නෙමු.

**අරුණ ලක්ෂ්මන් ප්‍රනාන්දු**





# ශ්‍රී දළදා මාළිගාව ප්‍රධාන කරගත් උභයමහා විහාරවල අලුත් අවුරුදු සිරිත් විරිත්

සිව්සර සිරිලක අලුත් අවුරුදු උත්සවයෙන් ජනිතව බිහිවෙද්දී කන්ද උඩරට ශ්‍රී දළදා මාළිගාව හා අස්ගිරි-මල්වතු උභය මහාවිහාර ආශ්‍රිතව සිදුකෙරෙන ආගමික, ජාතික උදාර සිරිත් විරිත්වලින් බෞද්ධ, අබෞද්ධ, දෙස් විදෙස් අපමණ ජනතාවන්ගේ සිත් සතන් ප්‍රබෝධමත් වන්නේය. බුද්ධත්, තෙරුවන් කෙරෙහි ජනිත වන ශ්‍රද්ධාවත්, දේව භක්තියත්, ජාතිකාභිමානයත් නිසා නිර්මාණය වන ආනුභාවය අවන් පරයෙන් ඇත ඊට කඳුකෙළ් සිසාරා තුන් සිංහලය පුරා විහිදෙන්නේය.



ශ්‍රී දළදා මාළිගාව කේන්ද්‍ර කරගත් උභය විහාරවල සිදුකෙරෙන උතුම් චාරිත්‍ර අතර,


1. දැහැත් පිළිගැන්වීම,
2. කණ්ඩස්නානය, 3. කිරි ආහාර පූජාව,
4. ඉස තෙල් ගැමීද වැදගත් වේ.

ශ්‍රී ලංකා සම්බුද්ධ ශාසනය පිහිටුවීමෙන් අනතුරුව අනුරාධපුර මහා විහාර සංඝ පරම්පරාව බිහිවූ ආකාරයත්, රාජ්‍ය පරිපාලනයේදී එම භික්ෂු පරපුර සම්බන්ධ වූ ආකාරයත් ලංකා ඉතිහාසයේ සටහන් වන්නේය. දේවානම්පියතිස්ස මහරජතුමන් විසින් බිහිවූ මහරහතන් වහන්සේ ප්‍රධාන මහා සංඝරත්නයට මහමෙව්නා උයන පූජාකළ තැන් පටන් ආරම්භ වූ මහා විහාරය භූමියෙන් බලයෙන් යසසින් වර්ධනය වූයේ එම සංඝ පරපුරෙන් ථෙරවාදී නිර්මල බුද්ධධර්මයට සිදුවූ අමිල සේවය නිසාය. පාලි භාෂාව, හෙළ බස ප්‍රධාන කරගත් බෞද්ධ අධ්‍යාපනය දියුණු කිරීම, රජවරුන්ට අනුශාසනා කිරීම, පොදුජනයා ප්‍රබෝධමත් වන ආකාරයට බෞද්ධ සිරිත් විරිත් ආරක්ෂා කිරීම ආදී පසෙකලීනව පැවති ජාතික, ආගමික අවශ්‍යතාවන්ට සරිලන පරිදි ශ්‍රද්ධාවත්, සිල්වත්, ගුණවත් භික්ෂු පරපුරක් මහා විහාරය කේන්ද්‍ර කරගෙන බිහිවිය.

සෙන්කඩගල පුරවර රාජධානිය ජයත් උරුමයක් වශයෙන්ද, ථෙරවාදී බුද්ධධර්මය ආරක්ෂා කරන එකම කේන්ද්‍රස්ථානයක් ලෙසද ලෝකවාසී ජනී ජනයාගේ අවධානයට, ගෞරවයට, පූජනීයත්වයට පාත්‍ර වන්නේ අප සම්මා සම්බුද්ධරජාණන් වහන්සේගේ වම්සිරි දළදා වහන්සේ වැඩ සිටීමත්, දෙපස අස්ගිරි, මල්වතු උභය මහා විහාරවල අතිපූජ්‍ය මහානායක මාහිමියන් වහන්සේලා ප්‍රධාන මහා විහාර වංශික මහා සංඝරත්නය වැඩ සිටීමත් නිසාමය. එමෙන්ම ලොව කිසිම සිද්ධස්ථානයක නොසිදුවන, බුද්ධ උපස්ථාන, ආවතේව, පුද පූජා සිය ගණනින් දිනපතා නොකඩවා සිදුකෙරෙන්නේ ශ්‍රී දළදා මාළිගාවේ බව ප්‍රකට කරුණකි. මේ නිසාම ලෝකවාසී ජනතාවගේ අතිශය ගෞරවයට භාජනය වන මෙම උභය මහා විහාර මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේ දෙපා වැඳ පුද පඬුරු පුද ආශිර්වාද ලබාගැනීමට රාජ්‍ය නායකයන් හා ජනතාව පැමිණීම නිතර දක්නට ඇති අතර අලුත් අවුරුදු චාරිත්‍රවලිය ආරම්භයේද මහ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලාට දැහැත් පූජා කිරීමෙනි.

ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේතුමන් කාරියකෝරාළ, වට්ටෝරුරාළ, කෙපෙරාළ ආදී සියලුම නිලධාරීන් අවුරුදු නැකත් පැමිණීමට පෙර අවුත් දැහැත් පුද පූජා පිළිගන්වා ආශිර්වාද ලබාගනිති. උභය මහා විහාරවල කාරක සංඝ සභාවේ මහා සංඝරත්නය මෙන්ම සෙසු කේවාසික භික්ෂූන් වහන්සේලාද අලුත් අවුරුද්දේ නොනගතයට පෙරාතුව බුල මිතට පිළිවෙළින් මහානායක මාහිමියන් වහන්සේගේ ආරාමය වෙත පිය නගා දැහැත් පිළිගන්වා පසඟ පිහිටුවා වැඳ,

"ඔකාස වන්දාමි භන්තේ සබ්බං අපරාධං ඛමථමේ භන්තේ"



යන පාලි වාක්‍ය පෙළවරක් කියා ක්ෂමා කරගනිති. මහානායක හිමිවරුන් වහන්සේද දෑතින් පිළිගෙන ආශිර්වාද කරති. අවස්ථාව අනුව අවවාද, අනුශාසනා කොට ලබන අලුත් අවුරුද්ද ජයගත් ජය වේවායි අවංකව, කරුණාවෙන් ප්‍රාර්ථනා කරති. මෙම උතුම් චාරිත්‍රයේ අතීතයත් වර්තමානයත් පාදා දෙති. මෙම අනගි අවස්ථාවේදී අතිපූජ්‍ය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගෙන් ලබන ආශිර්වාද බලමහිමයෙන් වසර පුරාවට නිදුක් නිරෝගීව සැපසේ කල් යවන්නට වාසනාභාගී වන්නේය.

පිදිය යුත්තන් පිදීම බෞද්ධයන් අතර උතුම් ගුණාංගයක් ලෙස බුද්ධ චරිතයෙන් මෙන්ම බොහෝ සිරිතෙන්ද, ශ්‍රාවක චරිතවලින්ද දක්නට පුළුවන.

"පූජකෝ ලභතෙ පූජං" යන ගාථා අනුව පිදිය යුත්තන් පිදීම කලට වේලාවට, සමගිව, ගෞරවාන්විතව සිදුකෙරෙන ආයතන අතර අස්ගිරි-මල්වතු උභය මහා විහාරස්ථාන ප්‍රධාන වන්නේය. මෙය ආදර්ශයට ගන්නා එම ආයතන දෙකට අයත් සෙසු මහා සංඝරත්නයද දෑතින් බුදු පූජා රැගෙනවිත් ශ්‍රීමත් මහානායක හිමිවරුන් වහන්සේලා ප්‍රධාන මහා සංඝරත්නය බැහැදැක වැඳ පුද ආශිර්වාද ලබාගෙන දෙලොව ශාන්තිය ලබාගනිති.

අලුත් අවුරුදු සිරිත්වලින් ප්‍රමුඛත් වන ශ්‍රී දළදා මාලිගාවේ සිදුවන "කණ්ඩස්නානය" සුවිශේෂ පූජාවකි. එයට නානු, සුවඳ පැන් හා සෙසු පූජා ද්‍රව්‍ය සේවකයන් විසින් සපයා ගන්නා සේම සෙසු විහාරස්ථානවලටද මෙවද දෙනු ලැබේ. උභය මහා විහාරස්ථානවල මහා සංඝරත්නය ඉසතෙල් ගෑමේ උතුම් චාරිත්‍රය ඉෂ්ට සිද්ධ කොට ජනතාවගේ ආයුරාරෝග්‍ය සම්පත්ති වර්ධනය කරති.

අලුත් අවුරුද්දේ මහා සංඝරත්නය ප්‍රථමයෙන් කරන මහා කුසල ක්‍රියාව වන්නේ ශ්‍රී දළදා වහන්සේට කිරිකාව පූජාවයි. ශ්‍රීමත් මහානායක හිමිවරුන් වහන්සේලා ප්‍රධාන මහා සංඝරත්නය පෙරදිනින් ඉරුමඩල උදාවීමට පූර්ව රන්පාත්‍ර පිරී පාත්‍රා පිරිකර කිරිබතින් පුරවා දායක කාරකාදීන් පිරිවරා ඉතා පවිත්‍ර චේතනාවෙන් ශ්‍රද්ධාවෙන් ශ්‍රී දළදා මන්දිරයේ ශ්‍රී දළදා වහන්සේ වැඩ සිටින ගන්ධ කුටිය තුළ පිහිටි ආසනය මත තබා පූජා කරන්නේ දෙලොව ශාන්තිය ලබාගැනීමේ උතුම් ප්‍රාර්ථනාවෙනි.

ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේතුමා, කාරියකෝරාළ, වට්ටෝරුරාළ, පෙරරාළ ආදී සියලුම රාජකාරි නිලධාරීහු අනාදිමත් කාලයක සිට පැවතෙන උතුම් චාරිත්‍ර නොපිරිහෙලා අනුගමනය කරමින් ශ්‍රද්ධා භක්තියෙන් ශෝභන පරිදි ඇඳුම් ඇඳගෙන අස්ගිරි-මල්වතු උභය මහා විහාරික ශ්‍රීමත් මහානායක හිමිවරුන් වහන්සේලා ප්‍රධාන මහා සංඝරත්නයට දෑතින් පිළිගන්වා දෙපා නමැදී ආශිර්වාද ලබාගැනීමද එදින සිදු කරති.

**පූජ්‍ය අඹුණුපුර පියරතන හිමි**



# බුදු පුදට මිහිරි ගිලන්පස සකසන්නේ කෙසේද?

ආමිස පූජා සහ ප්‍රතිපත්ති පූජා යන දෙආකාරයෙන්ම ඒ උතුම් භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුද්ධරාජාණන් වහන්සේ පිදීමට සුදුසු වන්නේය. ජීවමාන බුදු රජාණන් වහන්සේට කරන පූජාවක් ලෙස සලකා කරන පූජාවන්ගේ සමවිපාක ඇති බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. බුදු දහම එක් කාලයකට පමණක් සීමා නොවන ධර්මයක් බැවින් මෙය අදටත්, අනාගතයටත් ඒ පරිද්දෙන්ම පවතී. විකාල භෝජනයෙන් වැළකී සිල් රකින්නා වූ සංඝයාට උදෙසා කළ හැකි සංඝෝපස්ථාන පූජාවක් ලෙස ගිලන්පස හැඳින්විය හැක.

විනය පිටකයට අයත් මහාවග්ග පාලිය නම් උතුම් ග්‍රන්ථයේ අෂ්ටපාන පූජාවන් සහ ගිලන්පස වශයෙන් සකසා ගත හැකි අනෙක් පානයන් පිළිබඳ බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළ දේශනා අන්තර්ගත වේ. මහාවග්ග පාලියෙහි අෂ්ට පානයන් වශයෙන් සඳහන් වන්නේ අඹ පැන්, දඹ පැන්, ඇටකෙසෙල් පැන්, මස්කෙසෙල් පැන්, මී පැන්, මිදි පැන්, ඕලු පැන්, බොරළුදුඹුලු පැන්ය.

තවද බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත්තේ "මහණෙනි, ධාන්‍ය ඵල රසය හැර සියලු රස අනුදනිමි. පිසූ පලා කොළ රසය හැර දිය මුසු කොට පිරිසා ඇත් සියලු කොළ රස අනුදනිමි. මහණෙනි, මීපුප් රසය හැර සියලු මල් රස අනුදනිමි. මහණෙනි, උක් රසය (උක් ඉස්ම) අනුදනිමි." එසේ නම් සියලුම පලතුරු සහ කොළ වර්ග දිය හා මුසු කොට ගිලන් පස ලෙස සකසා පූජා කිරීමට අවසර හැකියාව ඇත.

දන් පැන් පූජා කිරීමෙන් මහත්ඵල මහානිසංස ලබා ගැනීමට නම් පූජා කිරීමට පූර්වයෙන්, පූජා කරන අවස්ථාවේදීත්, පූජා කිරීමෙන් පසුවත් යන තුන් තැන්හිම සිත පහදවා ගත යුතු වේ. ගෞරවයෙන් ගුණ සිහි කොට දන් පැන් පිදිය යුතු වේ. එමෙන්ම ආර්ය වූ ගුණ දම් රකින සිල්වත් පිරිසටම පිදිය යුතුවේ. දානයක් දීමේදී එය මහත්ඵල වීමට දානය දෙන පිරිසත්, දානය ලබන පිරිසත් සිල්වත් විය යුතුය. අප ගිලන්පස පූජා කරනු ලබන්නේ මෙලොව විසූ උතුම්ම මනුෂ්‍ය රත්නය වන තථාගතයන් වහන්සේටත්, උන්වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයටත් යන බැවින් පූජා කිරීමට සාද ගන්නා ගිලන්පස ඉතාමත් ශ්‍රද්ධාවෙන්, ගෞරවයෙන් සහ පිරිසිදුවත් පිළියෙළ කරගත යුතුය.

ගිලන්පස සකසන ස්ථානයේ උඩුවියන් බැඳ තිබීම යහපත්ය. සකසන විට උතුම් බුදු ගුණ මෙනෙහි කරමින් සිත පහදවා ගත යුතුය. පානය සැකසීමට යොදා ගන්නා ජලය උණුකර නිවා පසුව පෙරා භාවිතයට ගත යුතුය. පානය සැකසීමෙන් පසු එහි ඇති කෙඳි පෙරා ගැනීම සිදු කළ යුතුය. විශේෂයෙන්ම විකාලයෙහිදීත් පූජා වන බැවින් පානයෙහි කැබලි මුසු නොවීමට අතිශයින් සැලකිලිමත් විය යුතුය. තමන් ධාර්මිකව උපයා ගන්නා ලද ධනයෙන් ශ්‍රද්ධාවෙන් සකසන මේ ගිලන්පස පූජා කරන අවස්ථාවේදීත්, ඉතාමත් ශ්‍රද්ධාවෙන් සිත පහදවාගෙන උතුම් බුදු පාමොක් සඟ රුවනට පූජා කළ යුතුය. එවිට එය මහත්ඵල මහානිසංස වනු ඇත.

**ආර්. එම්. ඩී. නිරාශා වීරසිංහ**



# සඟ ගුණ පවසන රෝහිණී තෙරණිය

රෝහිණී තෙරණිය යනු ස්වකීය සංසාරගත දාමාන්විත දිවි ගමන කෙළවර කරලනු වස් පූර්ව ජන්මාන්තරයෙහි පටන් බුදු පසේබුදු, මහ රහතන් වහන්සේලා කෙරෙන් බහුවිධ පුණ්‍යකර්ම සමයන්හි නිරත වෙමින් බොහෝ පින්කම් කුසල් කම් කරමින් සසර සැරිසරන අතර කුරෙහි මෙයින් කල්ප අනූඑකකට පෙර මෙලොව ප්‍රාදුර්භූත වූ විපස්සී නම් බුදුන් වහන්සේගේ ධර්ම ප්‍රදීප්ත කාලයෙහි එක්තරා කුටුම්බයක (කුලයක) ජන්මය ලැබ ගුණවත්, නැණවත් පැණසර කාන්තාවකි. ඇය එක්තරා දිනෙක විපස්සී බුදුන් වහන්සේ බන්ධුමතී නුවර පිණ්ඩපාතයෙහි වඩිනා විටෙක උන්වහන්සේ කෙරෙහි අප්‍රමාණ ලෙස ප්‍රසන්න වර්ණ ඇති චිත්ත චෛතසිකයන් කරණකොටගෙන දන්දීම කෙරෙහි දෙවන ලද හස්තයන්ගෙන් පිරිසිදු චේතනාවෙන් පිටි කැවුම් වර්ගයක් පූජා කරනු ලැබීය. අපදානපාලියට අනුව ඇය පිටි කැවුම් වර්ගයක් පුදන ලද බවත්, පරමත්ථදීපනී නම් ථෙර ථෙරී ගාථා අර්ථකථාවෙහි පානයක් පිදූ බැව් සඳහන් වේ. මෙහිදී බුදුන් වහන්සේගේ පානය පිණිසන්නට දානය පිදූ බැව් යථාර්ථවාදීත්වයෙන් ගැනීම අර්ථ පූර්ණය පිණිස වේ. අපදානයේදී "විපස්සී බුදුන් වහන්සේ බන්ධුමතී නුවර පිඬු පිණිස හැසිරෙන විට මම උන්වහන්සේට කැවුම් පිළිගැන්වීමි" යනුවෙන් සඳහන් වේ. කෙසේ හෝ එම පින්බල මහිමය කරණකොටගෙන චාතුම්මහාරාජිකාදී සදෙව් ලොව්හි හා මිනිස් ලොව අනේක විධ උපභෝග, පරිභෝග සැප සම්පත් විඳ ගෞතම බුද්ධ ශාසනය ප්‍රවර්තිත යුගයෙහි විශාලා මහනුවර එක්තරා බමුණු මිනසල් මහ ධනවත් කුලයක "රෝහිණී" නමින් උපත ලබන්නට ඇය පින්වත් වූහ. අප ගෞතම බුදුන් වහන්සේ විශාලා මහනුවර වැඩ වාසය කරන විහාරයට ගොස් ධර්ම සභා මණ්ඩපයෙහි ගෝචර ස්ථානයෙහි ලැඳුම් ගෙන ධර්ම ශ්‍රාවණාවසානයේ සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන සංයෝජන ක්ෂය කරලමින් සෝවාන් ඵලයෙහි පිහිටියේය හෙවත් සෝවාන් ඵලස්ථානුගාමිත්වයට පත්විය. බමුණු මිනමැද නැරපියා ජීවිතය දෙමාපිය ඇති ගනයා බුදු දහමෙහි නික්මවාලීමට ඇය සම්මර වීමෙහිලා ප්‍රතිඵලයක් වශයෙන් සම්බුද්ධ ශාසනයෙහි පැවිදි ලබාගැනීමට වරම් හිමිවිය. පුථුජ්ජන භූමියෙහි උපරිම ඵල නෙළා ගැනීමෙහි අභිලාෂයෙහි අනුස්ථානයට සම්ප්‍රාප්ත වූ රෝහිණිය කෙටි කලකින්ම විදර්ශනා කර්මස්ථානයෙන් අනිත්‍යතා දර්ශනය පසක් කොට ගෙන රහත් භාවය ලැබීමෙන් අනිත්‍යතා දර්ශනය පසක් කොටගෙන රහත් භාවය ලැබූ රෝහිණී තෙරණිය නමින් කිත් යසස් ලැබූ ශ්‍රාවිකාවක් බවට පත්වූවාය. අපදාන පාලියට අමතරව ථෙරී ගාථාවලියෙහි විසති නිපාතයේ අන්තර්ගත වන මෙම ගාථා පන්තිය රෝහිණී තෙරණිය මහරහත් බවට පත්වූවායින් පසු ජීවිතය පියා සමග කරන ලද සංවාදාත්මක ප්‍රීති වාක්‍ය ස්වරූපී ගාථා පිරිසක් ඇයගේ සඟ ගුණ ප්‍රකාශ කිරීමෙහිලා රමණීය ගාම්භීර වාග්මාලාව මෙයින් සඳහන් කරන්නෙමු.

■ රෝහිණියනි, ඔබ නිදාගන්නා විටත්, නැගිටින විටත් ශ්‍රමණයන් ගැනම සිහි කරමින් ගුණ කියන්නෙහිය. එබැවින් නුඹ මෙහෙණියක්ම වන්නේය.

■ මොහෝ ප්‍රිය ආහාර ශ්‍රමණයන්ට දෙන්නේය, එබැවින් ඔබ මෙසේ ශ්‍රමණයන්ට ප්‍රිය වන්නා වූ කාරණය කුමක්ද?

■ ශ්‍රමණයෝ කටයුතු කිරීමට කම්මැලිය. අනුන්ගෙන් යැපෙති. අනග උපකාර බලාපොරොත්තු වෙති. රසැති බොජුන්ම කැමැති වෙත්, එනිසාවෙන් කවර කරුණකින් ශ්‍රමණයෝ ඔබට ප්‍රිය වෙත්ද?

■ පියතුමනි, ඔබ බොහෝ කල් සිට ශ්‍රමණයන්ගේ ප්‍රඥාබල පරාක්‍රමය විමසන නිසා මෙසේ පවසන්නෙහි.

■ ශ්‍රමණයෝ වත් පිළිවෙත් ආදිය කරනු කැමත්තෝය. ඒ හැරිදී කටයුතු සම්පූර්ණ කිරීම සඳහා කම්මැලි නැතිව, උසස් ක්‍රියාව වන නිවන පිණිස වැයම් කරත්. රාග ද්වේෂාදිය දුරු කිරීමට යෙදුණෝය.

■ ත්‍රිවිධ පාප මූලයන් විනාශ කරත්, නිවැරදි ක්‍රියාවලින් යුක්තය, ඔවුන් සියලු පව් දුරු කරත්. එනිසා මට ශ්‍රමණයෝ ප්‍රිය වෙත්.

■ ශ්‍රමණයන්ගේ ත්‍රිවිධ ද්වාරගත කර්ම පිරිසිදුය. එනිසාවෙන් මට ඔවුන් ප්‍රිය වෙති.

■ පිරිසිදු සක් මුතු මෙන් ශ්‍රමණයන්ගේ ඇතුළත හා බාහිර යන කායික සහ මානසික කටයුතු සියල්ල පවිත්‍රය. එනිසාවෙන් ඔවුන් ප්‍රියවෙත්.

■ ඔවුන් බහුශ්‍රැතය, ධර්මධරය, දහැමින් දිවි ගෙවන්නෝය, ධර්මය හා එහි අර්ථනය දේශනා කරන හෙයින් ශ්‍රමණයෝ මට ප්‍රියවෙත්.

■ යෝනිසෝ මනසිකාරයෙන් සන්සුන්ව දිවි ගෙවන නිසාවෙන් ශ්‍රමණයෝ මට ප්‍රිය වෙති.

■ මිනිස් වාසය හැර හුදකලාව වෙසෙති. ප්‍රඥාගෝචරව කථා කරයි. නිවන අවබෝධ කිරීමට කටයුතු කරන නිසාවෙන් ඔවුන් මට ප්‍රියය.


■ උන්වහන්සේලා යම් ගමක වාසය කරත්ද එයින් නික්ම යන විට බලාපොරොත්තු රහිතව යෙත් ඇල්මක් බලාපොරොත්තුවක් නොමැතිව වසන බැවින් ඒ ශ්‍රමණයෝ මට ප්‍රිය වෙති.



රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, පාලි විශේෂවේදී,
නොවන වසර, පේරාදෙණි විශ්වවිද්‍යාලය,
කොටපොල සුමේධ හිමි

බොදු පුවත්

# අස්ගිරි මහනාහිමියන්ගේ 85 වැනි ජන්ම දිනයට ගැබිණි මාතාවන්ට තුලා බරට තෑගි



අසිරිමත් ශ්‍රී දළදා වහන්සේ වැඩ සිටීමෙන් ශ්‍රේෂ්ඨත්වයට පත්වූ ඓතිහාසික ඇතුගල්පුර, වාරියපොල, කරගමුව ජනපදයේ උඩුගම ග්‍රාමයේ ගුණවත්, කුලවත්, දයාබර දෙමාපියන් යුවළකගේ අසිරිමත් පුත්‍ර රත්නයක් ලෙස ව්‍යවහාර වර්ෂ 1930 මාර්තු මස 17 වන දින ජන්ම ලාභය ලැබූ, සත්සිය වසරකට වැඩි ඉතිහාසයක් ඇති අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ වත්මන් අතිගෞරවනීය මහානායක මාහිමිපාණන් වහන්සේ කුඩා කල සිටම මහණදම් පිරීමට බලවත් කැමැත්තක් දක්වූ පින්බර මහතෙර නමකි.

තමන්ගේ දරුවකු ශාසනයට දායාද කිරීමේ පුණ්‍ය බල මහිමය ගැන මැනවින් දත සිටි සැදැහැවත් දෙමාපිය දෙදෙනා තම දයාබර පුතණුවන් ශාසනයට ඇතුළත් කිරීමට බලවත් සේ ඇලුම් කළහ. විශේෂයෙන් තම අප්පච්චි තුළ පැවති බලවත් ආශාව ඉටුකර දීමට දරුවාත් කැමැත්ත දක්වූයෙන් නායකයන්ගේ ආශිර්වාදය මැද 1945 ජූනි මස 21 වන දින එවකට අස්ගිරි මහාවිහාරයේ මහානායක පදවිය හෙබවූ පොතුහැර සංඝ පරම්පරාවේ අතිගරු උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත රතනපාලාභිධාන මහානායක ස්වාමීන් වහන්සේගේ ශිෂ්‍ය රත්නයක් ලෙස පැවිදි වූහ.

එදා එසේ පැවිදි වූයේ අන් කිසිවකු නොව වර්තමාන සසුන'බර දිදුළන පහන් තරුවක් වැනි ශ්‍යාමෝපාලි මහානිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ අග්‍රගණ්‍ය පණ්ඩිත මහෝපාධ්‍යාය අතිගෞරවනීය උඩුගම ශ්‍රී සද්ධර්ම කීර්ති ශ්‍රී ධම්මදස්සී රතනපාල බුද්ධරක්ඛිතාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේය.

ඇසුරු කරන සා සමගත් නිහතමානීව, කරුණා මෛත්‍රී ගුණයන්ගෙන් යුතුව සසුනේ උන්නතිය සඳහා ඇපකැප වී කටයුතු කරන හෙයින් පියවරෙන් පියවරට ශාසනික පදවිවලින් උන්වහන්සේ පිදුම් ලැබූහ. ඒ අනුව 1998 ඔක්තෝබර් මස 4 වන දින අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය අනුනායක පදවියෙන්ද, 1999 දෙසැම්බර් මස 13 වන දින අතිගරු මහානායක පදවියෙන්ද පිදුම් ලැබීමට පෙර පින් බලයෙන් උන්වහන්සේට භාග්‍යය උදාවිය.

වර්ෂ 1969 සිට ශ්‍රී දළදා වහන්සේ වෙනුවෙන් කෙරෙන දළදා සේවා කටයුතු ඉටු කිරීමට භාග්‍ය ලත් උන්වහන්සේ මහත් ශ්‍රද්ධා භක්තියෙන් දළදා මාලිගාවේ ආරක්ෂාව, ගෞරවය හා සංවර්ධනය සම්බන්ධයෙන් මහත් කැපවීමෙන් යුතුව අදටත් කටයුතු කරමින් වැඩ වාසය කරති. උන්වහන්සේ දළදා මාලිගාව වැඳ පුද ගැනීමට පැමිණෙන සැම තරාතිරමකම බැතිමතුනට ආදරබර කරුණාවෙන් පිහිටල වෙලා ගැනීමට ඉඩකඩ සලසා දෙන අතර චිරංගත සාම්ප්‍රදායික පුද සිරිත් අනුරටම පිළිපදිනා පින්බර මහතෙර නමකි.

තම උතුම් පැවිදි දිවිය ශාසනික, ජාතික, සාමාජික සත්කාර්යයන්ට කැපකොට ඇති ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ අග්‍රගණ්‍ය පණ්ඩිත මහෝපාධ්‍යාය අතිගෞරවනීය උඩුගම සද්ධර්ම කීර්ති ශ්‍රී ධම්මදස්සී රතනපාල බුද්ධරක්ඛිතාභිධාන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ස්වකීය 85 වන ජන්ම දිනයේ, පළමුව අභිලාෂ දළදා වහන්සේට පූජෝපහාර දක්වා, දෙවනුව සියයකට ආසන්න ඒ ඒ ගැබිනි මාතාවන්ගේ තුලා බරට නානාවිධ ද්‍රව්‍යයන්ගෙන් සමන්විත තෑගි පිරිනැමීම කරුණා මෛත්‍රී සිත් පෙරදැරිව සැදැහැ සිතින් කළ බලවත් සත්කාරයක් විය. එදින උන්වහන්සේ වෙනුවෙන් බොහෝ ආශිර්වාද පින්කම් ඉටුවිය. එම කටයුතු ඉටු වූයේ අප මහානාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍ය රත්නයක් හා බෞද්ධයා නාලිකාවේ සභාපති ගරුතර දර්ශනගම කුසලධම්ම නාහිමි ප්‍රමුඛ සත්පුරුෂ සැදැහැවතුන්ගේ සංවිධානත්වයෙනි. සුපේශල ශික්ෂාකාමී අප අස්ගිරි මහානාහිමිපාණන් වහන්සේට තව දිගු කලක් ශාසනික හා සමාජ සේවාවන් ඉටුකිරීමට හැකිවන සේ නිරෝගී සම්පත්තිය හා දීර්ඝායු සම්පත්තිය නොමඳව ලැබේවායි දළදා වරුණ ප්‍රාර්ථනා කරයි.

ජේ. මීගහකුඹුර

# අතිපූජ්‍ය නියංගොඩ ශ්‍රී විජිතසිරි අනුනාහිමියෝ "මහාසද්ධම්මජෝතිකධජ" ගෞරව නාමයෙන් පිදුම් ලබති



ලංකාද්වීප ශ්‍යාමෝපසම්පදාවේ උත්පත්ති ස්ථානය වූ මල්වතු මහාවිහාරය රාජපූජිත මහාසංඝ මූලස්ථානයකි. ශ්‍රී සම්බුද්ධ ශාසනයේ උන්නතිය හා භික්ෂු සමාජයේ පැවැත්ම උදෙසා අමිල මෙහෙයක් සිදුකරන්නා වූ මල්වතු මහාවිහාරයෙහි ප්‍රධාන ශාසනික පදවි තුනක් ඇත. එනම් මහාපදවිය වූ මහානායක පදවිය හා අනුනායක පදවි දෙකයි. මෙසේ ශාසනික පදවි පිරිනැමීම බුද්ධ කාලයේ සිට පැවත එන චාරිත්‍ර ධර්මයකි. එහි ශාසනික සම්මතයත්, පෞරාණික රාජකීය සම්මතයත්, ඉංග්‍රීසි පාලකයන් යටතේ ලත් නෛතික බලයත් අනුව රාජ්‍ය වර්ෂ 2004 ඔක්තෝබර් මස 23 වන දින මහාවිහාර වංශික ශ්‍යාමෝපාලි මහානිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ අනුනායක ධුරයට පත්වී වදාළ සාහිත්‍ය චක්‍රවර්ති ආචාර්ය අතිපූජ්‍ය ධර්මකීර්ති ශ්‍රී සංඝරක්ඛිත විජිතසිරි අනුනාහිමිපාණන් වහන්සේට දෙස් විදෙස් සැදැහැත සම්මානයෙන් ලත් ශාසනික පදවි හා ගරු සම්මාන අපමණය. ඒ අතර පසුගියදා බුරුම රජය විසින් පිරිනමන ලද "මහාසද්ධම්මජෝතිකධජ" ගෞරව නාම සම්මුතිය සුවිශේෂී තැනක් ගනී. උගත් ධර්මධර, විනයධර, මහතෙර නමක් වශයෙන් ස්වකීය පාර්ශ්වයට පමණක් නොව සමස්ත සසුන්කෙතම සාරවත්වයට පමුණුවමින් ඉටුකරනු ලබන අතිවිශිෂ්ට ශාසනික සේවාවට දක්වනු ලබන ගෞරවයක් වශයෙන්, බුරුම රජය විසින් පිරිනමනු ලැබූ මෙම ගෞරව නාම සම්මුතිය ශාසන ඉතිහාසී කාලයේත් මහත් අභිනන්දනයට හේතුවෙනු නොඅනුමානය.

අප අනුනාහිමිපාණන් වහන්සේ එකාන්ත සුපේශල ශික්ෂාකාමී, විනයගරුක, සුපටිපන්න, උජුපටිපන්නාදී සංඝ ශෝභන ගුණයන්ගෙන් සොභිත වූ සංඝ පිතෘවරයන් වහන්සේ නමකි. උන්වහන්සේ ලියන කියන දේ හරවත්ය. චතුර ධර්ම කථිකත්වයෙන් හෙබිමෙන් යුත්ය. කරුණාබර හදවතින් යුතුව කාටත් හමුවිය හැකි, කාටත් පිළිසරණ වන මහෝත්තමයාණන් වහන්සේ නමකි. තමන් වහන්සේ ආචාර්යත්වය දරා ඉතා විද්‍යාලයක වාගේ ගුරු සිසු දෙමාපියාදී සැම දෙනාගේ සම්භාවනාවට පාත්‍ර වූ ගුණනුමි. ඉගැන්වීම් ක්‍රියාවලියෙහි දක්ෂතා මැනවින් ප්‍රකට කළ ශ්‍රේෂ්ඨ ආචාර්යවරයාණන් වහන්සේ නමක්ද වූහ.

සමාජයේ බොහෝ දෙනා මිලමුදලින් හමා වෙසෙන ආයතනය හෝ දරන තනතුර මූල්කොටගෙනය. එහෙත් අපේ අනුනාහිමියෝ ස්වකීය සංඝශෝභන ගුණයන්ගෙන්, විශාල පාණ්ඩිත්‍යයෙන්, ධර්මධරත්වයෙන්, ශාසනික හා සමාජ සේවාවන් තුළින් මල්වතු මහාවිහාරයට ගෙන දෙන්නේ මහත් ආලෝකයකි. අප අනුනාහිමියෝ උපසම්පද විනයකර්මය ලබමින් විංශද්වර්ගික කාරක සංඝ සභිකයාණන් වහන්සේ නමක් වශයෙනුත්, කර්මාචාර්යවරයාණන් වහන්සේ නමක් වශයෙනුත්, නියෝජ්‍ය ලේඛකාධිකාරිවරයාණන් වහන්සේ නමක් වශයෙනුත්, ප්‍රධාන ලේඛකාධිකාරීවරයාණන් වහන්සේ නමක් වශයෙනුත් ඉටුකරනු ලැබූ ගෞරවනීය සේවාව මූල්කොටගෙන මල්වතු මහාවිහාරයේ අතිපූජ්‍ය අනුනායක පදවියට පත්වී වදාළහ.

# මල්වතු - අස්ගිරි උපසම්පදා පුණ්‍යෝත්සවයට සියල්ල සූදානම්

මහනුවර මල්වතු-අස්ගිරි මහා විහාරයන්හි වාර්ෂික උපසම්පද පුණ්‍යෝත්සව මංගල්‍යය 2014 මැයි 14 වැනි දා යෙදෙන වෙසක් පුර පසළොස්වක පෝය දිනයෙන් ආරම්භ කර ජූනි 12 වැනිදාට යෙදෙන පොසොන් පුර පසළොස්වක පෝය දිනයෙන් අවසන් කෙරේ.

මල්වතු මහා විහාර පාර්ශ්වයේ අති ගෞරවාර්හ මහානායක තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මාහිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් මල්වතු මහා විහාරයීය ඓතිහාසික මංගල උපෝසථාගාරයේදී අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අති ගෞරවාර්හ මහානායක උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත මාහිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් අස්ගිරිය ඓතිහාසික මංගල උපෝසථාගාරයේදී ඒ ඒ විහාර පාර්ශ්වයන්ට අයත් උපසම්පද විනයකර්ම කටයුතු සිදුකිරීම සම්ප්‍රදාය වන්නේය. පෝය දිනයන්හි උපසම්පදාවන් පෙරහර සහිතවද, සෙසු දිනයන්හි උපසම්පදාවන් පෙරහර රහිතවද සිදුකරන අතර පෝය දිනවල වාසල නාග නාමයෙන් සිදුකරන උපසම්පද වන උපාධ්‍යායයන් වහන්සේලා ලෙස මහානායක මාහිමි දෙනමක් සෙසු උපසම්පද විනයකර්මවලදී අනුනායක හිමිවරු සහ මහානායක හිමිවරු උපාධ්‍යායයන් වහන්සේලා ලෙස පෙනී සිටිති. මැයි 14, මැයි 21, මැයි 28, ජූනි 5, ජූනි 12 යන දිනයන් උපසම්පද පෙරහැර සිදු කෙරෙන අතර මෙම දිනයන්හි වාසල නාග නාමයෙන් උපසම්පදාව ලබන සාමණේර සංඝයා වහන්සේලා ශ්‍රී දළදා මාලිගාව සිට පෙරහරෙන් මල්වතු-අස්ගිරි මහා විහාර කරා වැඩමවාගෙන යනු ලබති.

මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක නියංගොඩ විජිතසිරි, මල්වතු පාර්ශ්වයේ අනුනායක දිඹුල්කුඹුරේ විමලධම්ම යන නාහිමි ප්‍රධාන මහෝපාධ්‍යාය නාහිමිවරුන් සහ උපාධ්‍යායයන් වහන්සේලා මල්වතු මහා විහාර පාර්ශ්වයේ ලේඛකාධිකාරී වල්ගොව්වාගොඩ විමලබුද්ධි, නියෝජ්‍ය ලේඛකාධිකාරී පහමුණේ ශ්‍රී සුමංගල යන හිමිවරු උපසම්පද විනය කර්ම කටයුතු හා ලේඛකාධිකාරී සිදුකරන අතර අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අනුනායක ගලගම ශ්‍රී අත්ථදස්සී නාහිමි ප්‍රධාන අස්ගිරි මහා විහාර මහෝපාධ්‍යාය නාහිමි උපාධ්‍යායයන් වහන්සේලා වශයෙන්ද ලේඛකාධිකාරී නාරන්පනාවේ ආනන්ද යන හිමිවරු අස්ගිරි මහා විහාරයේ උපසම්පද කටයුතු හා ලේඛකාධිකාරී සේවා බාරව කටයුතු කරති.

බොදු පුවත්

## පලිපාන ශ්‍රී චන්දානන්ද මාහිමි ජන්ම ශත සංවත්සරය අප්‍රේල් 24 වැනිද

**අපවත්** වී වදාළ අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය මහානායක පලිපාන ධම්මකිත්ති ශ්‍රී ගුණරත්න චන්දානන්දාභිධාන මාහිමිපාණන්ගේ සියවෙනි ජන්මෝත්සවය 2014 අප්‍රේල් 24 වැනිදාට යෙදී ඇත.

වර්ෂ 1924 අප්‍රේල් 24 වැනි දින ජන්ම ලාභය ලැබූ අතිපූජ්‍ය පලිපාන ශ්‍රී චන්දානන්ද මාහිමිපාණන් වහන්සේ ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ 16 වෙනි මහානායක පදවිය දරමින් වැඩ සිට වර්ෂ 1999 නොවැම්බර් 8 වෙනි දින අපවත් වූහ.

අතිපූජ්‍ය පලිපාන චන්දානන්ද මාහිමිපාණන්ගේ ජන්ම ශත සංවත්සරය නිමිත්තෙන් ශාස්ත්‍රීය ග්‍රන්ථයක් මාහිමි ශිෂ්‍ය, අස්ගිරිය මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ කාරක සභික, පලිපාන ශ්‍රී චන්දානන්ද බෞද්ධ විද්‍යාලයාධිපති ආචාර්ය ගොඩගම මංගල හිමියන්ගේ සංස්කාරකත්වයෙන් අප්‍රේල් 24 වෙනි දින එළිදැක්වීමටද විධිවිධාන යොදා ඇත.

## මල්වතු සංඝ සභාවට ප්‍රසාද පූජාවක්!



**මහනුවර** මල්වතු මහා විහාරයීය විංශති වර්ගික කාරක මහා සංඝ සභාවේ කාරක සභික පදවියකින් පිදුම් ලැබූ මල්වතු මහා විහාරවාසී, ගොකරැල්ල රම්බණ්ඩා පොකුණ විහාරාධිපති, මල්වතු මහා විහාරයීය සංඝරාජ පිරිවෙන් ආචාර්ය දර්ශනපති මිණිවන්ගමුවේ රතනපාල හිමි විසින් මල්වතු මාහිමිපාණන්, අනුනායක හිමිවරු ප්‍රධාන කාරක මහා සංඝ සභාව වෙත ප්‍රසාද පූජාවක් ඓතිහාසික උපෝසථාගාරයේදී පසුගියද පිරිනමනු ලැබූහ.

මල්වතු මහා විහාරයීය කාරක සභික පදවියට පත්වූ මිණිවන්ගමුවේ රතනපාල හිමිපාණන් පිළිගැනීමේ උත්සවයක් සම්භාවනීය ගිහි-පැවිදි දෙපිරිසකගේ සහභාගිත්වයෙන් රම්බණ්ඩා පොකුණ විහාරයේදී පැවැත්විණි.

## හිසතෙල් ගිරිමානන්ද සූත්‍රයෙන් පිරිත් කිරීම 18 වැනි වතාවටත් අස්ගිරිය මහා විහාරයේදී

**සිංහල** අලුත් අවුරුද්දේ හිසතෙල් ගෑමේ චාරිත්‍රයට සකස් කරනු ලබන මාඟලික හිසතෙල් ගිරිමානන්ද සූත්‍රයෙන් 108 වරක් පිරිත් කිරීම මෙවරත් 18 වැනි වතාවට අස්ගිරිය විජයසුන්දරාරාමයේදී අස්ගිරිය මහා විහාර සංඝ සභාවේ මහෝපාධ්‍යාය ශාස්ත්‍රවේදී පණ්ඩිත අඹුළුගල පියරතන නාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරේ.

අප්‍රේල් 12 වැනිද පිරිත් කිරීම ආරම්භ කරන අතර පිරිත් කරන ලද හිසතෙල් බෙදා දීම 15 වැනිද සවස විජයසුන්දරාරාමයේදී සිදුකෙරේ.




ජේ. බණ්ඩාරනායක

# සදහම් ප්‍රහේලිකා අංක - 76

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773

## උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ප්‍රහේලිකා අංක 72, දයාවංශ ජයකොඩි සහ සමාගම, 112, පූජ්‍ය එස්. මහින්ද හිමි මාවත, කොළඹ 10.
3. පිළිතුරු පත් භාරගන්නා අවසන් දිනය මැයි 2 දා.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. තෑග්ග සඳහා විමසීම් සඳහා 011 2695773 (ප්‍රදීප්) අමතන්න.



## ▶ හරහට

1. මෙහෙණි සසුන ආරම්භ වන පොහොය.
2. දස කසිණවලින් එකකි.
5. මේ නමින්ද බුදුවරයකු පහළ වී ඇත.
7. එකල වනවාසී භික්ෂූන් මේවාවලද ජීවිතය ගෙවා ඇත.
8. මනුෂ්‍ය වර්ගයාට මේ නමින්ද හැඳින්වේ.
10. බුදු පුදයට ගෙන යති.
11. දෙරළුලු හැරීමට උපකාරී වේ.
13. ඡන්ද සලකුණකි.
14. ගුණ නුවණ ලබාදෙන තැන.
15. අටලෝ දහමට අයත්ය.

## ▼ පහළට

3. නිවනට මග අහුරන අකුසලයකි.
4. අටපිරිකරට අයත්ය.
6. මතු භවය සඳහා නොපමාව රැස්කර ගත යුතුය.
9. පියකරු මල් වර්ගයකි.
10. කවරුත් මෙයට බිය වෙති.
12. මද උදරට මෙබඳු පවුල් පිරියත.
14. අපේ පැරැන්නෝ බුදු සිහිරාදිය ප්‍රකාශනයට මේවාද භාවිත කළහ.

## ප්‍රහේලිකා අංක 74 ජයග්‍රහණය කළ වාසනාවන්තයෝ

- ජේ. ඩී. දෙල්දෙණිය, 103, අරලිය උයන, වැලිගල්ල, රඹුක්වෙල.
- එම්. පී. චන්ද්‍රලතා වීරසිංහ, 17/1, රත්ගොඩ, වෙලම්බොඩ.
- ප්‍රදීපා උක්වත්ත, 354/1, සරමඩ, හෙළිබිය.

## ඔබත් දළදා වරුණට ලියන්න

දළදා වරුණ සෑම විටම එහි ඇතුළත් ලිපි වලට ගරු කරන ප්‍රකාශනයකි. එසේ කාලයකට ආසන්න කාලයක් තිස්සේ "දළදා වරුණ" සඟරාව ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර ඔබ සැම ඊළඟට අයෙකු අප වෙත ලබා දෙන කාලීන කරුණු සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන ඔබේ ලිපි සඳහාද අවකාශ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ ප්‍රකාශනයේ පළවන සියලුම ලිපි, රචනා ආදී, කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාළිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමු. තම ලිපිය පැහැදිලි සේ අකුරින් ලියන ලද හෝ පරිගණක ගත කළ එකක් විය යුතු අතර ලිපිනය වෙත යොමු කළ යුතුය. සෑම ලිපියක්ම මෙබඳු පේළියක් හැර පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාළිගාව, මහනුවර

- අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

## දළදා මාළිගයෙන් පණිවුඩයක්

● මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න

1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම ගෞරවය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට පෝෂණයකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ පැළඳ සිටින ඇඳුම ඊට උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාළිගා පරිශ්‍රයට කොට කලිසම් (ෂෝට්ස්), නැහැනු දෙපිටින්ම පලාපු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඟ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාළිගාවට පැමිණෙන විට හැකි නම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොගැළපෙන බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය පිළිබඳ කැඩපතක් බව සිතන්න.
9. දළදා මාළිගාව පින් බිමක් මිස සෙල්ලක්කාරයන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්ව. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, එය භාර ගන්නට සිටින ඔබ පරපුරට ඔබගේ ආදර්ශයෙන් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.

# මෙම පුදබිම කුමක්දැයි නම්කර වටිනා ත්‍යාගයක් හිමිකර ගන්න

මෙහි පහත දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පිහිටි වටිනා පුද බිමක පැරණි ඡායාරූප දෙකකි. එය කුමක්දැයි නම් කොට පිළිතුර තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවන්න. එහි ඔබේ නම හා ලිපිනයද සඳහන් කරන්න. ඔබේ පිළිතුර එවිය යුත්තේ, සංස්කාරක, දළදා වරුණ, දළදා මාලිගය, මාධ්‍ය ඒකකය, මහනුවර යන ලිපිනයටයි.

**(නිවැරදි පිළිතුර එවනු ලබන ජයග්‍රාහී වාසනාවන්තයාට දර්ශනීය ශ්‍රී දළදා පෙරහර සහිත රාමු කරන ලද වටිනා තිළිණයක් පරිත්‍යාග කෙරේ. මෙම වටිනා ත්‍යාගය පිරිනැමීම සඳහා අනුග්‍රහය දක්වන්නේ ප්‍රකට විද්‍යා ලේඛකයකු වන අනුර සී. පෙරේරා මහතා විසිනි. එතුමාගේ ආදරණීය මෑණියන් වන චාලට් බෙහරගම් මහත්මියට හා ලෝ වැසි සියලු දෙනාටම සෙත්පතා මෙම ත්‍යාගය පිරිනැමේ.)**





පසුගිය සතියේ 'පුදබිම' නිවැරදිව හඳුනාගෙන ජයග්‍රහණය ලැබූ වාසනාවන්තයා

**එස්. සම්පත් කරලියද්ද**
අංක : 163, මිටිපොළ,
කරලියද්ද, පොල්දෙණිය.

(ඔබේ ත්‍යාගය ලබා ගැනීම සඳහා හැඳුනුම්පත සමග ශ්‍රී දළදා මාලිගාවේ මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාලය වෙත පැමිණෙන්න)

පසුගිය සලාකයේ (මාර්තු) ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර:
රුවන්වැලි මහා සෑය


# බාලයාගේ ගති සොබා මෙන්න

ශ්‍රී සද්ධර්මය පිළිබඳව අවබෝධයකින් තොරව සමාජයේ ජීවත් වන්නා බුදු දහමෙහි හඳුන්වනු ලබන්නේ "බාලයා" යන වචනයෙනි. බුදු දහම "පණ්ඩිතයා" පිළිබඳව හඳුන්වනු ලබන්නේ සද්ධර්මය දැන ජීවත් වන්නකු බවය.

මෙහිලා අපගේ අවධානය යොමුවන්නේ බාලයාගේ ස්වභාවය පැහැදිලි කිරීම සඳහාය. රැය නොනිඳ රැය පහන් කරන්නට යන පුද්ගලයාට රාත්‍රිය කොහොමත් දීර්ඝයි කල්පනා වෙයි. එයට හේතුව නින්දෙහි සිටින විට ගත වන කාලය පිළිබඳව වැටහීමකට වඩා නින්ද බලාපොරොත්තුවෙන් නිදි නොලබා සිටින්නකුට ගෙවෙන කාලය පිළිබඳව ඇතිවන වැටහීමයි. දුර බැහැර ගමන් කරන හුරුපුරුදු කෙනෙකුට දුර පිළිබඳව තියෙන්නේ වැටහීමට වඩා විඩාබරිත කෙනෙකුට ගමන් කිරීමේ දී ඇතිවන අපහසුව බරපතළ ලෙස දැනේ. ගමන් විඩා ඇත්නට යොදුන දිගය අනුවෙන් දක්වන්නේ ඒ නිසයි. එම උපමා දෙක බණ පොතෙහි සඳහන් කරනු ලබන්නේ සමාජ වැටහීමද සද්ධර්මය පිළිබඳව දැනුම සහ අවබෝධය නොතේරෙන නොදන්නා පුද්ගලයා හැඳින්වීම සඳහාය. එනම් 'බාල' මිනිසා පිළිබඳවය. සංසාරයේ ගමන් කරන ආකාරය බණ දහමෙහි වඩාත් හොඳින් පැහැදිලි කරනු ලබයි. එම පැහැදිලි කිරීම සිදුකරනු ලබන්නේ මිනිසාට සංසාර ගමන පිළිබඳව නිවැරදිව නිශ්චිත වැටහීමක් නොමැති නිසාය. බුදුරජාණන් වහන්සේට සංසාරය පිළිබඳව නිවැරදි නිශ්චිත දැනුමක් තිබුණ නිසාය.

අනවබෝධයෙන් යුතුව ගමනක් යන මිනිසා සිය අරමුණ පිළිබඳ වැටහීමක් නැති නිසාම තමා යන ගමන වුවද අපිළිවෙළ කරගනී. අරමුණ සාක්ෂාත් කරගන්නේ නැතිව වෙනත් හැඟීම් සහ දකීම්වල රැඳෙමින් ජීවිතය අවුල් කරගනී. එසේ අවුල් කර ගැනීමට බලපානු ලබන මූලික හේතුව වන්නේ අත්දැකීම් නොමැතිකම නිසා ලැබූ අනවබෝධයයි.

සංසාරය පුරා ජීවන අත්දැකීම්වලින් බුදුරජාණන් වහන්සේ අදාළ ගැටලුව විසඳා බලා එයට පිළිතුර ලබාදෙයි. අනවබෝධී පුද්ගලයා කටයුතු කරන්නේ වැටහීමකින් තොරවන නිසා සිය සංසාර ගමන අවුල් කරගනී. අපිළිවෙළ කරගනී. පුද්ගලයකුට ඇස, කන, නාසය, දිව, ශරීරය යන ඉඳුරන් පහ ජන්මයෙන්ම ලැබී තිබෙන්නේ ඒවා මැනවින් හසුරුවාගෙන ජීවිතය ජයග්‍රහණය කර ගැනීම සඳහාය. නමුත් අනුවණයා ජීවිතය ජයග්‍රහණය කරගැනීම සඳහා ලැබුණු එම ඉන්ද්‍රියන් සියල්ල ජීවිත පරාජය පිණිස භාවිත කරයි. ඇතමෙක් සියල්ලම්ද, ඇතමෙක් එක දෙක බැගින් වූ ප්‍රමාණයකින් ද මේ කටයුත්තෙහි යෙදේ.



එක්තරා ආකාරයක මානසික නොසන්සුන් බව ජීවන අරමුණු පිළිබඳ නොසැලකිල්ල මේ සඳහා හේතු කාරණා වේ. බුදුරජාණන් වහන්සේ දක්වා තිබෙන්නේ යා යුතු ගමන නිශ්චය කරගෙන ඒ සඳහා වැඩ සැලසුමක් (කාලසටහනක්) සකස් කරගත යුතු බවයි. නමුත් අනුවණකමට මේ වැටහීම ඇත්තේම නැත. 'බාලයා' යන වචනයෙන් ඔහු හඳුන්වනු ලැබ ඇත්තේ ද එම නිසාය.

මහාචාර්ය පාතේගම ඥානිස්සර හිමි

"ද්වේෂය රහිත වූ යමෙක් බැණීම් ගැසීම් හා වධ බන්ධන ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."

# දෙවියන් අතරට යාමේ පහසු මගක්!

බලවත් පුරුෂයෙක් අතට ගත් දණ්ඩක් ඉහළ අහසට විසි කළ විට විටෙක එම දණ්ඩෙහි මුල බිමට පතිත වේ. තවත් විටෙක අග කොටස බිමට පතිත වේ. විටෙක මැද කොටස බිමට පතිත වේ. අවිද්‍යාවේ ගැවසුණු, තණ්හාවේ බැඳුණු සුපුරුදු සත්වයෝද විටක බොහෝ දුක් ඇති සතර අපායේ උපදී, තවත් විටක බොහෝ සැප ඇති දෙවියන් අතරද, මිනිසුන් අතරද උපදී. භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන ආකාරයට සතර අපාය යනු සැම සත්වයකුටම තම ගෙදර මෙන් සුපුරුදු තැනකි. සතර අපායේ උපන් සත්වයන් විඳින දුක් අනන්තය.

බොහෝ දුක් ඇති සතර අපායෙන් අත් මිදී ලෝකයේ පරම දුර්ලභ වූ උතුම් ශ්‍රී සද්ධර්මය සහ වැනෙන මේ ජීවිතයෙන් පසු දෙවියන් අතර ඉපදී අපි අට මග පහසුවෙන් වඩා ගන්න ඇත්තම් කොතරම් භාග්‍යයක්ද? ගිහි ජීවිත ගත කරන සියලු දෙනාටත් ඒ සඳහා මග පාද ගැනීමට හැකියාව පවතී. ගෞතම සම්බුදු සසුනේ දිවැස් ලාභීන් අතර අග්‍රතැන් පත් අනුරුද්ධ මහ රහතන් වහන්සේ දිනක් දිවා විහරණය සඳහා විවේකී ස්ථානයකට වැඩම කර සිටින අවස්ථාවක මනාපකායික නම් දේවතාවන් විශාල පිරිසක් අනුරුද්ධ මහ රහතන් වහන්සේ ඉදිරිපිට පෙනී සිට මෙසේ ප්‍රකාශ කළහ.

"ස්වාමීනි, මනාපකායික දෙවියන් වන අපි තුන් තැනක ඉසුරුමත් වන්නෙමු. වශී කොට ඇත්තෙමු. අපි යම් වර්ණයක් කැමති නම් එසැණින් එම වර්ණය අපට ලැබේ. අප යම් ස්වරයක් කැමති නම් ඒ මිහිරි වූ ස්වරය එසැණින් ලැබේ. අපි යම් සැපයක් කැමති නම් ඒ සැපය එසැණින් ලැබේ."

අනුරුද්ධ තෙරණුවන්ට මෙවැනි සිතක් පහළ විය. මේ දේවතාවන් පැහැ ඇතිව නීල වර්ණ වස්ත්‍ර දරාගෙන නීල වර්ණ ආභරණ දරාගෙන සිටි නම්, කොතරම් ලස්සනද? එසැණින් දේවතාවෝ නීල වර්ණව, නීල වස්ත්‍ර ඇතිව, නීල වර්ණ ආභරණ සැරසිලි සහිතව පෙනී සිටියහ. අනුරුද්ධ තෙරණුවන්ට දෙවනුව මෙවැනි සිතක් පහළ විය. මේ දේවතාවෝ රන්වන් සිරුරු ඇතිව, රන්වන් වස්ත්‍ර හැඳ, රන්වන් ආභරණ සැරසිලි දරාගෙන සිටි නම් කොතරම් ලස්සනද? එසැණින් සියලු දේවතාවෝ රන්වන් සිරුරු ඇතිව රන්වන් වස්ත්‍ර දරාගෙන රන්වන් ආභරණ සැරසිලි පළඳා තෙරුන් ඉදිරියේ පෙනී සිටියහ. තෙවනුව අනුරුද්ධ තෙරුන්ට මෙවැනි සිතක් පහළ විය. මේ දේවතාවන් සුදු පැහැ ඇතිව සුදු වර්ණ වස්ත්‍ර දරාගෙන සුදු වර්ණ ආභරණ දරා ගෙන සිටි නම්, කොතරම් ලස්සනද? එසැණින් දේවතාවෝ සුදු වර්ණව, සුදු වස්ත්‍ර ඇතිව, සුදු වර්ණ ආභරණ පැළඳ අනුරුද්ධ තෙරුන් ඉදිරියේ පෙනී සිටියහ.


අනතුරුව එක් දේවතාවක් මිහිරි හඬින් ගී ගැයූ අතර තවත් දේවතාවක් නැටුවාය. තවත් දේවතාවන් පිරිසක් පංච තූර්ය භාණ්ඩ මිහිරි ලෙස වාදනය කළහ. රංජනීය, කමනීය, ප්‍රේමණීය වූ මෙම දර්ශනය දෙස බලා සිටි අනුරුද්ධ තෙරණුවෝ දෑස් යටිකුරු කළහ. මෙය දුටු දේවතාවියන් අනුරුද්ධ තෙරණුවෝ මෙය නොඉවසයි පවසා එම ස්ථානයෙන් පිටව ගියහ.

අනුරුද්ධ තෙරණුවෝ සන්ධ්‍යා කාලයේදී දම් සභා මණ්ඩපයෙහි තරු කැට පිරිවරා ලද පූර්ණ චන්ද්‍රයා මෙන් මහ සඟරුවන පිරිවරා සිටි භාග්‍යවතුන් වහන්සේට මෙම පුවත ඉදිරිපත් කළහ. අනුරුද්ධය, ධර්ම අටකින් සමන්විත වන මාගම කය බිඳී මරණින් මතු මනාප කායික දෙවියන් අතර උපදී.

1. අනුරුද්ධය... මේ ලෝකයේ දෙමාපියන් තම දියණිය කෙරෙහි මහත් වූ ආදරයෙන් යුතුව ඇයගේ යහපත පිණිස කිසියම් පුරුෂයකුට සරණ පාවා දෙයි. ඇය පතිකුලයට ගිය දා පටන් තම ස්වාමියාට පෙර අවදි වෙයි. ස්වාමියාට පසුව නින්දට යයි. කළ යුතු කාර්යයන් සියල්ල නිසි කලට ඉටු කරයි. ස්වාමියාගේ සිත් ගෙන ප්‍රිය වචන කතා කරමින් ස්වාමියා සතුටු වන ආකාරයට හැසිරෙයි.

2. තම මව වේවා, පියා වේවා, තම ස්වාමියාගේ මව වේවා, පියා වේවා, ස්වාමියාගේ ගුරුවරයා වේවා, දුටු කල හුනස්නෙන් නැගිට ගරු බුහුමන් දක්වයි. ආසන පනවයි. ආහාරපාන ලබා දෙයි.

3. තම ස්වාමියා නියැලෙන කර්මාන්තවල අනලස්ව නියැළේ. දක්ෂ වේ. ඒ ඒ කාරණා පිළිබඳව උපාය ඥානයෙන් යුතුව කටයුතු නිසි ලෙස ඉටු කරයි.



කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැගී යන්නෙකු වැනිය

මනාකොට කර්මාන්ත කටයුතු සංවිධානය කරයි.

4. තම ස්වාමියා යටතේ සේවය කරන සේවක සේවිකාවන් වෙත්නම් සියලු අවශ්‍යතා සොයා බලා ඉටු කරයි. පිළිත් වූ සේවකයින්ගේ සියලු අවශ්‍යතා ඉටු කරයි. ආහාරපාන නිසි කලට සපයා දෙයි.

5. තම ස්වාමියා නිවසට රැගෙන එන රන් රිදී, වෙනත් ධනයක් වේත් නම් එම ධනය මනා කොට ආරක්ෂා කරයි. ධනයට කෑදර නොවේ. බීපු නොවේ. ස්වාමියාගේ ධනය සොරකම් නොකරයි. තම ස්වාමියා බොහෝ වෙහෙස වී උපයන ධනය විනාශ නොකරයි.

6. අවබෝධයෙන් යුතුව බුදුන් සරණ යයි. සඟුන් සරණ යයි.

7. අනුරුද්ධය... ඉහුන් නොහැවනී සතුන් මැරීමෙන් වැළකී සිටී. සොරකමින් වැළකී සිටී. තම ස්වාමියාගෙන් පමණක් සතුටු වෙයි. බොරු කීමෙන් වැළකී සිටී. ප්‍රමාදය ඇති කරන්නා වූ මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකී සිටී. සිල්වන්තියක් වෙයි.

8. කාරුණික වෙයි. මසුරු මළ දුරු කළ සිතින් දන් පැන් පූජා කරයි. යමක් ඉල්ලා ගැනීමට සුදුසු කැනැත්තියක් වෙයි. මනා කොට සකසා දන් පැන් පූජා කරයි. කම්පළ අදහා දන් පැන් පූජා කරයි.

අනුරුද්ධය... මෙලොව මෙකී කරුණු අටින් යුත් ස්ත්‍රියක් මාගමක් වෙත් නම් ඒකාන්තයෙන්ම කය බිඳී මරණින් මතු මනාප කායික දෙවියන් අතර උපදී.

පින්වතුනි... බොහෝ ආයුෂ ඇති දිව්‍ය ලෝකවල අපගේ ධර්ම ස්වාමී වූ ගෞතම බුදුරජාණන් වහන්සේ පමණක් නොව සත් බුදුරජාණන් වහන්සේලා වන්දනා කළ, ධර්මය ශ්‍රවණය කළ මාර්ගඵලලාභී දෙවිවරුන් ඇත් දෙව්ලොව සිටී. මාර්ගඵලලාභී දෙවියන් නිතරම ධර්ම සාකච්ඡාවල, ධර්ම දේශනාවල නියැළේ. අංග අටකින් යුත් මැදුම් පිළිවෙතෙහි හැසිරේ. සමථ විදර්ශනාවන් වඩා සිත් දියුණු කරයි. මෙසේ පිවිතුරු බුදු වදන අසා බුදු මඟෙහි ගමන් කරන ආර්ය ශ්‍රාවක වූ දෙවියන් අතර ඉපදෙන්නට ඇත්නම් කෙතරම් වාසනාවක්ද?

මොහොතක් නවතින්න. තම හදවතට කතා කරන්න. හදවත හා සංවාදයේ යෙදෙන්න. හැටම මනාප කායික දෙවියන් අතර උපදින මඟෙහි ඇති අංග අටෙන් තමා සතුව පවතින අංග හා නොපවතින අංග මනා කොට හඳුනා ගන්න. තමා තුළ පවතින අංග වඩ වඩාත් වර්ධනය කර ගන්න. නොපවතින අංග වඩා ගැනීමට වීර්යය කරන්න. මේ ගෞතම බුදු සසුන තුළ දී ම උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කර ඒ අමා නිවනින් සැනසෙන්නට ඔබ අප සියලු දෙනාට වාසනාව ලැබේවා!

(අනුරුද්ධ මනාපකායික සූත්‍රය ඇසුරිනි.)

**පූජ්‍ය තලාතුඔය ධම්මානන්ද හිමි**



ලොකෙකනාථ වදනම්බුජ රාජහංසං
වෙනෙය්‍ය කොමුදවනං කිර ජොතයන්තං
සෙට්ඨං මහග්ඝ වරරූප විරාජමානං
වන්දාමි චාමිමමලං ජිනදන්ත ධාතුං

(දන්ත ධාතූන් වහන්සේ වඳින ගාථාව)



පින් සිතින් මුද්‍රණ දායකත්වය
**ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම**

මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ තුමා විසින් ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ (ලේක් හවුස්) මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.